NLDB

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

தேசிய கால்நடை வள அபிவிருத்தி சபை

National Livestock Development Board

# අපි නිරතුරුවම ප්‍රගතිය කරා පියනගමු

# நாளுக்கு நாள் முன்னேறத்தை நோக்கி பயனிக்கின்றோம்

# WE CONTINUE TO GROW EACH DAY







වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2013








# WE CONTINUE TO GROW EACH DAY

It is with great esteem that we approach our 42nd year as the leading producer and manufacturer of livestock in Sri Lanka. NLDB manages 30 livestock and crop integrated farms having built a reputation for revamping and preserving the livestock industry with coconut plantations.

A training centre was established to impart knowledge and educate farmers on the theoretical and practical aspects of farming.  At NLDB we take growth seriously and continue to incorporate the finest business ethics and maintain stringent standards as an industry leader.

Therefore it with great ambition, unshakable focus and unparalleled positivity, that we continue to grow each day.





# NLDB

National Livestock Development Board

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report **2013**

## අපි නිරතුරුවම ප්‍රගතිය කරා පියනගමු

## நாளுக்கு நாள் முன்னேறத்தை நோக்கி பயணிக்கின்றோம்

## WE CONTINUE TO GROW EACH DAY








# පටුන


| | |
|---|---|
| දර්ශනය මෙහෙවර | 1 |
| අමාත්‍යතුමාගේ පණිවුඩය | 2-3 |
| නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය | 4-5 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 6-7 |
| නියෝජ්‍ය සභාපතිතුමාගේ පණිවුඩය | 8-9 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 10-11 |
| කළමනාකාර කණ්ඩායම | 12-13 |
| ගොවිපලවල් පිහිටි ස්ථාන | 16 |
| මෙහෙයුම් සමාලෝචනය | 17-30 |
| මුල්‍ය ප්‍රකාශන | 31-73 |

# අපි නිරතු

# රැවම ප්‍රගතිය
# කරා පියනගමු





# දර්ශණය

ජනතාව ගේ සමාජ හා ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරිම සඳහා ගුණාත්මක අභිජනන ද්‍රව්‍ය හා කෘෂි නිෂ්පාදන නිපදවන ශ්‍රී ලංකාවේ හොඳම ස්ව පැවැත්මක් ඇති ආයතනය බවට පත් වීම.

# මෙහෙවර

පශු සම්පත් හා කිරි නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත කිරීමේ අරමුණ ඇතිව ගොවීන් වෙත බෝ කිරීම සඳහා සතුන් නොකඩවා නිකුත් කිරීමට සාධාරණ කාල පරිච්ඡේදයක් තුල දී පශු සම්පත් කටයුතු දියුණු කිරීම.

ආයතනයේ පිරිවැටුප හා ලාභදායිත්වය වර්ධනය කිරීම සඳහා නව තාක්‍ෂණය උපයෝගි කර ගනිමින් පශු සම්පත් හා ක්ෂීර නිෂ්පාදන සංවර්ධනය කිරීම.

රටේ කෙටිකාලීන භෝග නිෂ්පාදන වැඩසටහනට අනුබල දෙනු පිණිස තෝරාගත් ගොවිපොල වල කෙටි කලීන භෝග වගාකිරීම.

පශු සම්පත් හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රශස්ත නිෂ්පාදන මට්ටම් ලඟා කර ගැනීම.

පශු සම්පත් හා භෝග ඒකාබද්ධ ගොවිපොලවල් ක්‍රමය තුලින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමට හා පරිසර හිතකාමී වගා ක්‍රම අනුගමනය කිරීම.

තෘප්තිමත් ශ්‍රම බලකායක් ඇතිව විවිධ කෘෂි දේශගුණික කලාප තුල ස්ව පැවැත්මකින් යුතු පශු සම්පත් හා භෝග ඒකාබද්ධ ගොවිපලවල් සමූහයක් පවත්වාගෙන යෑම.

## පොදු අභිමතාර්ථ

පොල් මූලාශ්‍රිත කර්මාන්ත වලින් ලැබෙන අතිරික්ත මුදල් උපයෝගි කර ගනිමින් එහි පැවැත්ම සඳහා ගොවිපලපල් වල සියලුම ක්‍රියාකාරකම් ප්‍රශස්ත මට්ටමකින් පවත්වා ගෙන යාම.

සාර්ථකව වෙළඳපොල තරග කිරීම සඳහා පිරිවැය අඩු කිරීමට හා නිෂ්පාදනය දියුණු කිරීමට වඩා හොඳ කළමනාකරණ ප්‍රතිපත්ති සමග නව තාක්ෂණය විශේෂඥ දැනුම සහ ප්‍රාග්ධනය හඳුන්වා දීම.

පුද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව මෙම ගොවිපොල - ඒකක ලාභදායි ව්‍යාපාර බවට පත් කිරීම සඳහා වඩා හොඳ අලෙවි උපාය මාර්ග සමග නව වෙළඳපළක් ඇති කිරීමේ හැකියාව සොයා බැලීම.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

පශු සම්පත් අභිජනනය හා සංවර්ධනය.

බෝ කිරීම සඳහා හොඳ තත්ත්වයේ සතුන් සාධාරණ මිළකට ගොවීන්ට නිකුත් කිරීම.

උපරිම ලාභයක් ඉපයීම සඳහා ප්‍රශස්ත මට්ටමින් පොල් වගාව පවත්වාගෙන යාම.

හැකියාව ඇති ස්ථානවල පශු සම්පත් භෝග ඒකාබද්ධ ගොවිපලවල් ක්‍රියාත්මක කිරිම.

ගොවීන්ට, පාසල් සිසුන්ට, කෘෂි කර්මාන්තයේ නියැලි නිළධාරීන්ට සහ විශේෂයෙන් කුඩා පරිමාණයේ සතුන් ඇති කරන්නන් හට පුහුණු වැඩසටහන් හා ප්‍රදර්ශන පැවැත්වීම.

සාධාරණ මිලකට හොඳ තත්ත්වයේ ගොවිපල නිෂ්පාදන සැපයීම සඳහා අලෙවිසැල් පවත්වාගෙන යාම.

ඉහළ ලාභ පරතරයක් ලබා ගැනීම සඳහා ගොවිපලවල නිෂ්පාදිත අමුද්‍රව්‍ය භාවිතා කරමින් වටිනාකම එකතු කරන ලද භාණ්ඩ නිපදවීම.

ජනතාව අතර නැවුම් එළකිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා ජනතාවට නැවුම් එළකිරි අලෙවි කිරීම.

# අමාත්‍යතුමන්ගේ පණිවිඩය



*කිරි නිෂ්පාදනයෙන් ස්වයං පෝෂණය වීම සහ පශු සම්පත් ගොවීන් ගේ ජීවනෝපාය ක්‍රම වැඩි දියුණුව සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම මණ්ඩලයේ මූලික ප්‍රතිපත්තිමය පරමාර්ථ වේ.*

## ජාතික පශු සම්පත් මණ්ඩලය කිරි නිෂ්පාදනයට මෙන්ම කිරි ගොවීන්ගේ ජීවනෝපායේ දියුණුවට මහඟු සේවයක්

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රගතිය, දියුණුව සහ පිබිදීම දැක මම ඇත්ත වශයෙන් ම සාඩම්බරයට පත් වෙමි. පශු සම්පත් කර්මාන්තය සංවර්ධනය කිරීම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන පරමාර්ථයයි.

"මහින්ද චින්තන" වැඩ සටහන අනුව, පශු සම්පත් කර්මාන්තයේ සංවර්ධනයට හා පශු සම්පත් ගොවීන් ගේ ජීවනෝපාය දියුණුව සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අදාළ වැඩ සටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරමින් සිටී. කිරි නිෂ්පාදනයෙන් ස්වයං පෝෂණය වීම සහ පශු සම්පත් ගොවීන් ගේ ජීවනෝපාය ක්‍රම වැඩි දියුණුව සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම මණ්ඩලයේ මූලික ප්‍රතිපත්තිමය පරමාර්ථ වේ.

මණ්ඩලය මේ වන විට සැලකිය යුතු ප්‍රගතීන් අත්පත් කර ගෙන ඇති අතර, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය උසස් වර්ගයේ අභිජනන ද්‍රව්‍යයන් ගොවීන් අතර බෙදා දීමේ වැඩ පිළිවෙළ සාර්ථක අන්දමින් ඉදිරියට ගෙන යමින් සිටියි.

මේ තුළින් නිර්මානය වී ඇති ජාලය හරහා ගොවීන් ගේ හදිසි සහ අත්‍යාවශ්‍ය අවශ්‍යතාවන් එම අවස්ථාවල දීම විසඳා ගැනීමට මහෝපකාරී වන බව ද පෙන්වා දීමට කැමැත්තෙමි.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ලාභ ලබන රාජ්‍ය ආයතනයක් බවට පත් කිරීමට ඇප කැප වී වෙහෙසුණු අධ්‍යක්ෂ මණ්ඩලයටත් ප්‍රධාන කාර්යාලයේ මෙන් ම ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ටත් මාගේ හෘදයාංගම කෘතඥතාවය පළ කර සිටිමි.

**ආරුමුගන් තොන්ඩමාන් - පා.ම.**
*ගරු පශු සම්පත් හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය*

# නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවිඩය



*නව තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුව යමින් ආයතනය යටතේ ඇති ගොවිපල් වල පශු ක්ෂේත්‍රයන්ට අමතරව පොල් නිෂ්පාදනය හා කෙටි කාලීන බෝග වගා කිරීම මඟින් වඩා සාර්ථක අමතර ආර්ථික වාසියක් ආයතනය ලබා ගෙන ඇත.*

පශු සම්පත් ක්ෂේත්‍රයෙන් අප රට ස්වයංපෝෂිත කිරීමේ පරමාර්ථය ඇතිව වර්ෂ 1973 දී මෙරට ස්ථාපිත කළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, වර්තමානය වන විට තම අරමුණු කරා ලඟාවීමට මහත් කැපවීමෙන් කටයුතු කරන ආයතනයක් බව ප්‍රසංසනාත්මකව සඳහන් කිරීමට කැමැත්තෙමි.

වර්තමාන රජයේ "මහින්ද චින්තන" දැක්මට අනුව යමින් කිරෙන් රට ස්වයංපෝෂිත කිරීමේ මහඟු මෙහෙවර කරා ලඟා වෙමින්ද, දේශිය කිරි ගොවියා පශු ක්ෂේත්‍රය වෙත යොමු කිරීමත් එමගින් ඔවුන්ගේ ආර්ථිකය වඩාත් සුභදායී මට්ටමකට ගෙන ඒම සඳහාත් මේ වන විට මෙම ආයතනය වැඩසටහන් රාශියක් ක්‍රියාවට නංවා ඇති අතර, එමඟින් කිරි ගොවියාගේ අනාගතය සුරක්ෂිත වනු ඇති බව මාගේ විශ්වාසයයි.

නව තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුව යමින් ආයතනය යටතේ ඇති ගොවිපොලවල් වල පශු ක්ෂේත්‍රයන්ට අමතරව පොල් නිෂ්පාදනය හා කෙටි කාලීන භෝග වගා කිරීම මඟින් වඩා සාර්ථක අමතර ආර්ථික වාසියක් ආයතනය ලබා ගෙන ඇති අතර එම ක්‍රමවේදයන් වඩාත් සංවිධානාත්මකව ඉදිරියට කරගෙන යාම මඟින් වඩා ඵලදායි ප්‍රතිලාභ රටට ලබා දිය හැක. තවද ආයතනයේ සේවක සුබසාධනය ඉහල තලයකට ගෙන ඒම මඟින් තෘප්තිමත් සේවක බලකායක් බිහි කර ගැනිමටද හැකිවනු ඇත.

ආයතනයේ අනාගත පැවැත්ම සඳහා ක්‍රියාත්මක කර ඇති සියලුම ව්‍යාපෘති වල සාර්ථක අවසානයක් ලඟා කර ගනිමින්, දේශීය පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා සක්‍රියව දායකත්වය ලබා දෙන, ජනතාවගේ ගෞරවාදයට පත්වන ප්‍රධාන ආයතනය මෙය වනු බව මාගේ විශ්වාසයයි.

එම අරමුණ කරා ලඟා වීමට වර්තමාන සභාපතිතුමා, අධ්‍යක්ෂක මණ්ඩලය ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයට හැකි වේවායි පතමි.

**එච්. ආර්. මිත්‍රපාල (පා.ම)**
*පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය*

# සභාපතිතුමන්ගේ පණිවිඩය



## *සත්ව පාලන කර්මාන්තයේ ක්‍රියාකාරකම් හා ශිල්පීය ක්‍රම වල නවීන ක්‍රම පිළිබඳව ඔවුන්ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා පශු සම්පත් කර්මාන්තය සම්බන්ධයෙන් ග්‍රාමීය හා මධ්‍යම ආදායම් ලාභීන් සඳහා පුහුණු වැඩ සටහන් ද පවත්වා ඇත්තෙමු.*

ශ්‍රී ලංකාවේ පශු සම්පත් කර්මාන්තයට දශක හතරක පමන විශිෂ්ඨ සේවයකින් අනතුරුව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වසර 2013 වෙනුවෙන් වන මෙම වාර්ෂික වාර්තාව අප ඉදිරිපත් කරනුයේ සාඩම්බර හා අභිමානවත් හැඟීමකිනි. අපගේ ඉදිරි දැක්ම ප්‍රකාරව ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා පශු සම්පත් කර්මාන්තයේ උන්නතියට සුවිශාල දායකත්වයක් ලබා දීමෙන් අනතුරුව ආයතනය දෙස බලන කළ අප පසු ගිය වසර කිහිපයක් මුළුල්ලේ සාක්ෂාත් කරගන්නා ලද ප්‍රතිඵල තුළින් මණ්ඩලය අද ලබා ගෙන ඇති දියුණුව පිළිබඳව අපට අවංකවම තෘප්තිමත් විය හැක.

මෙම ඉලක්ක ළඟා කර ගත හැකි වූයේ පශු සම්පත් මෙන්ම කුකුළ් කර්මාන්තය සඳහා උසස් වර්ගයේ අභිජනන ද්‍රව්‍යයන් නාමික පිරිවැයක් මත ගොවීන් වෙත ලබා දීමෙනි. තවද සත්ව පාලන කර්මාන්තයේ ක්‍රියාකාරකම් හා ශිල්පීය ක්‍රම වල නවීන ක්‍රම පිළිබඳව ඔවුන්ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා පශු සම්පත් කර්මාන්තය සම්බන්ධයෙන් ග්‍රාමීය හා මධ්‍යම ආදායම් ලාභීන් සඳහා පුහුණු වැඩ සටහන් ද පවත්වා ඇත්තෙමු. තව ද කඩිනම් සංවර්ධන වැඩ සටහන් කිහිපයක්ම දියත් කරන ලද අතර පාඩු ලබන ගොවිපොළ වල් ලාභදායක ඒකක බවට පරිවර්තනය කරමින් අපගේ ගොවිපොළ වල් නවින කරණය කිරීමේ ක්‍රියාවලියෙන් ද සාර්ථක ප්‍රතිඵල අත් කර ගෙන ඇත්තෙමු. උසස් වර්ගයේ ගුණාත්මක කුකුළ් හා ගව තොග ආනයනය කිරීම තුලින් දිවයිනේ ඉතා සුදුසුම ප්‍රදේශයන් හි ස්ථානගත කොට ඇති අභිජනන ද්‍රවයයන් වශයෙන් නඩත්තු කරනු ලබන්නා වූ අපගේ පශු සම්පත් වල ජානමය අගය වැඩි දියුණු කර ඇත. ඔස්ට්‍රේලියාවෙන් ආනයනය කරන ලද කිරි ගවයන් කලමණාකරණය තුළින් සිදු වූ අපගේ දායකත්වය අගය කිරීමක් වශයෙන් ජාතික ව්‍යාපෘති කළමණාකරන විශිෂ්ඨතා සම්මානය 2013 වසරේ දී අප වෙත ප්‍රදානය කරන ලදී.

ගොවිපොළ වල් වල වල බොහොමයක සතුන් ගේ ආවරණ කුටි යනාදිය වැඩි දියුනු කිරීමෙන් ද සංචාරක නිවාස අලෙවි සැල් හා සේවක නිවස් දියුනු කිරීමෙන් ද ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරිම පිණිස අවශ්‍ය අළුත් වැඩියාවන් හා ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදී.

අප ගේ ප්‍රයත්නයන් හා ජයග්‍රහණයන් උදෙසා දායක වූ කලමනාකාරිත්වය සහ සේවක මණ්ඩලය වෙත මාගේ අවංක ස්තුතිය පුද කර සිටින අතර ඔවුන් ගේ වටිනා දායකත්වයන් සහ සහයෝගය නොවන්නට මෙම ජයග්‍රහණයන් කරා ළඟා වීමට නොහැකි වනු ඇත.

සියළු මට්ටමේ සේවකයින් කණ්ඩායම් හැඟී මෙන් කටයුතු කිරීම ද අපගේ ප්‍රයත්නයන් ඵලදායක වීමට හේතු වුණි.

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අපගේ ගරු අමාත්‍ය ආරුමුගම් තොන්ඩමාන් මැතිතුමන්ට ද නියෝජ්‍ය අමාත්‍ය එච් ආර් මිත්‍රපාල මැතිතුමන්ට ද අමාත්‍යාංශයේ ලේකම් සහ අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන් ට ද ඔවුන් ලබා දුන් සහය හා මග පෙන්වීම පිළිබඳව ස්තුතිවන්ත වෙමි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් විසින් දැක්වූ උනන්දුව හා ඔවුන් ලබා දුන් සහයෝගය ද අප ගේ ප්‍රයත්නයන් සාක්ෂාත් කර ගැනිමට මහෝපකාරි වුණි.

නැවත වතාවක් මාගේ කාර්යය මණ්ඩලය දැක් වූ ඇප කැප වීම පිළිබඳව ස්තුතිවන්ත වන අතර ඉදිරියේ දීත් ඔබ ගේ සහය තුළ වඩාත් ඉහළ අරමුණු කරා ළඟා වීමට හැකි වනු ඇති බව මම දැඩිව විශ්වාස කරමි.

**රංජිත් ඇල්ලෙගල**
*සභාපති*

# නියෝජ්‍ය සභාපතිතුමන්ගේ පණිවිඩය



***අප ස්වයං පැවැත්මක් ඇති ආයතනයක් වන නමුත් ලාභ ඉපයීම ම අපගේ ප්‍රධාන පරමාර්ථය නොවන අතර ජනතා සේවයට ඉතා ඉහළ ප්‍රමුකත්වයක් ලබා දෙමින් කටයුතු කරමු.***

2013 වසර සඳහා වන මෙම වාර්ෂික වාර්තාව මහත් උද්යෝගයකින් අපි ඉදිරිපත් කරනුයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නව අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් පත් වීම් ලැබූ දා සිට "මහින්ද චින්තන" වැඩ සටහන අනුව කිරි නිෂ්පාදනයෙන් රට ස්වයං පෝෂණය කිරීම සඳහා  ගෙන යන වැඩ පිලිවෙළෙහි වැදගත් අදියරයන් හා ඉලක්කයන් සාර්ථකව පසු කරමින් ආයතනයක් වශයෙන් විශාල ප්‍රගතියක් හා සංවර්ධනයක් අත්පත් කර ගනිමින් සිටින බැවිනි.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ලාභදායි ආයතනයක් වශයෙන් පරිවර්තනය කිරීමට අපට හැකි වී ඇති අතර ග්‍රාමීය ආර්ථිකයට සෘජුවම බලපෑමක් ඇති කරන කිරි පට්ටි සහ පශු සම්පත් වල ප්‍රධාන ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමට දායක වී ඇත්තෙමු. අප ස්වයං පැවැත්මක් ඇති ආයතනයක් වන නමුත් ලාභ ඉපයීම ම අප ගේ ප්‍රධාන පරමාර්ථය නොවන අතර ජනතා සේවයට ඉතා ඉහළ ප්‍රමුකත්වයක් ලබා දෙමින් කටයුතු කරමු.

මහජනතාව අතර දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීමේ ප්‍රයත්නය ධනාත්මක ප්‍රතිඵල ගෙන දෙමින් පවතී.  පාරිභෝජිකයන් අතර දියර කිරි නිෂ්පාදනය ජනප්‍රිය කිරීම සඳහා කොලඹ සහ පිට පලාත් වල පිහිටි අලෙවි සැල් නවීකරනය කොට අපගේ ගොවිපොළ වල් වල ගුණාත්මක නිෂ්පාදන ද හඳුන්වා දෙමින් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කෙරේ.

අපගේ කාර්යය මණ්ඩලයේ සහ ශ්‍රම බලකායේ අගයන් අවබෝධ කරගනිමින් සේවකයින් සමාජ වගකීම් සහ ඵලදායිතාව කෙරෙහි යොමු කිරිම  පිණිස සේවකයින් අභිප්‍රේරණය කිරීම  වෙනුවෙන් විවිධ දිරි දීමනා, සමාජ සුභ සාධන වැඩසටහන් සමග පහසුකම් සලසා ඇත්තෙමු. මෙම මෙහවර වල් ඉටු කිරීමේ දී ඔවුන් ගෙන් ලැබුණු සහයෝගය හා උත්සහය ඉතා ප්‍රශංසනීය වන අතර ඒ සඳහා මාගේ හෘදයංගම ස්තුතිය මෙමගින් පුද කරමි.

මේ සියළු ජයග්‍රහනයන් සාක්ෂාත් කර ගැනීමට හැකි වූයේ පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍ය ගරු ආරුමුගම් තොන්ඩමාන් මැතිතුමා ගේ කාර්යය සූර්ය නායකත්වය සහ මග පෙන්වීම යටතේ නියොජ්‍ය අමාත්‍ය ගරු එච් ආර් මිත්‍රපාල මැතිතුමා ගේ  සහ අමාත්‍යාංශ ලේකම් සහ නිලධාරීන් ගේ දක්ෂ සහායෙනි.

අප ගේ සභාපති ලුතිනන් කර්නල් රංජිත් ඇල්ලේගල මයා ගේ නායකත්වය යටතේ තව තවත් සාර්ථක ප්‍රතිඵල නෙලා ගත හැකි වනු ඇති බව මා තදින් ම විශ්වාස කරන අතර ඒ සඳහා මාගේ සම්පූර්ණ සහයෝගය සහ සහය නිරන්තරයෙන්ම ලැබෙනු ඇත.

එච්.ආර්. අනුර ජයසිරි
*නියෝජ්‍ය සභාපති*

# අධ්‍යක්ෂ මණ්ඩලය



වමේ සිට දකුණට

ආර්. එම්. බී. ඇල්ලෙගල (සභාපති)
එච්. ආර්. අනුර ජයසිරි (නියෝජ්‍ය සභාපති)
වෛද්‍ය සැම්සන් එල්. ඒ. ඩැනියෙල්
රවීන්ද්‍ර මනෝජ් ගමගේ




වමේ සිට දකුණට

ආර්. අශෝක්කුමාර්
ආචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා
එස්. බාලචන්ද්‍රන්
කේ. ඇම්. කේ. සිරිවර්ධන

# කළමණාකාර කණ්ඩායම



**වමේ සිට දකුණට**

ඒ.සි.එච්. මුණවීර
සාමාන්‍යාධිකාරී

ඩී. උපාලි ජයවර්ධන
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පශු සම්පත් හා වැවිලි සංවර්ධන)

ඩී. මැදගෙදර
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංස්ථා මෙහෙයුම්)

කේ.කේ.ආර්. කන්නන්ගර
සහකාර සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් හා පරිපාලන)



වමේ සිට දකුණට

එන්.පී.සී. ඒකනායක
සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය)

එම්.ඩී. කරුණාතිලක
කළමනාකරු (නිරීක්ෂණ හා ඇගයීම්)

එම්. රාජකරුණා
කළමනාකරු (මූල්‍ය)

එස්.ඒ.එස්. තෙවරප්පෙරුම මිය
පරිපාලන කළමනාකාරිණි




NLDB
නැවුම්ම නැවුම් එළකිරි
தூய்மையான பசும் பால்
Nutritious Gouda cheese
Pure and fresh






# මෙහෙයුම් සමාලෝචනය

# ගොවිපොලවල් පිහිටි ස්ථාන







1. Andigama
2. Beligama
3. Bopaththalawa
4. Dayagama
5. Galpokuna
6. Haragama
7. Horrakeley
8. Kandekaduwa
9. Karandagolla
10. Kottukachchiya
11. Koulwewa
12. Mahaberiyantenna
13. Marandawila
14. Marawila
15. Martin
16. Melsiripura
17. Miriswatte
18. MLDC
19. Narangalla
20. Nikaweratiya
21. Oyamaduwa
22. Paragaswewa
23. Polonnaruwa
24. Polonthalawa
25. Ridiyagama
26. Rosita
27. Rukkaththana
28. Siringapatha
29. Weerawila
30. Welikanda
31. Welisara

# කිරි පට්ටි සංවර්ධනය

## 1. ශ්‍රී ලංකා කිරි පට්ටි සංවර්ධන ව්‍යාපෘතිය

දැනට වාර්ෂිකව කිරි පිටි මෙ. ටොන් 70000 -75000 අතර ප්‍රමාණයක් රුපියල් බිලියන 30 ක් පමණ සුවිශාල මුදලක් වැය කරමින් වාර්ෂිකව රට තුලට ආනයනය කරනු ලබයි. කිරි වලින් රට ස්වයං පෝෂිත තත්ත්වයක් ඇති වීමට නම් තවත් කිරි ලීටර් මිලියන 482 ක් වාර්ෂිකව නිෂ්පාදනය කළ යුතුව ඇත. වර්තමාන ගව සම්පතෙන් ලැබෙන නිෂ්පාදනයෙන් මෙම නිෂ්පාදන ඉලක්කය සපුරා ගැනිම කිසිසේත් නොහැකි වනු ඇත. ඒ අනුව අපගේ ගොවි පොළ වල ඇති ගව සම්පතෙහි ජානමය විභවය ප්‍රවර්ධනය කිරිම හදිසි කාර්යයක් වී ඇති නමුත් මෙය දශක කිහිපයක් පමණ ගත වන කාලය වැය වන ක්‍රියා වලියකි. කෙසේ වෙතත් අපගේ දේශීය ගොවීන්ට කිරි දෙනුන් එකෙකු හෝ දෙදෙනෙකු අයිතිව ඇති අතර මොවුන්ගේ ඵලදායිතාවය දියුණු කිරීම තුළින් ජාතික මට්ටමේ නිෂ්පාදනයෙහි ද වැඩි වීමක් ඇති වේ. කිරි ගව පට්ටි සංවර්ධනයෙහි ප්‍රගතියක් අත්පත් කර ගැනීමට නම් මෙම ඉලක්කය සපුරා ගැනිම සඳහා උසස් වර්ගයේ අභිජනන ගව තොග වැඩි ප්‍රමානයක් ගොවීන් වෙත නිකුත් කළ යුතුව ඇත .

දැනට ජාතික කිරි ගව නිෂ්පාදනයට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ දායකත්වය 3% ක් පමන වන අතර මෙය කිරි ගව කර්මාන්තය කෙරෙහි වෙනසක් ඇති කිරීමට තරම් ප්‍රමාණවත් නොවේ. එබැවින් ජාතික අවශ්‍යතාවයෙන් අපගේ දායකත්වය 7% ක් දක්වා වැඩි කරමින් රටෙහි කිරි නිෂ්පාදනය වැඩි කිරීමට මණ්ඩලය සැලසුම් කර ඇත. මේ අතර ඉදිරි වසර පහ තුළ වැස්සියන් වැඩි සංඛ්‍යාවක් නිෂ්පාදනය කර ගොවීන් වෙත නිකුත් කිරීමට සැලසුම් කර තිබේ. මේ සඳහා අපගේ ගොවිපොළ වල් වැඩි දියුණු කළ උසස් වර්ගයේ අභිජනන ද්‍රව්‍යයන් බෙදා හරිනු ලබන සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් යොදා ගනු ඇත.

ඉහත කී අරමුණු ඉටු කර ගැනීම සඳහා "මහින්ද චින්තන" වැඩ සටහන යටතේ යමින්, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය දශක දෙකකින් පමණ පසු ජාතික කිරි පට්ටි සංවර්ධන වැඩ සටහන යටතේ උසස් ප්‍රතිඵල ලබා දෙන ජර්සි, ෆ්‍රීෂියන්, සහ ජර්සි × ෆ්‍රීෂියන් වර්ගයේ දෙමුහුන් ගැබිණි වැස්සියන් 2000 ක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට සමත් වී ඇත.මෙම සතුන් ඔස්ට්‍රේලියාවේ සිට ආනයනය කර ඇති අතර ඔවුන් දැනට කඳු රට පිහිටි මණ්ඩලයට අයත් මැනික් පාලම, බෝපත්තලාව සහ ඩයගම වැනි ගොවි පොළ වල් වල ස්ථාන ගත කොට ඇත.

මෙම සතුන් තොගයෙහි පැටවවුන් බිහි කිරීම දැනටමත් ආරම්භ වී ඇති අතර සතුන් ආනයනය කිරීමට පෙර දෛනිකව කිරි දෙනෙකගෙන් සාමාන්‍යයෙන් දොවා ගත් ලීටර් 07 ක ප්‍රමානය දැන් ලීටර් 20 දක්වා ඉහල ගොස් ඇත. වර්තමානයේ මණ්ඩලයේ දෛනික මුළු කිරි නිෂ්පාදනය ලීටර් 30,000 දක්වා වර්ධනය වී ඇත. තවත් උසස් ප්‍රතිඵල ලබා දෙන දෙමුහුන් ගැබිණි වැස්සියන් 2500 ක් 2014 වර්ෂයේ දී රටට ලඟා වීමට නියමිතව ඇති අතර ඔවුන් දකුණු පලාතේ පිහිටි රිදියගම ගොවි පොළෙ හි ස්ථානගත කරනු ඇත.

### බෝපත්තලාව සහ ඩයගම ගොවිපොළයන් හි ගව කුටි වැඩි දියුණු කිරීම

අළුතෙන් ආනයනය කරන ලද ගවයින් ගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි බෝපත්තලාව සහ ඩයගම පිහිටි ගොවිපොළයන් හි ගව මඩු වැඩි දියුණු කොට නව උපකරණ සවි කර ශක්තිමත් කරන ලදී. මෙයට අතිරේකව නවීන කිරි දොවන යන්ත්‍ර ද හඳුන්වා දෙමින් එහි කළමනාකරණය සහ ඵලදායිතාවය දියුණු කරන ලදී.







## නව කිරි දොවන යන්ත්‍ර හඳුන්වා දීම

යන්ත්‍ර මගින් කිරි දෙවීම දිනකට දෙවතාවක් සිදු කෙරේ. මිනිත්තු දහයක් තුල මෙම යන්ත්‍රයට සතුන් 48 ක ගේ කිරි දෙවිය හැක. කිරි දොවන යන්ත්‍ර සහ ශීත කරණ ටැංකි මිනිස් ස්පර්ශයකින් තොරව ස්වයං ක්‍රියව පිරිසිදු කෙරෙන අතර මෙමගින් කිරිවල ගුණාත්මක තත්ත්වය සහතික කෙරේ.

ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ගව වර්ග ඉතා ඉහල ගුණාත්මකභාවයකින් හා විභයකින් යුක්ත සතුන් වර්ග වේ. ප්‍රීෂියන් දෙනෙකගෙන් එක් කිරි දොවන කාලයක දී කිරි ලීටර් 6000 ක් පමන ලබා ගත හැකි අතර එය දෙමුහුන් හා ජර්සි වර්ගයේ සතුන් සම්බන්ධයෙන් ගත් කළ පිළිවෙළින් ලීටර් 5500 සහ 5000 ක් වේ. සියළුම සතුන්ට සම්ප්‍රේක්ෂ ප්‍රතිචාරකයන් හෙවත් ඉලෙක්ට්‍රොනික පතුරක් සවි කර ඇති අතර ඔවුන් කිරි දොවන ශාලාවට ප්‍රවේශවෙන ස්ථානයේ දී ස්වයං ක්‍රීව ඔවුන් ගේ මිණුම් ඒකකයන් සටහන් කෙරේ.

කිරි දොවන ස්ථානයේ දී දෙනුන් හඳුණාගනු ලබන අතර ඔවුන් ගේ කිරි අස්වැන්න, කිරි ගලා ඒමේ වේගය, කිරි වල යම් වෙනසක් ඇතොත් එකී තොරතුරු සහ කිරි වල සංයුතිය පිලිබඳ තොරතුරු සම්බන්ධිත පරිඝණකයෙහි එක් එක් කිරි දෙන සම්බන්'ධයෙන් තොරතුරු සටහන් වේ. පරිඝණකයෙන් ඕනෑම කිරි දෙනෙකු කිරි දෙවීමෙන් පසු තෝරන ගේට්ටුවේ දී තෝරා බේරා වෙන් කර ගත හැකිය.පරිඝණකයේ ඇති අංක තෝරා ගැනීමෙන්, අභිජනනයට සුදුසු දෙනුන්, ප්‍රතිකාර කළ යුතු හෝ පරීක්ෂා කල යුතු දෙනුන් ස්වයංක්‍රීව තෝරා ගැනේ. පරිඝණකයෙන් දෛනිකව අවධානය යොමු කල යුතු ලැයිස්තුවක් සැපයෙන අතර එහි සැපයෙන තොරතුරු අතර අභිජනනය අවශ්‍ය කෙරෙන සතුන්, ගර්භණීබාවය සඳහා පරීක්ෂා කල යුතු සතුන්, කෘතිම සිංචනය සඳහා නැවත පරීක්ෂා කළ යුතු සතුන් යනා දි විස්තර ඇතුලත් වේ. එක් එක් කිරි දෙනුන් ගේ කිරි දෙවීමේ සටහන් පත්‍රිකාවක් සෑම කිරි දොවන වාරයක දීම වාර්තා කෙරේ.



සියළු සිදුවීම් ( පැටව් බිහි කිරීම්, සිංචනයන්, ප්‍රතිකාර යනාදිය ) දෛනිකව පරිඝණකයෙහි සටහන් කරනු ලැබේ. අවශ්‍ය විස්තර පිලිබඳ පසු විපරම් කිරීම පහසු කාර්යයක් වන අතර ඕනෑම වාර්තා ආකෘතියක් ලබා ගත හැක.2013 වසරේ ජනවාරි මස උසස් අස්වැන්නක් ලබා දෙන වර්ගයේ කිරි ගවයින් 1500 ක් ආනයනය කිරීමත් සමග දිනකට කිරි නිෂ්පාදනය තවදුරටත් ලීටර 20,000 - 22,000 දක්වා වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2014 දී තවත් 2500 ක් උසස් වර්ගයේ කිරි ගවයින් ආනයනය කිරීමට සැලසුම් කර ඇති අතර ඒ අනුව ජානමය වශයෙන් වැඩි දියුනු කරන ලද උසස් ප්‍රතිඵල ලබා දෙන සතුන් ගේ මුළු සංඛ්‍යාව වසරකට 5000 -6000 ක් අතර වනු ඇත.







### මුළු මිශ්‍ර ගව ආහාර සලාකය හඳුන්වා දීම (TMR) සහ තෘණ මිශ්‍රණ යන්ත්‍රය

ගොවි පොළ ක්‍රියාකාරකම් වල දී නවීන ක්‍රම භාවිතා කෙරේ. මිශ්‍රණ යන්ත්‍රයක් භාවිතා කරමින් ඔඑසෑ ක්‍රමය නැමැති පෝෂ්‍ය දායක සමබර ආහාර සැපයීමේ ක්‍රමයක් ගවයිනට ආහාර සැපයීම සඳහා යොදා ගැනේ. මිශ්‍රණයේ අඩංගු වන්නේ සාන්ද්‍රනය කරන ලද බඩ ඉරිඟු කොළ, තෘණ, ධාන්‍ය වර්ග සහ ඛනිජ ලවණ කොටස්ය. මිශ්‍රණ යන්ත්‍රයේ ඒකක සලකුණු කර ඇති අතර අවශ්‍ය කරන ආහාර සංයුතිය ඒ ආකාරයෙන්ම දෛනික ආහාර සලාකයේ අඩංගු කර ගත හැකිය. මෙම සතුන්ට සමාන ආහාර ප්‍රමානයක් හා සමාන ගුණාත්මක තත්ත්වයකින් යුත් පෝෂ්‍යදායි ආහාර දෛනිකව ලැබෙන අතර ඉහල මට්ටමක කිරි නිෂ්පාදනය නොකඩවා රඳවා ගැනීම සඳහා මෙය ඉතා අවශ්‍ය කෙරේ. අභිජනන කටයුතු සඳහා ආනයනය කරන ලද ශුක්‍රානු මගින් කෘතිම සිංචනය කරනු ලැබේ. පශු වෛද්‍ය නිලධාරියෙකු විසින් ගවයින් ගේ සෞඛ්‍ය තත්ත්වය නිරන්තරයෙන් නිරීක්ෂනය කෙරේ.












## 2. තෘණ සංවර්ධනය

පහත සඳහන් වර්ගයේ තෘණ සහ ගව ආහාර අපගේ ගොවිපොල වල් වල ඇත.

1. බ්‍රිකේරියා බ්‍රිෂාන්තා
2. බ්‍රිකේරියා රෂියන්ෂිස්
3. කිකියු
4. $CO_3$
5. එන් බි 21
6. නේපියර්
7. ගුණියා A
8. ගුණියා B
9. මොම්බාෂා ගුණියා
10. $TD_{58}$



1.2013 වසරේ අදියර 1-2 යටතේ මෙරටට ආනයනය කරන ලද උසස් වර්ගයේ කිරි ගවයින්ට ගැලපෙන පරිදි මැණික් පාලම, බෝපත්තලාව සහ ඩයගම යන ගොවි පොළයන් හි අක්කර 243 ක භූමි භාගයක ගව තෘණ ආහාර වගා කොට ඇත.

| වසර | ඉලක්ක කල ප්‍රමාණය (අක්) | වගාකළ ප්‍රමාණය (අක්) | ආනයනය කරන ලද බීජ (කි.ග්‍රෑ) | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | M.Guniea | TD 58 | B.Dic | Kikue | W.Clover | S.santhus | එකතුව |
| 2009 | 1220 | | | | | | | | 0 |
| 2010 | | 545 | | | 1550 | 220 | 65 | 145 | 1760 |
| 2011 | 1156 | 1026 | 1540 | 159 | 3955 | | | | 5654 |
| 2012 | 510 | 872 | | | 1000 | | | | 1000 |
| 2013 | 560 | 444 | | | | | | | |





## 3. ගව අභිජනනය ප්‍රවර්ධනය කිරීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ විශේෂයෙන්ම කඳු රට ගොවි පොල වල්හි ගව අභිජනනය ප්‍රවර්ධනය කිරීම පිණිස, ප්‍රීෂියන්, සහ ජර්සි වර්ගයේ ( ප්‍රීෂියන් 1500, ජර්සි 2500) සම්ප්‍රදායික බෝවින් ශුක්‍රාණු මාත්‍රා 4000 ක් කැනඩාවේ සිට මෙරටට මණ්ඩලය විසින් ආනයනය කරන ලදී. නිෂ්පාදනයෙහි සහ ප්‍රජනනයෙහි ඉහල විභවයක් ඇති ගවයින් ගෙන් පැවැතෙන ගවයින්ගෙන් මෙම ශුක්‍රාණු මාත්‍රා තෝරා ලබා ගන්නා ලදී. මෙම ආනයනය කරන ලද ශුක්‍රාණු මණ්ඩලයට ආනයනය කර ඇති සතුන්ට හා ත1 පෙළපතට හඳුන්වා දීමත් සමග කඳු රටෙහි ඉතා උසස් වර්ගයේ අභිජනන ද්‍රව්‍යයන් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරන අතර විශේෂයෙන් මෙම අභිජනන ද්‍රව්‍යයන් තෝරා ගත් ගව අභිජනන කටයුතු වල යෙදි සිටින ගොවීන් වෙත නිකුත් කිරීමට නියමිතය. මෙම ප්‍රයත්නයන් තුළින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙන් සහ දේශීය ගොවීන් මාර්ගයෙන් කිරි ලීටර් මිලියන 35 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.






| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| එළ ගව | | | | | |
| ප්‍රීෂියන් | 406 | 412 | 398 | 441 | 490 |
| ජර්සි | 173 | 177 | 170 | 192 | 208 |
| AFS & JS | 565 | 644 | 709 | 796 | 821 |
| ප්‍රීෂියන් සහ JF | 14 | 715 | 671 | 619 | 731 |
| ෂායිවාල් | 77 | 83 | 85 | 88 | 92 |
| **එකතුව** | **1236** | **2031** | **2034** | **2136** | **2341** |
| මී ගව | | | | | |
| මුරා | 145 | 140 | 143 | 151 | 169 |
| නිලිරවි | 21 | 20 | 20 | 20 | 22 |
| **එකතුව** | **166** | **161** | **163** | **172** | **191** |
| කිරි නිෂ්පාදනය (ලීටර මිලියන) | | | | | |
| එළ ගව කිරි | 11.2 | 26.0 | 26.9 | 29.0 | 32.0 |
| මී ගව කිරි | 1.0 | 1.3 | 1.3 | 1.3 | 1.3 |
| **උප එකතුව - 1** | **12.3** | **27.3** | **28.1** | **30.2** | **33.3** |
| මණ්ඩලයෙන් දේශීය ගොවියන් වෙත ලබා දුන් වැස්සියන් මගින් අපේක්ෂිත කිරි නිෂ්පාදනය | | | | | |
| එළ ගව | 1.3 | 3.1 | 6.5 | 12.7 | 16.4 |
| මී ගව | 0.3 | 0.6 | 0.9 | 1.3 | 1.3 |
| **උප එකතුව -2** | **1.6** | **3.7** | **7.4** | **14.0** | **17.7** |
| **මුළු එකතුව** | **13.9** | **31.0** | **35.6** | **44.3** | **51.0** |
| ඉලක්ක කළ කිරි නිෂ්පාදනය - ලීටර මිලියන ප්‍රධාන සැලසුම අනුව | | | | 740 | 740 |
| මණ්ඩලයේ සමස්ථ දායකත්වය | | | | 6% | 7% |



## 4. නිකවැරටියෙහි නව අලෙවි මධ්‍යස්ථානයක් විවෘත කිරීම හරහා අලෙවි ප්‍රවර්ධනය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නියෝජ්‍ය සභාපති ලක්ෂමන් හුලුගල්ලේ මහතා විසින් නව අලෙවි මධ්‍යස්ථානයක් නිකවැරටිය කුරුණෑගල මහා මාර්ගයට මුහුණ ලා රථ ගාල් කිරීමට විශාල ඉඩ පහසුකම් ඇති නිකවැරටියේ නගරයේ දී විවෘත කරන ලද අතර මෙමගින් විශේෂයෙන් මණ්ඩලයේ ගුණාත්මක පශු සම්පත් සහ නිෂ්පාදන එකම වහලක් යටතේ ප්‍රදේශයේ ජනතාවට ලබා ගත හැකි වනු ඇත. මෙම අලෙවි මධ්‍යස්ථානය සියළු දෙනාට පහසු වන ස්ථානයක් වන අතර මෙහි පාරිභෝජකයිනට නිදහසේ වාඩි වී එක වහලක් යටතේ නැවුම් කිරි සහ නිෂ්පාදන වල රස විඳිය හැකිය.

මෙම අලෙවි මධ්‍යස්ථානය හඳුන්වා දීම තුළින් මණ්ඩලය දෛනික අලෙවිය රුපියල් ලක්ෂයකින් පමණ වැඩි කර ගැනීමට අදහස් කරන අතර මෙය ගොවි පොලෙහි ලාභදායිකත්වය ඉදිරියේ දී වැඩි කර ගැනීමට ආධාරකයක් වනු ඇත.






## 5. "ඩීලයිට්" නමින් කිරි ඇසුරුම් අලෙවිය ප්‍රචලිත කිරීම

ප්‍රථම වතාවට 2010 වසරේ ජූලි මාසයේ දී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් "ඩීලයිට්" නමින් කිරි ඇසුරුම් පැකට් වෙළඳ පොළට හඳුන්වා දෙන ලදී. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අලෙවි සැල්, නියෝජිත අලෙවි සැල් සහ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නාරාහේන්පිට පිහිටි අලෙවි සැල් මගින් මෙම නිෂ්පාදන අලෙවි කරන ලදී. පසුව "ඩීලයිට්" නිෂ්පාදන කීල්ස් සුපිරි වෙළඳ සැල් හරහා ද අලෙවි කරන ලද අතර එය සීමිත මෙහෙයුමක් විය. නැවුම් කිරි සඳහා රට තුළ පවතින ඉහල ඉල්ලුම අනුව බෙදා හැරීමේ ජාලය විස්තීර්ණය කිරීමේ හැකියාවක් ද පැවතුණි.

මැලිබන් බෙදාහැරීමේ ආයතනය සමග ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 2013 වසරේ දී "ඩීලයිට්" නිෂ්පාදන දීප ව්‍යාප්තව බෙදාහැරීමේ ජාලය වර්ධනය කර ගැනීම සඳහා බද්ධ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීමේ වැඩසටහනේ සාර්ථකත්වය පහත සඳහන් සංඛ්‍යා ලේඛන තුලින් මනාව විදහා දක්වෙන අතර මෙම වැඩසටහන තවදුරටත් විස්තීර්ණය කොට සාර්ථක කර ගැනීමේ හැකියාවක් ද පෙනේ.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අලෙවි මධ්‍යස්ථාන, අලෙවි සැල්, නියොජිත අලෙවි සැල්, ආයතනමය සේවාදායකයින් සහ ගොවිපොළ අලෙවි සැල් සඳහා අවශ්‍ය වන කිරි, කිරි බෙදාහැරීමේ අංශය විසින් නොකඩවා සැපයුම් කෙරේ. "ඩීලයිට්" නිෂ්පාදන අලෙවිය විස්තීර්ණය කිරීමට පෙර ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හරහා කෙරුණු මාසික සාමාන්‍ය ඩීලයිට් ඇසුරුම් අලෙවි සංඛ්‍යාව 8000 පමණක් විය.

| වසර | මණ්ඩලයේ විකුණුම් (සිය අලෙවි සැල් හරහා) ලීටර් | මැලිබන් හරහා විකුණුම් ලීටර් | එකතුව ලීටර් |
|---|---|---|---|
| 2011 | 79,489 | | 79,489 |
| 2012 | 91,549 | | 91,548 |
| 2013 (ජන සිට ජූනි දක්වා) | 47,344 | | 47,344 |
| 2013 (ජූලි සිට දෙසැම්බර් දක්වා) | 33,548 | 126,900 | 160,448 |
| **2013 එකතුව** | | | **207,792** |

## 6. පසුගිය වසර 6 තුළ භෞතික ප්‍රගතිය

**පශු සම්පත් හා භෝග නිෂ්පාදනය**

| | ක්‍රියාකාරකම් | ඒකක | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 6.1 | **පශු සම්පත් ප්‍රමාණය** | | | | | | | | |
| | එළ ගවයින් | ඒකක | 8,272 | 8,199 | 8,621 | 8,329 | 8068 | 7755 | 7295 |
| | මී ගවයින් | ඒකක | 2,114 | 2,130 | 2,191 | 2,409 | 2534 | 2403 | 2080 |
| | එකතුව | ඒකක | 10,386 | 10,329 | 10,812 | 10,738 | 10,602 | 10158 | 9375 |
| | එළුවන් | ඒකක | 1,738 | 1,673 | 1,656 | 1,454 | 945 | 759 | 776 |
| | බැටළුවන් | ඒකක | 2,222 | 2,692 | 2,956 | 3,043 | 3411 | 3148 | 4358 |
| | අභිජනන ඌරන් | ඒකක | 1,306 | 923 | 1,514 | 975 | 1439 | | 764 |
| | **කුකුළන්** | | | | | | | | |
| | බ්‍රොයිලර් මව් සතුන් | ඒකක | 26,743 | 29,904 | 25,953 | 33,838 | 32878 | 20610 | 19585 |
| | ලේයර් මව් සතුන් | ඒකක | 6,053 | 5,767 | 4,998 | 9,870 | 7260 | 2743 | 6165 |
| | වාණිජ ලේයර් | ඒකක | 21,001 | 15,145 | 6,180 | 4,298 | 7541 | 10016 | 7535 |
| | වාණිජ බ්‍රොයිලර් | ඒකක | 14,979 | 3,336 | 1,433 | 1,958 | 5400 | 0 | 0 |
| | වටුවන් | ඒකක | 8,349 | 6,552 | 46 | 377 | 252 | 0 | 0 |
| | හාවුන් | ඒකක | 1,117 | 811 | 507 | 0 | 0 | 0 | 0 |
| 6.2 | **අභිජනන සඳහා පශු සම්පත් නිකුත් කිරීම** | | | | | | | | |
| | එළ ගවයින් | ඒකක | 1,153 | 1,200 | 1,033 | 944 | 1328 | 1997 | 2682 |
| | මී ගවයින් | ඒකක | 265 | 174 | 128 | 210 | 185 | 124 | 285 |
| | එළුවන් | ඒකක | 267 | 281 | 274 | 218 | 503 | 245 | 21 |
| | බැටළුවන් | ඒකක | 194 | 367 | 312 | 123 | 181 | 563 | 652 |
| | ඌරන් | ඒකක | 1,516 | 2,294 | 1,833 | 3,328 | 2885 | 2879 | 3272 |
| | හාවුන් | ඒකක | 1,403 | 1,071 | 746 | 0 | 0 | 0 | 0 |
| 6.3 | **කුකුල් පැටවුන් නිෂ්පාදනය** | | | | | | | | |
| | බ්‍රොයිලර් (මිලියන) | ඒකක | 2.08 | 2.3 | 1.8 | 1.8 | 2.3 | 1.95 | 1.68 |
| | ලේයර් (මිලියන) | ඒකක | 0.81 | 0.9 | 0.6 | 1.0 | 1.1 | 0.66 | 0.46 |
| 6.4 | **කිරි නිෂ්පාදනය** | | | | | | | | |
| | එළ ගවයින් | ලී-මිලි | 2.9 | 3.2 | 3.3 | 3.2 | 2.8 | 3.4 | 8.6 |
| | මී ගවයින් | ලී-මිලි | 0.65 | 0.68 | 0.64 | 0.68 | 0.63 | 0.68 | 0.70 |
| | එළු කිරි | ලී-මිලි | 22,637 | 23,077 | 27,640 | 13,358 | 10,753 | 4716 | 5296 |
| 6.5 | **බිත්තර නිෂ්පාදනය** | මිලියන | 4.1 | 3.4 | 1.9 | 1.0 | 2.0 | 2.53 | 1.24 |
| | වටු බිත්තර නිෂ්පාදනය | මිලියන | 0.25 | 0.21 | 0.05 | 0.02 | 0.04 | 0 | 0 |
| 6.6 | **බ්‍රොයිලර් නිෂ්පාදනය (පක්ෂීන්)** | මිලියන | 0.09 | 0.09 | 0.01 | 0.01 | 0.03 | 0 | 0 |
| 6.7 | **පොල් නිෂ්පාදනය** | | | | | | | | |
| | නිෂ්පාදනය කළ ගෙඩි ගණන | මිලියන | 21.73 | 20.55 | 21.48 | 20.60 | 19.94 | 21.39 | 14.17 |
| | කොප්පරා නිෂ්පාදනය | මෙටො | 537.4 | 278.7 | 336.71 | 247.85 | 227.18 | 220.92 | 170.78 |

## 7. පශු සම්පත් හා භෝග නිෂ්පාදන දත්ත

| | ක්‍රියාකාරකම් | මිම්ම | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|
| 7.1 | **පශු සම්පත් ප්‍රමාණය** | | | | | | |
| | එළ ගවයින් | ඒකක | 8,621 | 8,329 | 8068 | 7755 | 7295 |
| | මී ගවයින් | ඒකක | 2,191 | 2,409 | 2534 | 2534 | 2080 |
| | එකතුව | | 10,812 | 10,738 | 10602 | 10158 | 9375 |
| | එළුවන් | ඒකක | 1,656 | 1,454 | 945 | 759 | 776 |
| | බැටළුවන් | ඒකක | 2,956 | 3,043 | 3411 | 3148 | 4358 |
| | අභිජනන ඌරන් | ඒකක | 1,514 | 975 | 1439 | 1716 | 764 |
| | හාවුන් | ඒකක | 507 | 0 | 0 | 0 | 0 |
| | කුකුළන් | | | | | | |
| | බ්‍රොයිලර් මව් සතුන් | ඒකක | 25,953 | 33,838 | 32878 | 20610 | 19585 |
| | ලේයර් මව් සතුන් | ඒකක | 4,998 | 9,870 | 7260 | 2743 | 6165 |
| 7.2 | **අභිජනනය සඳහා පශු සම්පත් නිකුත් කිරීම** | | | | | | |
| | එළ ගවයින් | ඒකක | 1,033 | 944 | 1328 | 1997 | 2682 |
| | මී ගවයින් | ඒකක | 128 | 210 | 185 | 124 | 285 |
| | එළුවන් | ඒකක | 274 | 218 | 503 | 245 | 21 |
| | බැටළුවන් | ඒකක | 312 | 123 | 181 | 563 | 652 |
| | ඌරන් | ඒකක | 1,833 | 3,328 | 2885 | 2879 | 3272 |
| | හාවුන් | ඒකක | 746 | 0 | 0 | 0 | 0 |
| | දිනක් වයසැති කුකුල් පැටවුන් | | | | | | |
| | බ්‍රොයිලර් | ඒකක මිලියන | 1.8 | 1.8 | 2.3 | 1.95 | 3.2 |
| | ලේයර් | ඒකක මිලියන | 0.6 | 1.0 | 1.1 | 0.66 | 0.6 |
| 7.3 | **කිරි නිෂ්පාදනය** | | | | | | |
| | එළ ගවයින් | ලීටර මිලියන | 3.3 | 3.2 | 2.8 | 3.4 | 8.6 |
| | මී ගවයින් | ලීටර මිලියන | 0.64 | 0.68 | 0.63 | 0.68 | 0.70 |
| | බ්‍රොයිලර් නිෂ්පාදනය | සතුන් මිලියන | 0.01 | 0.01 | 0.03 | 0 | 0 |
| 7.4 | **පොල් නිෂ්පාදනය** | | | | | | |
| | නිෂ්පාදනය කළ ගෙඩි ගණන | ඒකක මිලියන | 21.5 | 20.6 | 19.94 | 21.39 | 14.17 |
| | කොප්පරා නිෂ්පාදනය | මෙ ටො | 336.7 | 247.9 | 227.18 | 220.92 | 170.78 |

## 8. 2013 වසරේ කාර්යය සාධනය - පශු සම්පත් හා භෝග නිෂ්පාදන දත්ත

| ක්‍රියාකාරකම් | මිම්ම | ප්‍රමාණය 2010 | ප්‍රමාණය 2011 | ප්‍රමාණය 2012 | ප්‍රමාණය 2013 |
|---|---|---|---|---|---|
| එළ ගවයින් | | | | | |
| මුළු ප්‍රමාණය | ඒකක | 8,329 | 8068 | 7755 | 7295 |
| වසර 2කට වැඩි වැස්සියන් | ඒකක | 1,550 | 1318 | 965 | 1070 |
| වසර 0-2 අතර වැස්සියන් | ඒකක | 2,084 | 1987 | 1432 | 1910 |
| වසරට වැඩි වස්සන් ගණන | ඒකක | 957 | 1102 | 746 | 439 |
| සම්පූර්ණ උපත් | ඒකක | 2,613 | 2380 | 2646 | 3410 |
| අභිජනනය සඳහා සම්පූර්ණ නිකුත් කිරීම | ඒකක | 944 | 1328 | 1997 | 2682 |
| රැලට නුසුදුසු ලෙෂ ඉවත් කිරීම | ඒකක | 932 | 349 | 860 | 738 |
| සම්පූර්ණ මරණ | ඒකක | 631 | 980 | 1047 | 743 |
| සම්පූර්ණ එළ දෙනුන් ගණන | ඒකක | 3,430 | 3443 | 3406 | 3787 |
| කිරි දෙවන එළ දෙනුන් ගණන | ඒකක | 1,519 | 1404 | 1339 | 2124 |
| කිරි දෙවන එළ දෙනුන් ප්‍රතිශතය | % | 57 | 53 | 51 | 59 |
| කිරි දෙනකගේ දිනක සාමාන්‍ය කිරි නිෂ්පාදනය | ලීටර් | 5.8 | 5.6 | 7 | 11.2 |
| කිරි මුරයේ සාමාන්‍ය කාලය | දින | 265 | 274 | 263 | 280 |
| කිරි නිෂ්පාදනය | ලීටර් මිලියන | 3.2 | 2.8 | 3.4 | 8.6 |
| කෘතිම සිංචනය කල සතුන් ගණන | ඒකක | 3,471 | 3064 | 2759 | 6260 |
| මී ගවයින් | | | | | |
| මුළු ප්‍රමාණය | ඒකක | 2,409 | 2534 | 2403 | 2080 |
| වසර 2කට වැඩි වැස්සියන් | ඒකක | 611 | 527 | 527 | 468 |
| වසර 0-2 අතර වැස්සියන් | ඒකක | 481 | 489 | 465 | 464 |
| වස්සන් ගණන | ඒකක | 202 | 422 | 443 | 190 |
| සම්පූර්ණ උපත් | ඒකක | 642 | 576 | 627 | 601 |
| අභිජනනය සඳහා සම්පූර්ණ නිකුත් කිරීම | ඒකක | 211 | 185 | 124 | 285 |
| රැලට නුසුදුසු ලෙස ඉවත් කිරීම | ඒකක | 219 | 9 | 119 | 125 |
| සම්පූර්ණ මරණ | ඒකක | 207 | 380 | 299 | 304 |
| සම්පූර්ණ දෙනුන් ගණන | ඒකක | 925 | 939 | 959 | 943 |
| කිරි දෙවන දෙනුන් ගණන | ඒකක | 442 | 394 | 427 | 432 |
| කිරි දෙවන දෙනුන් ප්‍රතිශතය | % | 45 | 49 | 43 | 48 |
| කිරි දෙනකගේ දිනක සාමාන්‍ය කිරි නිෂ්පාදනය | ලීටර | 6.0 | 4 | 4 | 3.9 |
| කිරි මුරයේ සාමාන්‍ය කාලය | දින | 254 | 281 | 314 | 251 |
| කිරි නිෂ්පාදනය | ලීටර් මිලියන | 0.68 | 0.63 | 0.68 | 0.70 |
| පලමු පැටවා බිහිකරන සාමාන්‍ය වයස | මාස | 52 | 58 | 48 | 50 |
| පැටවුන් බිහි කිරීමේ සාමාන්‍ය පරතරය | දින | 511 | 432 | 434 | 503 |
| කෘතිම සිංචනය කරන ලද සතුන් ගණන | ඒකක | 45 | 51 | | 0 |

| ක්‍රියාකාරකම් | මිම්ම | ප්‍රමාණය 2010 | ප්‍රමාණය 2011 | ප්‍රමාණය 2012 | ප්‍රමාණය 2013 |
|---|---|---|---|---|---|
| කුකුළන් | | | | | |
| බ්‍රොයිලර් මව් සතුන් | | | | | |
| මුළු එකතුව | ඒකක | 33,838 | 32878 | 20610 | 19585 |
| ආනයනය කරන ලද සතුන් | | | | | |
| පිරිමි | ඒකක | 7,609 | 1889 | 2380 | 2487 |
| ගැහැණු | ඒකක | 19,116 | 12810 | 15223 | 16540 |
| මුළු බිත්තර නිෂ්පාදනය | ඒකක | 2,496,626 | 3574459 | 2530031 | 2537320 |
| රැකිය හැකි බිත්තර නිෂ්පාදනය | ඒකක | 2,332,740 | 4284521 | 2738691 | 2281182 |
| පැටවුන් බිහි කිරීමේ ප්‍රතිශතය | % | 76 | 78 | 81 | 74 |
| නිෂ්පාදිත කුකුළ් පැටවුන් ගණන | ඒකක | 1,768,333 | 2,329,205 | 1,950,756 | 1,689,905 |
| ලේයර් මව් සතුන් ප්‍රමාණය | | | | | |
| මුළු එකතුව | ඒකක | 9,870 | 7260 | 2743 | 6165 |
| ආනයනය කරන ලද සතුන් | | | | | |
| පිරිමි | ඒකක | 1,380 | 1798 | 375 | 750 |
| ගැහැණු | ඒකක | 11,492 | 14103 | 3120 | 6240 |
| මුළු බිත්තර නිෂ්පාදනය | ඒකක | 1,575,334 | 1915251 | 1052873 | 823829 |
| රැකිය හැකි බිත්තර නිෂ්පාදනය | ඒකක | 1,417,274 | 1755556 | 924012 | 667149 |
| පැටවුන් බිහි කිරීමේ ප්‍රතිශතය | % | 75 | 75 | 70 | 74 |
| නිෂ්පාදිත කුකුළ් පැටවුන් ගණන | ඒකක | 956,338 | 1141007 | 330850 | 460486 |
| වාණිජ බ්‍රොයිලර් නිෂ්පාදනය | | | | | |
| මුළු එකතුව | ඒකක | 1,958 | 5400 | 0 | 0 |
| බ්‍රොයිලර් නිෂ්පාදනය | සතුන් | 7,114 | 37161 | 0 | 0 |
| වාණිජ බිත්තර නිෂ්පාදනය | | | | | |
| මුළු එකතුව | ඒකක | 4,298 | 7541 | 10016 | 7535 |
| මුළු කිකිළියන් එකතුව | ඒකක | 6,466 | 7944 | 6499 | 6230 |
| බිත්තර නිෂ්පාදනය | ඒකක (මිලියන) | 1,042,385 | 2095328 | 2530031 | 1241936 |
| ඌරන් ඇති කිරීමේ කාර්යය සාධනය | | | | | |
| මුළු එකතුව | ඒකක | 975 | 1439 | 1716 | 764 |
| ඉපදුනු ඌරු පැටවුන් ගණන | ඒකක | 3,228 | 3571 | 3466 | 2776 |
| වරකට බිහිකරන පැටවුන් ගණන ( ඊරියකගෙන් ) | ඒකක | 9 | 8 | 8.5 | 9 |
| වරකට බිහිකරන පැටවුන් ගණන ( නැම්බියයකුගෙන් ) | ඒකක | 8 | 8 | 9 | 10 |
| මැරුණු ඌරු පැටවුන් ගණන | ඒකක | 294 | 313 | 423 | 245 |

| ක්‍රියාකාරකම් | මිම්ම | ප්‍රමාණය 2010 | ප්‍රමාණය 2011 | ප්‍රමාණය 2012 | ප්‍රමාණය 2013 |
|---|---|---|---|---|---|
| එළුවන් ඇති කිරීමේ කාර්යය සාධනය | | | | | |
| මුළු එකතුව | ඒකක | 1,454 | 945 | 759 | 776 |
| ඉපදුනු පැටවුන් ගණන | ඒකක | 642 | 374 | 292 | 408 |
| පැටවුන් දැමීමේ වාර ගණන | ඒකක | 0.78 | 0.61 | 0.64 | 0.64 |
| මැරුණු ගණන ( වැඩිහිටි හා පැටවුන් ) | ඒකක | 191 | 355 | 190 | 235 |
| අභිජනනය සඳහා නිකුත් කිරීම | ඒකක | 218 | 503 | 245 | 21 |
| බැටළුවන් ඇති කිරීමේ කාර්යය සාධනය | | | | | |
| මුළු එකතුව | ඒකක | 3,043 | 3411 | 615 | 4358 |
| ඉපදුනු පැටවුන් ගණන | ඒකක | 1,434 | 1294 | 1327 | 1887 |
| පැටවුන් දැමීමේ වාර ගණන | ඒකක | 0.75 | 0.76 | 0.86 | 1.2 |
| මැරුණු ගණන ( වැඩිහිටි හා පැටවුන් ) | ඒකක | 188 | 323 | 133 | 195 |
| අභිජනනය සඳහා නිකුත් කිරීම | ඒකක | 123 | 181 | 563 | 652 |
| ගොවි පුහුණු වැඩසටහන් වල කාර්යය සාධනය | | | | | |
| පැවැති පාඨමාලා ගණන | ඒකක | 108 | 110 | 70 | 73 |
| සහභාගි වූවන් ගණන | ඒකක | 3,597 | 3945 | 2619 | 1806 |
| පොල් නිෂ්පාදනය | | | | | |
| නිෂ්පාදිත ගෙඩි ගණන | ඒකක | 20,602,480 | 19941373 | 21386572 | 14179220 |
| කොප්පරා නිෂ්පාදනය | මෙට්‍රික් ටොන් | 247.85 | 227.18 | 220.92 | 170.78 |

# මානව සම්පත් කළමණාකරණ අංශය

ජාතික පශු සම්පත් මණ්ඩලයේ මානව සම්පත් කළමණාකරණ අංශයේ ක්‍රියාකාරිත්වයන් සහ පුහුණු වැඩ සටහන් - 2013

### බඳවා ගැනීම්

| | |
|---|---|
| ගොවිපොළ සහකාර කළමණාකරුවන් | 01 |
| සත්ව වෛද්‍ය නිලධාරීන් | 03 |
| සහකාර කළමණාකරුවන් (මානව සම්පත්) | 01 |

### අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවය කල 190 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබා දීම

මණ්ඩලයේ දීර්ග කාලයක් පුරා කොන්ත්‍රාත් හා අනියම් පදනම මත සේවය කළ සේවකයින් 190 දෙනෙකුට පත්වීම් ප්‍රදානය කිරීම ගරු අමාත්‍යතුමා ගේ ප්‍රධානත්වයෙන් 2013 දෙසැම්බර් මස 19 දින ආපදා කලමණාකරන අමාත්‍යාංශයේ දී පැවැත්විණි මෙහි දී මෙම පත් වීම් වලට අමතරව නිලධාරීන් දස දෙනෙකු වෙත උසස් වීම් ද පිරිනමන ලදී.

### කාර්යක්ෂමතා කඩඉම් විභාගය -2013

2013 ජූලි මස 06 වන දින 38 දෙනෙකු සඳහා නියමිත ශ්‍රේණි ලබා දෙන ලදී

### ක්‍රියාත්මක කළ පුහුණු වැඩ සටහන්

- බහුවිධ කාර්යයන් කළමණාකරණය කිරීම සඳහා වන පුහුණු වැඩ සටහන
- පිළි ගැනීමේ නිලධාරීන්ගේ සහ දුර කථන ක්‍රියාකරුවන් ගේ කුසලතා වර්ධන පුහුණු වැඩ සටහන
- ලේඛකාධිකාරි පිළිවෙත් පිළිබඳ පුහුණු වැඩ සටහන
- සූකර පාලනය හා ප්‍රායෝගික පහසුකම් සඳහා අවස්ථාව ලබා ගැනීමේ පුහුණු වැඩ සටහන
- නව ජාතික නිපුණතා සම්මත හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහන
- අලෙවි සහයිකයින් සඳහා කරන ලද පුහුණු වැඩ සටහන
- පේරාදෙණිය විශ්වවිද්‍යාල සිසුන් සඳහා කරන ලද පුහුණු වැඩ සටහන
- ජාතික උසස් තාක්ෂණික ඩිප්ලෝමා ( කෘෂිකර්මය) සිසුන් 2013/2014 සඳහා අතුරු වගාවන් පිළිබඳ පුහුණු වැඩ සටහන
  - නයිටා
  - කාර්මික විද්‍යාලය, දඹුල්ල
  - හාර්ඩි උසස් තාක්ෂණික ආයතනය
- ධනාත්මක සිතුවිලි ප්‍රවර්ධනය කිරීමෙහි ලා ප්‍රධාන කාර්යාලයේ සේවක සේවිකාවන් සඳහා චංදික කොඩිකාර මහතා විසින් පවත්වන ලද දේශණය

### නිරීක්ෂණ චාරිකාව

2013 නොවැම්බර් මස 22 හා 23 යන දින තුළ මණඩලයේ සේවක මහත්ම මහත්මීන් සියළු දෙනා මැණික් පාලම/ බෝපත්තලාව/රොෂිටා ගොවිපොල වල් නිරීක්ෂණ චාරිකා වල නිරත වීම

### ඩෙංගු මර්ධන ව්‍යාපෘතීන්

2013 වසර තුල කිහිප වතාවක් මණ්ඩලයේ නිලධාරින් ගේ සහභාගීත්වයෙන් ප්‍රදාන කාර්යාලය හා අවට පරිශ්‍රය පිරිසිදු කිරීමේ කටයුතු කිරීම ( 2013/07/09 හා 2013/07/16 හා 2013/08/26 හා 2013/10/01 යන දිනයන් හිදී )

### ධර්ම දේශණය

2013 මැයි මස 22 දින වෙසක් උත්සවය නිමිත්තෙන් පෙරවරු 9 00 සිට පැයක පමන කාලයක් ධර්ම දේශනයක් පැවැත්වීම

### දන්සැල් පැවැත්වීම

වෙසක් පෝය නිමිත්තෙන් නැවුම් එළකිරි හා සීනි සම්බල් පාන් දන්සැලක් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ සභාපති තුමා ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විම

### බෝධි පූජාව

මණ්ඩලයේ සියළුම නිලධාරින් ගේ සහභාගීත්වයෙන් සියළුම අයට සෙත් පතා කරන ලද බෝධි පූජාව

### වෙසක් කුඩු තරගය

වෙසක් පෝය වෙනුවෙන් වෙසක් කුඩු තරඟයක් මණ්ඩලයේ සියළුම සේවක සේවිකාවන් අතපෙැවැත්වීම

### නත්තල් උත්සවය පැවැත්වීම

සෑම වසරකම පවත්වන නත්තල් උත්සවය මෙම වසරේ දී ද මණ්ඩලයේ සියළුම සේවක සේවිකාවන් ගේ සහයෝග යෙන් ඉතා අලංකාරවත් ලෙස පැවැත් වූ අතර මෙහි දී නාවල ගුණසේකර ළමා නිවාසයේ ළමුන් සඳහා ඔවුන්ට අවශ්‍ය අධ්‍යාපනික උපකරණ හා තෑගි ලබා දීමට ද හැකි විය







WELLARD
SRF093











# මූල්‍ය ප්‍රකාශන

# විගණකාධිපති වර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } LP/D/LDB/1/13/1 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2014 දෙසැම්බර් 31 දින

සභාපති

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

**1.3 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින්වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ හඳුනාගන්නා ලද රු.12,379,621 ක් වූ තොග ඌනතාවය සැසඳීමක් කර නිරවුල් කිරීමට කටයුතු නොකර වෙළඳ තොග යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ අයි ක්ෂය ගැලපීම රු.16,481,659 ක් අතීතානුයෝගීව ගැලපීම කරනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලින් අඩුකර දක්වා තිබුණි.

#### 2.2.2 නොසැසඳූ පාලන ගිණුම්

කල්බදු වාහන 12 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂයට අදාළ ගෙවීම්වල එකතුව රු.11,940,280 ක් වූ නමුත්, තහවුරු කිරීම්වලට අනුව ගෙවීම් එකතුව රු.12,249,492 ක් වූයෙන් රු.309,212 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) බඩ ඉරිඟු ව්‍යාපෘතියට අදාලව 2009 වර්ෂයේ සිට කන්තලේ ලංකා බැංකු ශාඛාවෙන් අයවියයුතු රු.2,092,750 ක් හා බඩ ඉරිඟු බීජ ණය පදනමට ගොවීන්ට ලබා දීමෙන් ගොවීන්ගෙන් අයවියයුතු රු.207,848 ක් අයකරගෙන නොතිබුණු අතර, වියලීම සඳහා ලබාදී තිබුණු බඩ ඉරිඟු ආපසු නොදීම නිසා පෞද්ගලික ආයතනයකින් අයවියයුතු රු.11,194,220 අයකර ගැනීමට නීතිමය පියවර ගෙන තිබුණද, 2014 සැප්තැම්බර් 30 දින වන විටද එම මුදල් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) කඳුකර ප්‍රදේශයේ ජනතාවට ගංවතුර සහනාධාර ලෙස ලබා දී තිබුණු රු.1,135,000 ක මුදල රොසිටා ගොවිපලෙන් අයවියයුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අනුව එම මුදල පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයෙන් අයවිය යුතු මුදලක් බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ හා ගොවිපල 17 ක වසර 4 වඩා පැරණි පිළිවෙලින් රු.10,128,117 ක් හා රු.3,016,255 ක් වූ ණයගැති ශේෂ අයකර ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මහවැලි පශු සම්පත් සංවර්ධන සමාගමින් ප්‍රධාන කාර්යාලයට හා ගොවිපල 02 කට ලැබිය යුතු රු.6,261,979 ක් වසර 4 කට වඩා වැඩි කාලයක් පරිශේෂයව පැවතියදී සමාලෝචිත වර්ෂයේදී රු.3,188,202 ක් වටිනා කුකුළු පැටවුන් ණය පදනම මත එම ආයතනයට ලබා දී තිබුණි.

(ඉ) ගොවිපල 08 ක වර්ෂ 05 ට වඩා පැරණි අයනොවී පැවති කාර්යමණ්ඩල ණයගැති ශේෂය රු.319,517 ක් වූ අතර වර්ෂයකට වඩා පැරණි උත්සව/විශේෂ අත්තිකාරම් එකතුව රු.203,825 ක් විය.

(ඊ) මුදල් අඩුවීමක් ලෙස රු.53,363 ක මුදලක් කිරි ව්‍යාපෘතියේ ණයගැතියන් යටතේ දක්වා තිබූ නමුත්, ඊට හේතු හෝ ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.

(උ) බැංකුවෙන් ලබාගත් තහවුරු කිරීම්වලට අනුව කල්බදු ක්‍රමයට ලබාගත් වත්කම් ගිණුම්ගත කිරීමේදී කෙටිකාලීන වගකීම්, දිගුකාලීන වගකීම් හා වත්කම් පිළිවෙලින් රු.29,574 ක්, රු.7,355,663 ක් හා රු.7,385,237 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණු අතර මෙම වෙනසට හේතු හඳුනාගෙන නොතිබුණි.

## 2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූලනොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 371 (2) | අදාල කාර්යය නිමකළ විගස ලබාගත් අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවද, මණ්ඩලයේ නිලධාරීන් හා විවිධ ආයතන වෙත ලබා දී තිබුණු රු.2,398,229 ක අත්තිකාරම් 2014 දෙසැම්බර් 24 දින දක්වා පියවා නොතිබුණි. |
| (ආ) 2011 සැප්තැම්බර් 15 දිනැති අංක පීඊඩී 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සභාපතිවරයාට 2013 ජනවාරි සිට නොවැම්බර් දක්වා ගෙවල් කුළී දීමනා රු.330,000 ක් ගෙවා තිබුණි. |
| (ඇ) 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 මාර්ගෝපදේශ | නිකවැරටිය ගොවිපලේ නව අලෙවිසැල ඉදිකිරීමේ ඇස්තමේන්තු ගත වටිනාකම අනුව ඒ සඳහා අමාත්‍යංශ සුළු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගතයුතු වුවත්, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව මෙම ඉදිකිරීමේ කාර්යයන් කොටස් කර කලාපීය සුළු ටෙන්ඩර් මණ්ඩල නිර්දේශය මත ඉදිකිරීම් සිදුකර තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගොවිපල 08 ක් විසින් ඇස්තමේන්තු මුදල වූ රු.140,912,713 ක් ඉක්මවා රු.73,240,622 ක් විවිධ කාර්යයන් සඳහා වියදම් කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,096,836 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.26,294,245 වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.24,197,409 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. පරිපාලන වියදම් රු.42,452,480 කින් වැඩිවීම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

ආයතනය විසින් ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් පැහැරහැරීම සම්බන්ධයෙන් බාහිර ආයතන දෙකකට එරෙහිව රු.14,040,395 ක වන්දියක් ඉල්ලා 2011 හා 2012 වර්ෂවලදී අධිකරණවල නඩු දෙකක් ගොනුකර තිබුණු අතර, බාහිර පුද්ගලයින් දෙදෙනෙක් හා මණ්ඩලයේ සේවකයින් 10 දෙනෙකු විසින් සේවය අත්හිටුවීමට එරෙහිව හා ලබාදී තිබෙන අධිකරණ තීරණවලට එරෙහිව නඩු 12 ක් 2001 හා 2013 වර්ෂවලදී ගොනුකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කිරි බෙදාහැරීමේ ව්‍යාපෘතිය යටතේ කිරි අලෙවි කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය මගින් අලෙවිසැල් 116 ක් පවත්වාගෙන ගොස් තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අලෙවිසැල් සංඛ්‍යාව 50 ක් විය. මින් අලෙවිසැල් 16 ක් රු.1,775,671 ක අලාභයක් හා අලෙවිසැල් 34 ක් රු.17,685,720 ක ලාභයක් වාර්තාකර තිබුණි.

(ආ) මණ්ඩලයට අයත් ගොවිපල 15 කින් සමාලෝචිත වර්ෂයේදී රු. 160,334,263 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණු අතර එයින් ගොවිපල 12 ක් 2008 වර්ෂයේ සිටම අලාභ ලබමින් පැවතුණි. කෙසේ වුවද එම ගොවිපලවල් ලාභ ලබන තත්ත්වයට පත්කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඇ) මණ්ඩලයට අයත් මුළු වරලත් අලෙවිසැල් 111 න් අලෙවිසැල් 17 ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර, සමාලෝචිත වර්ෂයේ වරලත් අලෙවිසැල් ව්‍යාපෘතියේ ශුද්ධ අලාභය රු.1,049,282 ක් විය.

6

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හා ඉඩම් කොමසාරිස් කාර්යාලය සතු පිළිවෙලින් හෙක්ටයාර් 2,887.7 ක් හා 9,728.6 ක් නීත්‍යානුකූල පවරා ගැනීමකින් තොරව මණ්ඩලය විසින් පරිහරණය කරනු ලබන අතර එම ඉඩම් මණ්ඩලයේ වත්කමක් ලෙස 2011 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) වෙලාඬ ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාගෙන තිබුණු රු.1,682,727,540 (US$12,944,058)ක ණය මුදල ආපසු ගෙවීමේ සැලැස්මක් සකස්කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 2012 නොවැම්බර් 06 දිනැති අංක DE/AUS/06 දරන ලිපිය අනුව 2013 මාර්තු 08 දිනට පෙර හෝ එදින සිට ණය ආපසු ගෙවීම ආරම්භ කළයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද කිසිදු මුදලක් ආපසු ගෙවා නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය වත්කම්**

ක්‍රියාත්මක නොවන කන්තලේ බඩ ඉරිඟු ව්‍යාපෘතියට අයත් බැංකු ගිණුම් 03 ක් 2010 වර්ෂයේ සිට අක්‍රියව පැවති අතර, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ශේෂය රු.885,470 ක් විය.

**4.4 හඳුනාගන්නා ලද පාඩු**

මණ්ඩලය සතු ගොවිපල 30 ක සිටින සතුන්ගේ උපත් හා මරණ පිළිබඳව තොරතුරු අවස්ථා දෙකකදී මණ්ඩලයේ සභාපතිවරයාගෙන් ඉල්ලුම් කළද ගොවිපල 25 ක තොරතුරු පමණක් ලබාදී තිබුණි. එම ගොවිපල 25 හි රු.12,675,820 ක් වටිනා එළ ගවයින් හා මී ගවයින් 1,071 ක් මියගොස් තිබුණි.

**4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

කන්තලේ සීනි සමාගමට අයත් උක් වගා භූමියෙන් අක්කර 1,000 ක ප්‍රමාණයක් නියමු ව්‍යාපෘතියක් ලෙස බඩඉරිඟු වගා කිරීමට මණ්ඩලයට තාවකාලිකව ලබාදීමටත් ඒ සඳහා චක්‍රීය අරමුදලක් ඇති කිරීමටත් ඉඩමේ උක් වගාව සඳහා සුදුසු ව්‍යවසායකයකු තෝරාගත් විට චක්‍රීය අරමුදලේ ඉතිරි මුදල් මහා භාණ්ඩාගාරයට යොමු කිරීමටත් යටත්ව 2007 ජූනි 28 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයක් ගෙන තිබුණි. චක්‍රීය අරමුදල සඳහා රු.මිලියන 37.5 ක් නැගෙනහිර නවෝදය යටතේ මණ්ඩලයට ලබා දී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීම නිසා ඉඩම 2011 සැප්තැම්බර් 01 දින සමාගමට නැවත පවරා තිබුණද චක්‍රීය අරමුදලේ එදිනට පැවති රු.17,549,341 ක මුදල භාණ්ඩාගාරයට නොයවා 2013 දෙසැම්බර් 31 දක්වාම මණ්ඩලය විසින් රඳවාගෙන තිබුණි.

**4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

නිකවැරටිය ගොවිපලේ අලෙවිසැල රු.9,078,084 ක් වැයකර ඉදිකර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කොන්ත්‍රාත්තුවට අදාල ටෙන්ඩර් මණ්ඩල තීරණ විගණනයට ඉදිරිපත් නොවූ අතර, 2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9 ප්‍රකාරව ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද මේ සම්බන්ධ වූ ගෙවීම් ඉංජිනේරුවරයෙකු සහතික කර නොතිබුණි.

(ආ) ඉදිකිරීමේ කොන්ත්‍රාත් වටිනාකම රු.6,064,321 වුවද රු.3,013,763 ක් වූ අතිරේක වැඩ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) මාර්ගෝපදේශ 5.4.4 ප්‍රකාරව සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයක් දක්වා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගෙවිය හැකි නමුත් එම සීමාව ඉක්මවා රු.6,319,900 ක් එනම් සියයට 87 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 602 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 486 ක් විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළ වන ජ්‍යෙෂ්ඨ හා ද්විතියික මට්ටමේ තනතුරු පිළිවෙලින් 20 ක් හා 52 ක් සහ තෘතියික මට්ටමේ තනතුරු 44 ක්ද පුරප්පාඩුව පැවතුණි.

(ආ) බඳවා ගැනීමේ කාර්යය පරිපාටියට අනුව සහකාර කළමනාකරු (අභ්‍යන්තර විගණක) තනතුරට අදාල සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණු වයස අවුරුදු 60 ඉක්මවා තිබුණු නිලධාරියෙකු කළමනාකරු (අභ්‍යන්තර විගණක) ලෙසද, වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් දෙදෙනෙකු මණ්ඩලයේ උපදේශක වරුන් ලෙසද සේවයේ යොදවාගෙන සමාලෝචිත වර්ෂයේදී රු.760,750 ක් ගෙවා තිබුණු නමුත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් පත්කළ ගැටළු විසඳා ගැනීමේ කමිටු නිර්දේශය අනුව 2011 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිලධාරීන් 36 දෙනෙකු සඳහා නව වැටුප් සංශෝධනයක් සිදුකර තිබුණි.

8

## 5. ශිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණු ගොවිපල 16 ක ක්‍රියාකාරකම් 76 ක ඉලක්කයන් හා වාර්ෂික ප්‍රගති සමාලෝචන වාර්තාවෙහි දක්වා තිබුණු එම ඉලක්කයන් අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය. එම නිසා වාර්ෂික කාර්යසාධනය ක්‍රියාකාරී සැලැස්මට අනුව පරීක්ෂා කිරීමට අපහසු වී තිබුණු අතර, පරීක්ෂා කරන ලද තොතුරු අනුව ගොවිපල 14 ක ක්‍රියාකාරකම් 54 ක කාර්යසාධනය ඉලක්කගත වටිනාකමින් සියයට 50 කට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ගොවිපලවල් 14 ක ක්‍රියාකාරකම් 22 කට අදාළව ප්‍රගති සමාලෝචන වාර්තාවේ ඉලක්කගත සංඛ්‍යා අඩුවෙන් දක්වා තිබුණු අතර, එම ඉලක්කයන් ද සමාලෝචිත වර්ෂයේදී ඉටුකර නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

2013 වර්ෂය සඳහා සකස්කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ඊට අනුකූලවද කටයුතු කර නොතිබුණි.

### 5.3 අයවැය පාලනය

අයවැය දත්ත හා තථ්‍ය දත්ත අතර විචලනයේ ප්‍රතිශතය සියයට 08 සිට සියයට 561 දක්වා වූ අතර, 2013 වර්ෂයේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කර නොතිබියදී වැය විෂයයන් 34 ක් සඳහා රු. 66,394,469 ක වියදමක් ප්‍රධාන කාර්යාලයෙන් හා ව්‍යාපෘති මඟින් දරා තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

9

## 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රිදීයගම ගොවිපලෙන් අක්කර 150 ක් 2001 වර්ෂයේදී පුද්ගලයින් 98 දෙනෙකු විසින් අනවසර වගා කටයුතු සඳහා අත්පත් කරගෙන තිබුණු අතර ඔවුන් ගොවිපලෙන් ඉවත් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ආ) 1992 වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු පොලී රහිත රු.50,000,000 ක ණය මුදල සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් මණ්ඩලයේ විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) අයවැය පාලනය
(ආ) ස්ථාවර වත්කම්
(ආ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඇ) ණයගැති හා ණයහිමි පාලනය
(ඇ) මෙහෙයුම් කළමනාකරණය
(ඉ) මූල්‍ය කළමනාකරණය
(ඊ) කාර්යමණ්ඩල පරිපාලනය

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

10

# මූල්‍ය වාර්තා සඳහා හැඳින්වීම

## පූර්විකාව

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත (SLFRS/LKAS) ප්‍රකාශයට පත් කිරීමත් සමගම 2012 ජනවාරි 01 වන දා සිට බල පැවැත්වෙන පරිදි ශ්‍රී ලංකාවෙහි ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත (IFRS) අනුගමනය කිරීම ආරම්භ විය. ජාතික පශු සම්පත් මණ්ඩලය ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කරණ ප්‍රමිතීන්ට අනුකූල ව කටයුතු කළ යුතු නිරූපිත ව්‍යවසායක් වන බැවින්, ජාතික පශු සම්පත් මණ්ඩලය 2013 වසරේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා මෙකී ප්‍රමිතීන් පිළිගෙන ඒ අනුව කටයුතු කර ඇත.

## 1. හැඳින්වීම

1972 අංක 11 දරණ කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (ජා. ප. ම.) 1973 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. එහි ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කරන ලද්දේ 1974 වර්ෂයේ දීය.

මෙය පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා ගුණාත්මක අභිජනන ද්‍රව්‍ය, පශු සම්පත් හා කෘෂි නිෂ්පාදන නිපදවන ශ්‍රී ලංකාවේ හොඳම ස්ව පැවැත්මක් ඇති ආයතනය බවට පත්වීම වශයෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ දැක්ම හඳුනාගෙන ඇත. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළවල් සහ එහි වතු සහ අනෙකුත් දේපළවල් දිවයිනේ සෑම ප්‍රදේශයක ම පාහේ විසිරී පැතිරී ඇත.

**මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහතින් දැක්වේ**

- පශු සම්පත් අභිජනනය හා සංවර්ධනය
- බෝ කිරීම සඳහා හොඳ තත්ත්වයේ සතුන් සාධාරණ මිළකට ගොවින්ට නිකුත් කිරීම
- උපරිම ලාභයක් ඉපයීම සඳහා ප්‍රශස්ථ මට්ටමින් පොල් වගාව පවත්වා ගෙන යාම
- හැකියාව ඇති ස්ථානවල පශු සම්පත් හෝග ඒකාබද්ධ ගොවිපලවල් ක්‍රියාත්මක කිරීම
- ගොවින්ට පාසැල් සිසුන්ට කෘෂි කර්මාන්තයේ නියැලි නිලධාරීන්ට සහ විශේෂයෙන් කුඩා පරිමාණයේ සතුන් ඇති කරන්නන් හට පුහුණු වැඩ සටහන් හා ප්‍රදර්ශණ පැවැත්වීම
- සාධාරණ මිළකට හොඳ තත්ත්වයේ ගොවිපල නිෂ්පාදන සැපයීම සඳහා අලෙවිසැල් ස්ථාපනය කිරීම හා පවත්වාගෙනයාම
- ඉහළ ලාභ පරතරයක් ලබාගැනීම සඳහා ගොවිපලවල නිෂ්පාදිත අමුද්‍රව්‍ය භාවිතාකරමින් වටිනාකම එකතුකරන ලද භාණ්ඩ නිපදවීම
- ජනතාව අතර නැවුම් එළකිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා ජනතාවට නැවුම් එළකිරි අලෙවි කිරීම

### 1.1 වත්මන් මූල්‍ය ප්‍රකාශණවල වගකීම

1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (1) ඡේදය යටතේ සහ 1972 අංක 25 දරණ රාජ්‍ය කෘෂිකාර්මික පනතේ 25 ඡේදය යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීමට බැඳී සිටියි. 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් කරණ හා විගණන ප්‍රමිත පනතේ 13 (1) ඡේදය යටතේ මණ්ඩලය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත අනුව මූල්‍ය වේ. එම පනතේම 5 ඡේදය යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත නිකුත් කරනු ලැබේ. එම පනත යටතේම 5 වන ඡේදයේ උප ලේඛණ අනුව "භාණ්ඩ විකිණීමේ හෝ සේවා සැපයීමේ යෙදී සිටින රාජ්‍ය සංස්ථා" නිරූපිත ව්‍යාපාර ව්‍යවසායන් වශයෙන් දක්වා ඇත. එබැවින් 2012 ජනවාරි පළවන දින සිට බල පැවැත් වෙන පරිදි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කොට ඉදිරිපත් කිරීම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අනිවාර්ය වී ඇත.

ජාත්‍යයන්තර මූල්‍ය වාර්තා කරණ ප්‍රමිතවලට (IFRS) මාරුවීමේ අරමුණු වනුයේ

- ඉහළ කාර්ය සාධනයක් හා ද්‍රවශීලී මූල්‍ය වෙළඳ පොළක් ඇති කිරීම
- වඩාත් ඉහළ විනිවිදභාවයක් තුළින් ව්‍යාපාර ඇගැයීමට පහසුකම් සැපයීම

මූල්‍ය ප්‍රකාශණ වල සැසඳිය හැකි භාවය හා විනිවිදභාවය නිශ්චය කොට එමගින් ආකෘති වලට වඩා අඩංගු දේ ගැන අවධාරණය කරමින් පරිශීලිකයන්ට දැනට වඩා වැඩි විස්තරාත්මක තොරතුරු සපයමින් කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළඳ පොළක් සහතික කර ගැනීම සඳහා ජාත්‍යයන්තර මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත ගෝලීය වශයෙන් පිළිගෙන ඒ අනුව කටයුතු කිරීම අවශ්‍ය යැයි සැලකුණි. ජාත්‍යයන්තර මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත (IFRS) ලොව පුරා සීඝ්‍රයෙන් ප්‍රචලිත වෙමින් පවතී. යුරෝපා සංගමය 2005 වසරේ දී සිය සමාගම් කිහිපයට මෙම ප්‍රමිත අනුගමනය කළ යුතු බවට නියෝග කළ දින පටන් අන් රටවල් ද මෙම ප්‍රමිත අනුගමනය කිරීමට පටන් ගෙන තිබේ. නිදසුනක් වශයෙන් ඔස්ට්‍රේලියාව නවසීලන්තය සහ ඊශ්‍රාලය ද IFRS අනුව දැනටමත් කටයුතු කර ඇත. වසර 2011 පටන් කැනඩාව සහ ජපානය ද මෙම ප්‍රමිත බලාත්මක කර ඇත. අතිරේක රට වල් ද IFRS අනුව කටයුතු කිරීමට සැලසුම් කරමින් සිටී.

### 1.2 මෙම වාර්තාවේ අරමුණ

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සිය මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත (SLFRS) වලට පරිවර්තනය වීමේ දී අනුගමනය කළ ක්‍රියා මාර්ග සැකවින් මෙම වාර්තාවෙන් විස්තර කෙරේ. පළමුව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත (SLFRS) සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS) ලැයිස්තු ගත කර ඇත. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අදාළ නොවන ප්‍රමිතීන් වෙනම ලේඛණ ගත කොට ඇත .

ඉන්පසු එක් එක් ප්‍රමිතයන් හි උපයෝගී කර ගත හැකියාව පිළිබඳව සාකච්ඡා කෙරේ. අනතුරුව ගිණුම් කරණ ප්‍රතිපත්තීන් වලට ඇති විය හැකි වෙනස්කම් හා එමගින් ඇති වෙන්නා වූ මූල්‍යමය බලපෑම ද පරීක්ෂා කෙරේ. මෙම වාර්තාවේ ඉස්මතු කරන ලද හෝ සාකච්ඡා කරන ලද කරුණු අනුව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කළමණාකාරිත්වය විසින් වසර 2013 හි දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත ී:බ්‍යිෂී* අනුව මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කොට ඉදිරිපත් කිරීම කරනු ලැබේ.

## 1.3 ඉදිරියේ දී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිතීන් (SLFRS) යොදා ගැනීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කළමණාකාරිත්වය විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිතීන්/ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ී(බ්‍යිෂීරථබණී* උපයෝග කරගනිමින් මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කොට ඉදිරිපත් කිරීම දිගටම කරනු ඇත. පෙර පැවැති ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිතීන් හෝ පොදුවේ පිළිගත් ගිණුම් කරණ මූල ධර්ම ී:ඛී දර ය්ඡ* යටතේ කෙරුණු ගණුදෙණු වල බලපෑම් පිළිබඳව තක්සේරුවක් කිරීමට අවශ්‍ය වන්නේ ද නැත.

බොහෝ අයිතම වල සාධාරණ වටිනාකම් මිණුම්කරණය පිළිබඳව සම්මුතියක් නැතත් අද ලොව පුරා ඇතතේ සාධාරණ වටිනාකම් උපයෝග කරගනිමින් ගිණුම් පිළියෙල කිරීමේ ප්‍රවනතාවයයි. විශ්‍රාම ප්‍රතිලාභ සහ අනෙකුත් අදාළ ගෙවීම් වල ආයුගණක වටිනාකම තක්සේරු කිරීමට මණ්ඩලය සූත්‍ර ක්‍රමය දිගටම භාවිතා කරනු ඇත.

# මූල්‍ය වාර්තා සඳහා හැඳින්වීම

## 2. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිතීන් (SLFRS) වලට පරිවර්තනය වීමේ වැදගත් අංගයන්

### 2.1 ජීව විද්‍යාත්මක වත්කම්

**ජීව විද්‍යාත්මක වත්කම් යනු කවරේ ද?**

ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 41 අනුව ජීව විද්‍යාත්මක වත්කමක් යනු ජීවත්වන සත්වයෙකු හෝ පැලයකි. කෘෂිකාර්මික පරිසරයක දී, ජීව විද්‍යාත්මක වත්කමක වැඩීම සහ මේරීම පාලනය කරනු ලබන ක්‍රියාවලි තුලින් ජීව විද්‍යාත්මක වත්කම් වල නිෂ්පාදනය, විකිණීම හෝ අතිරේක වත්කම් බවට පරිවර්තනය වීම සිදු කෙරේ. යන්ත්‍ර සූත්‍ර වැනි සම්ප්‍රදායික නිශ්චල දේපළ වලට හාත් පසින්ම වෙනස් ලෙසට ජීව විද්‍යාත්මක වත්කම් නිරන්තරයෙන් කාලයත් සමග වෙනස් වීමට භාජනය වනුයේ ඔවුන් ගේ වර්ධන චක්‍රය අනුව ජීව විද්‍යාත්මක පරිනාමය, වැඩීම, පරිහානිය, නිෂ්පාදනය හා ප්‍රජනන යන ක්‍රියාවලි නිසාය, ජීව විද්‍යාත්මක වත්කම් වල සිදුවන වෙනස්කම් විවිධාකාර විය හැකි අතර ඒවා සලකුණු කොට පරීක්ෂා කිරීම ද දුෂ්කර වන්නේ ඔවුන් ගේ වර්ධන චක්‍රයට කාලගුණය, වැඩීමේ ස්වාභාවික ප්‍රතිඵල, රෝග, වත්කම් පිළබඳ පාලනය සහ පාරිසරික තත්ත්වයන් යනාදිය ද බලපාන බැවිනි.

**ජීව විද්‍යාත්මක වත්කම් අගය කරනු ලබන්නේ කෙසේද?**

ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 41 අනුව සාමාන්‍ය තත්ත්වයන් යටතේ ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ වටිනාකම විශ්වාසදායි ලෙස තීරණය කළ හැකි බවට විශ්වාස කෙරේ. සමහර ජීව විද්‍යාත්මක වත්කම් වර්ග වල (සතුන් සහ මත්ස්‍යයන්) සඳහා එම සතුන්ම සඳහා නොවුනත් ඒ හා සමාන ජීව විද්‍යාත්මක වත්කම් සඳහා වෙළඳ පොළක් පවතින අතර මෙම වෙළඳ පොළවල් වල පවතින මිල ගණන් බොහෝ විට මෙම ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ වටිනාකම තීරණය කිරිමෙහි ලා පදනමක් වනු ඇත. වෙළඳ පොළ මිල ගණන් නොමැති අවස්ථා වල දී සාධාරණ වටිනාකම තීරණය කිරීම සඳහා මිණුම් ලකුණු සහ වත්කමෙන් අපේක්ෂිත ශුද්ධ මුදල් ප්‍රවායෙහි වර්තමාන අගය වැනි අනෙකුත් පිළිගත් ක්‍රමවේදයන් භාවිතා කෙරේ. සාධාරණ වටිනාකම විශ්වාසදායි ලෙස තීරණය කළ නොහැකි සමහර අවස්ථා ද ඇත. එවැනි අවස්ථාවල ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 41 යෝජනා කෙරෙනුයේ ඓතිහාසික පිරිවැය ක්‍රමය දිගටම භාවිතා කරන ලෙසයි.

**වෙළඳ පොළ ප්‍රවේශය**

ජීව විද්‍යාත්මක වත්කම් සඳහා සක්‍රිය වෙළඳ පොළක් පවති නම් එම ජීව විද්‍යාත්මක වත්කම් වල වටිනාකම වඩාත් විශ්වාසදායි ලෙස මිණුම්කරණය කල හැක්කේ එකී වත්කම් භාවිතා කිරීමට හෝ විකිණීමට යොදා ගනු ලබන ස්ථානයේ පවතින වෙළඳපොළ මිල ගණන්ය. වෙනස් වර්ග සහ උප වර්ග වලට අයත් ජීව විද්‍යාත්මක වත්කම් පවතී නම් එම වර්ග සහ උප වර්ග නිසි ලෙස හඳුනා ගැනිම වැදගත් වේ. එකම වර්ගයෙහි උප වර්ග වල වෙළඳ පොළ මිල ගණන් වෙනස් විය හැක. නියාමක, ප්‍රවාහන හෝ ඍතුමය හේතුන් නිසා වෙනස් වුණු වෙළඳ පොළ පරිසරයෙහි තත්ත්වයන් හේතු කොට ගෙන එකම ජීව විද්‍යාත්මක වත්කමෙහි හෝ කෘෂිකාර්මික නිෂ්පාදනයෙහි වටිනාකම් වෙනස් විය හැකි තත්ත්වයන් උදා විය හැක. ජීව විද්‍යාත්මක වත්කම් වලට මිල ගණන් යෝජනා කරනු හැරුණු කොට වටිනාකම තක්සේරු කෙරෙන දිනට ප්‍රමානය ද තීරණය කල යුතුය. තව ද ජීව විද්‍යාත්මක වත්කම් වල අයිතිකරු එම වත්කම් සම්බන්ධයෙන් නිසි තොරතුරු අඩංගු ලේඛණ තබා ගැනීම සහ සාධාරණ පාලනයක් සමග නඩත්තු ක්‍රියා පිළවෙලක් යොදා ගෙන තිබීම ද වැදගත්වේ. ජීව විද්‍යාත්මක වත්කම් වල ප්‍රමානය පිළිබඳව පදනමක් ඇති කිරීම සඳහා තොරතුරු භාවිතා කිරීමට පෙර තොරතුරු වල අවංක භාවය හා විශ්වාසනීය භාවය නිශ්චය කර ගැනීම පිණිස පරීක්ෂණ කටයුතු , ක්‍රියා දහමයන් තහවුරු කර ගැනීම් සහ නොයෙකුත් නියදීයන් විශ්ලේෂණ කටයුතු යනාදිය කරනු ලැබේ.

**ආදායම් ප්‍රවේශය**

ජීව විද්‍යාත්මක වත්කම් සඳහා පවතින වෙළඳ පොළක් නැති අවස්ථාවල දී මෙම වත්කම් වල වටිනාකම් අගය කිරීමේ විකල්ප ප්‍රවේශයක් වශයෙන් ආදායම් ප්‍රවේශය යොදා ගත හැකිය. ජීව විද්‍යාත්මක වත්කමක් අගය කිරීම සඳහා ආදායම් ප්‍රවේශය යොදා ගැනීමේ දී වටිනාකම රඳා පවතින්නේ මෙකී වත්කමෙන් ලැබීමට අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ වල වර්තමාන අගය මතය. විශ්වාසනීය සහ සාධාරණ ප්‍රතිඵල අත්පත් කර ගැනීම පිණිස මෙම ප්‍රවේශයේ දී ඔවුන් ගේ භෞතික සහ ජීව විද්‍යාත්මක විශේෂ ලක්ෂණ පිළිබඳව මනා අවබෝධයක් අවශ්‍ය කෙරේ. මෙම ගති ලක්ෂණ හා බාහිර සාධකයන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇතිකරන බැවින්, සමාලෝචනයට භාජනය වී ඇති වත්කමේ ජීව විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව විශේෂඥ උපදෙස් සහය ලබා ගැනීම තුලින් වටිනාකම තක්සේරු කිරීමේ කාර්යයේ දී මහඟු උපකාරයක් වනු ඇත. උදාහරණයක් වශයෙන් පහත සඳහන් වනුයේ ව්‍යාපාර අවශේෂ ක්‍රමය නැමැති වටිනාකම තක්සේරු කිරීමේ එක් ක්‍රම වේදයකි. මෙම ක්‍රමය යටතේ ජීව විද්‍යාත්මක වත්කම් වලින් ලබාගත් මෙහෙයුම් වල වටිනාකම තීරණය කෙරේ. ඉන්පසු මෙහෙයුම් වල වෙළඳ පොළ වටිනාකමෙන් ඉඩම් උපකරණ හා යන්ත්‍ර සූත, අනෙක් වත්කම්, (වර්ග නාම) වැනි හඳුනාගත හැකි අස්පෘශ්‍ය වත්කම් වල වටිනාකම අඩු කරනු ලබයි. ඒ අනුව ලැබෙන අවශේෂ වටිනාකම ජීව විද්‍යාත්මක වත්කමේ වෙළඳ පොළ වටිනාකම වශයෙන් වෙන් කල හැකිය.

**නිගමනය**

ආයතනයක ජීව විද්‍යාත්මක වත්කම් වල සහ අනෙක් අස්පෘශ්‍ය වත්කම් වල සාධාරණ වටිනාකම ප්‍රමාණවත් ලෙස පිළිබිඹු වනවා ද යන්න නිශ්චය කර ගැනීම සඳහා නව ගිණුම් කරණ ප්‍රමිතීන් හඳුන්වා දී අවස්ථාවක, මෙම වත්කම්වල වටිනාකම තක්සේරු කිරීමේදී මතු විය හැකි අනන්‍ය ගැටළු සහ අභියෝග

ගැන අපි සියළු දෙනාම සැලකිලිමත් විය යුතුය. විශ්වාස කළ හැකි ප්‍රතිඵල හා විශ්වාසනීය වටිනා මතයන් නිශ්චය කරගැනීම සඳහා පළපුරුද්ද, ප්‍රවිනතාවය සහ ස්වාධීනත්වය යන ප්‍රධාන ගුණාංගයන් අවශ්‍ය කෙරේ.

## 2.2 ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ වටිනාකම මිණුම්කරණය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ වටිනාකම පහත සඳහන් නිර්නායකයන් මත මිණුම්කරණය කර ඇත.
1. කුකුළන් හැර අනෙක් සතුන්
උදාහරණ: ගවයින්, මී ගවයින්

පහත සඳහන් කරුණු පදනම් කරගෙන අභිජනනය සඳහා වූ සතුන් මණ්ඩලීය චක්‍රලේඛ අනුව ප්‍රමිති මිල ගණන් යටතේ තක්සේරු කොට ඇත.

1. ජීව බර
2. කිරි මුර ප්‍රමාණය
3. කිරි නිෂ්පාදනය
4. ගැබ් බර
5. ප්‍රවේනි/ ජාන අගය

**අනෙක් සතුන්**
ජීව බර ප්‍රවේණි / ජාන අගය හා ගැබ්බර බව පදනම් කරගෙන බැටළුවන් එළුවන් ඌරන් හා හාවුන් ප්‍රමිති මිල ගණන් යටතේ තක්සේරු කොට ඇත.

සියළුම රැලට නුසුදුසු සතුන් බර පදනම් කරගෙන ප්‍රමිති මිල ගණන් යටතේ තක්සේරු කර ඇත.

**(ii) අභිජනන හා වාණිජමය කුකුළන්**

(අ) බිත්තර දමන කාණ්ඩය (බිත්තර දැමීම ආරම්භ වූ පසු)
පැටවුන්ගේ මිල හා විකිණීම සඳහා බිත්තර ලබා ගැනීමට ඇති කිකළියන්ගේ බිත්තර දැමීම ආරම්භය දක්වා වියදම, බිත්තර දැමු කාලය අදළ කොටස ලියා හැරීමෙන් පසුව ඉතිරිය දක්වා ඇත.

(ආ) අභිජනන හා වාණිජමය බිත්තර ලබා ගන්නා වැඩෙන කුකුළ් කාණ්ඩ (බිත්තර දැමීම ආරම්භයට පෙර)

නියමිත දින දක්වා මෙම කාණ්ඩ සඳහා දරන ලද වියදම සත්‍ය පිරිවැය වශයෙන් තක්සෙරු කර ඇත

**(iii) අභිජනන බිත්තර (රක්කන බිත්තර)**
පහත සඳහන් සූත්‍රය භාවිතා කරමින් අභිජනන බිත්තර පිරිවැය මත තක්සෙරු කර ඇත.

මුළු පිරිවැය, දෙසැම්බර් මාසයේ හැකි නිෂ්පාදිත බිත්තර ප්‍රමාණයෙන් බෙදීම

සත්ව ආහාර වල පිරිවැය ඍජු වේතන හා ක්ෂයවීම ඇතුලත් පොදු වියදම මෙහි සඳහන් කර ඇති මුළු පිරිවැය යන්නට ඇතුලත්ය.

**(iv) වාණිජමය බිත්තර**
අලෙවි සැලෙහි උපලබ්ධි වූ මිලට වාණිජමය බිත්තර තක්සේරු කර ඇත.

**(v) නොමේරූ බ්‍රොයිලර් සහ ලේයර් තොග**
එදිනට දරන ලද පිරිවැය මත තොග අගය කර ඇත.

**(vi) ශීත කාමරවල ඇති බ්‍රොයිලර්**
උපලබ්ධි වූ මිලට ශීත කාමරවල ඇති බ්‍රොයිලර් අගය කර ඇත.

**(vii) පොල් හා කෘෂි නිෂ්පාදන**
උපලබ්ධි වූ මිලට පොල් හා කෘෂි නිෂ්පාදන තොග අගය කොට ඇත.

**(viii) පොල් කටු අඟුරු**
උපලබ්ධි වූ මුදලෙන් 50% ක වටිනාකමට පොළව යට ඇති පොල් කටු අඟුරු අගය කොට ඇත.

**(iX) අනෙක් තොග**
අවම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට අනෙක් තොග අගය කොට ඇත.

## 2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වීම් ක්ෂය කිරීම්

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ක්ෂය කිරීම් සම්බන්ධව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම ක්‍රමය (GAAP) යටතේ වත්කමක් වෙනුවෙන් ක්ෂය කිරීම් එම වත්කම අත්පත් කළ කාල ය තුළ දී නොකරන අතර වත්කම බැහැර කළ වසරේ වත්කමට අදාළ සම්පූර්ණ ක්ෂය අගය සැලකිල්ලට ගෙන ගිණුම් තැබීම කරන ලදී.

මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා මුල්‍ය වාර්තා කරණ ප්‍රමිතීන්/ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/LKAS) යටතේ නොගැළපෙන බැවින් වත්කම භාවිතා කල දින සිට අදාළ ක්ෂය කිරීම් කිරීමේ ක්‍රමවේදයකට ගිණුම් ප්‍රතිපත්ති මාරු කිරීමට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය තීරණය කර ඇත.

# මූල්‍ය වාර්තා සඳහා හැඳින්වීම

මුළු වත්කම් වල වටිනාකම රුපියල් බිලියන 1.6 ක් පමණ වන විශාල ආයෝජන ව්‍යාපෘතියක් වන ශ්‍රී ලංකා කිරිපට්ටි සංවර්ධන ව්‍යාපෘතිය 2013 වසරේ එහි ක්‍රියාකාරකම් කඩිනම් කිරීම ආරම්භ කළ අතර මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් වල සැලකිය යුතු අදායම් මෙම වසරේ අග භාගයේ ලැබීමට නියමිත වන බැවින් මෙහි වත්කම් 2014 වසරේ සිට ක්ෂය කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. පසු ගිය වසරේ ව්‍යාපෘතියේ මෙහෙයුම් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොවූ බැවින් ව්‍යාපෘතියේ වත්කම් ක්ෂය කිරීමට භාජනය නොකරන ලද අතර 2014 වසරේ සිට මෙහි වත්කම් ක්ෂය කිරීම ඥානාන්විත බව ප්‍රතිපත්තියක් වශයෙන් මණ්ඩලය තීරණය කර තිබේ.

### 2.4 සේවක ප්‍රතිලාභ - ආයුගණක වටිනාකම තක්සෙරු කිරීම

**සේවක ප්‍රතිලාභ**

**අ) නිර්වචිත දායක සැලසුම් - සේවක අර්ථ සාධක/සේවා නියුක්තිකයන්ගේ අරමුදල**

නිර්වචිත දායක සැලසුම් යනු පශ්චාත් සේවා සැලසුමක් වන අතර අස්තිත්වයක් විසින් ස්ථිර දායක මුදලක් වෙනත් අස්තිත්වයක් වෙත ගෙවනු ලැබේ. එමගින් තවදුරටත් කිසිම නෛතික හෝ වෙනත් ගෙවීමක් කිරීමට සිදු නොවේ. සේවකයින් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් වියදමක් වශයෙන් වියදම සිදු වූ කාලවකවානුවේ හඳුනාගෙන ආදායම් ප්‍රකාශයේ පෙන්වනු ලබයි.ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සෙවකයින් ගේ මුළු ඉපයීමෙන් 15% ක් හා 3% ක් පිළිවෙළින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක වේ.

**ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්**

නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිර්වචිත දායක සැලසුමක් හැර පශ්චාත් සේවා සැලසුමකි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 16- සේවක ප්‍රතිලාභ අනුව නිර්වචිත ප්‍රතිලාභ ගණනය කරනු ලබන්නේ එම ගිණුම් ප්‍රමිතය විසින් අවසර දී ඇති පාරිතෝෂික සූත්‍රයක් උපයෝගි කර ගනිමින් ය.

විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ සඳහා සේවකයෙකු සේවයට බැඳුනු පළවන සේවා වසරේ සිට සියළු සෙවකයින් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ^LKAS) 16- සේවක ප්‍රතිලාභ අනුව වෙන් කිරීම් කර ඇත. කෙසේ වෙතත් 1982 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයෙකු වෙනුවෙන් වගකීම එළඹෙනුයේ සේවකයෙකු වසර පහක අඛණ්ඩ සේවාවක් සම්පූණ කල විට දී පමණය.

පාරිතෝෂික ගෙවීම් සඳහා ගණනය කිරීම් කරන ලද්දේ එක්ෂෙල් වර්ක්ෂීට් වල සූත්‍ර ක්‍රමය භාවිතා කරමින්ය. පහත සඳහන් උප කල්පනයන් භාවිතා කරමින් එක්ෂෙල් වර්ක්ෂීට් 10 ක විස්තර දක්වා ඇත.

නොකඩ වා පැවැතීම : ජා.ප. ස. සං.මණ්ඩලය අඛණ්ඩව පවතින ආයතනයක්

| | |
|---|---|
| පොලී ප්‍රතිශතය | 11.5% |
| වැටුප් වර්ධක ප්‍රතිශතය | 5.5% |
| විශ්‍රාමික වයස | අවු 55 |
| සේවක පිරිවැටුම් ප්‍රතිශතය | 1.0% |

ගණනය කිරීම් වල සාරාංශයක් ඊ ළඟ පිටු දෙකෙ හි දක්වා ඇත.

## පාරිතෝෂික ගණනය - සාරාංශය -2013

| | ආරම්භක වෙන්කිරීම් | වසර සඳහා වන වියදම | පොළිය | කරන ලද ගෙවීම් | ලාභය/පාඩු | වසර අග වෙන්කිරීම් |
|---|---|---|---|---|---|---|
| 01. | 13,560,852.29 | 842,837.89 | 1,559,498.01 | (196,000.00) | 609,715.60 | 16,376,903.79 |
| 02. | 10,618,814.83 | 797,428.39 | 1,221,163.71 | (884,571.28) | (41,219.92) | 11,711,615.72 |
| 03. | 11,844,135.84 | 917,587.96 | 1,362,075.62 | (895,132.39) | 808,073.66 | 14,036,740.69 |
| 04. | 12,598,779.69 | 950,288.31 | 1,448,859.66 | (1,991,034.92) | 3,787,480.63 | 16,794,373.37 |
| 05. | 11,708,049.99 | 888,276.26 | 1,346,425.75 | (1,878,682.25) | 1,901,205.66 | 13,965,275.41 |
| 06. | 8,250,043.80 | 800,961.78 | 948,755.04 | (462,744.80) | 218,283.60 | 9,755,299.41 |
| 07. | 11,677,277.94 | 965,626.88 | 1,342,886.96 | (515,390.75) | 2,455,916.68 | 15,926,317.71 |
| 08. | 12,221,680.36 | 796,995.24 | 1,405,493.24 | (1,863,447.62) | 381,751.97 | 12,942,473.19 |
| 09. | 17,335,518.51 | 1,056,328.98 | 1,993,584.63 | (1,756,316.47) | (288,522.54) | 18,340,593.11 |
| 10. | 24,017,237.84 | 1,245,702.09 | 2,761,982.35 | (5,357,873.42) | 380,609.11 | 23,047,657.97 |
| 11. | 529,281.96 | 207,562.51 | 60,867.43 | (122,220.00) | 1,097,895.61 | 1,773,387.50 |
| | 134,361,673.04 | 9,469,596.29 | 15,451,592.40 | (15,923,413.90) | 11,311,190.04 | 154,670,637.88 |

## පාරිතෝෂික ගණනය - සාරාංශය -2013

| | ආරම්භක වෙන්කිරීම් | වසර සඳහා වන වියදම | පොළිය | ලාභය/පාඩු | වසර අග වෙන්කිරීම් |
|---|---|---|---|---|---|
| 01. | 12,315,329.33 | 737,527.22 | 1,416,262.87 | (908,267.10) | 13,560,852.29 |
| 02. | 9,466,223.02 | 694,381.54 | 1,088,615.65 | (630,405.37) | 10,618,814.83 |
| 03. | 10,631,104.51 | 787,390.05 | 1,222,577.02 | (796,935.73) | 11,844,135.84 |
| 04. | 11,305,101.00 | 809,356.49 | 1,300,086.61 | (815,764.41) | 12,598,779.69 |
| 05. | 11,708,047.92 | 809,582.65 | 1,346,425.51 | (2,156,006.10) | 11,708,049.99 |
| 06. | 7,348,821.13 | 678,608.88 | 845,114,43 | (622,500.65) | 8,250,043.80 |
| 07. | 10,448,093.57 | 775,437.28 | 1,201,530.76 | (747,783.67) | 11,677,277.94 |
| 08. | 10,963,967.66 | 769,532.91 | 1,260,856.28 | (772,676.49) | 12,221,680.36 |
| 09. | 15,861,706.91 | 924,566.30 | 1,824,096.29 | (1,274,850.99) | 17,335,518.51 |
| 10. | 22,180,977.36 | 1,179,813.20 | 2,550,812.40 | (1,894,365.12) | 24,017,237.84 |
| 11. | 401,840.34 | 109,404.90 | 46,211.64 | (28,174.92) | 529,281.96 |
| | 122,631,212.74 | 8,275,601.41 | 14,102,589.46 | (10,647,730.57) | 134,361,673.04 |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

*2013 දෙසැම්බර් 31 දායින් අවසන් වන වසර සඳහා*

| | | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| **අයභාරය** | | | |
| විකුණුම් අයභාරය | ඇමුණුම 1 | 1,284,795,684 | 1,255,973,446 |
| සාධාරණ වටිනාකමෙහි වෙනස තුළින් ඇතිවන ලාභයෙන් අඩුකළා පශුසම්පත් විකිණීමේ පිරිවැය | | 28,568,727 | 36,548,255 |
| මුළු අයභාරය | | 1,313,364,412 | 1,292,521,701 |
| විකුණුම් පිරිවැය | | (1,178,806,826) | (1,112,230,863) |
| දළ ලාභය | | 134,557,586 | 180,290,838 |
| විවිධ ආදායම | ඇමුණුම 2 | 85,033,393 | 24,613,907 |
| | | 219,590,979 | 204,904,745 |
| රජයේ ප්‍රදන | ඇමුණුම 3 | 28,293,165 | 17,606,407 |
| **අඩු කළා වියදම්** | | | |
| බෙදා හැරීමේ වියදම් | ඇමුණුම 4 | (3,790,967) | (3,838,749) |
| පරිපාලන වියදම් | ඇමුණුම 5 | (195,210,505) | (152,758,024) |
| වෙනත් වියදම් | ඇමුණුම 6 | (8,876,522) | (7,015,061) |
| මුල්‍ය පිරිවැය | ඇමුණුම 7 | (37,909,314) | (29,478,232) |
| **බදු වලට පෙර ලාභය** | | **2,096,836** | **29,421,086** |
| අඩු කළා - බදු සඳහා වෙන්කිරීම් | | - | (3,126,841) |
| **වසර සඳහා වූ ශුද්ධ ලාභය** | | **2,096,836** | **26,294,245** |
| **අනෙකුත් විස්තීර්න ආදායම** | | - | - |
| දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන කිරීමෙන් ලාභය | | - | - |
| විදේශීය මෙහෙයුම් පරිවර්තනය කිරීමේ දී විනිමය වෙනස | | - | - |
| මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට පරිවර්ථනයයේ දී ලාභය | | - | - |
| විශ්‍රාම සැලසුම් නිර්වචිත ප්‍රතිලාභ මත ආයුගණක ලාභ (අලාභ) | | 1,156,094 | (2,472,127) |
| **මුළු විස්තීර්න ආදායම** | | **3,252,930** | **23,822,118** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

*2013 දෙසැම්බර් 31 දිනට*

| | | 2013 | | 2012 | |
|---|---|---|---|---|---|
| | සටහන් | රු. | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| ජීව විද්‍යාත්මක වත්කම් | | - | | - | |
| වැවිලි | 04 | 504,614,371 | | 453,017,591 | |
| පශු සම්පත් ප්‍රාග්ධන | 05 | 990,227,456 | | 525,413,450 | |
| පශු සම්පත් ගව/එළු බැංකුව | | - | | - | |
| දේපළ, පිරියත හා උපකරණ | 06 | 1,476,531,473 | 2,971,373,300 | 1,257,127,937 | 2,235,558,978 |
| උප සමාගම්වල ආයෝජනය | 07 | 15,995,171 | 15,995,171 | 15,995,171 | 15,995,171 |
| **ජංගම වත්කම්** | | | | | |
| වෙළඳ හා අනෙකුත් තොග | 08 | 137,485,396 | | 131,708,071 | |
| පශු සම්පත් වෙළඳ | 05 | 3,476,057 | | 7,498,131 | |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 09 | 239,052,837 | | 222,587,078 | |
| තැන්පත් හා කලින් ගෙවීම් | 10 | 9,216,627 | | 14,590,217 | |
| අනෙකුත් ජංගම වත්කම් | 11 | 34,299,700 | | 30,668,674 | |
| කෙටි කාලීන තැන්පත් | 12 | 28,892,589 | | 27,165,045 | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 13 | 735,960 | | 12,463,087 | |
| | | | **453,159,167** | | **446,680,303** |
| **මුළු වත්කම්** | | | **3,440,527,638** | | **2,698,234,452** |
| **ස්කන්ධය හා බැරකම්** | | | | | |
| ගෙවන ලද ප්‍රාග්ධනය | | 576,587,649 | | 576,587,649 | |
| **ස්කන්ධයෙහි අනෙක් සංරචකයන්** | | | | | |
| ප්‍රාග්ධන සංචිත | | 143,696,928 | | 143,696,928 | |
| අයහාර සංචිත | | 44,529,422 | | 40,723,129 | |
| චක්‍රීය අරමුදල | | 37,500,000 | | 37,500,000 | |
| **රඳවා ගත් ඉපයීම්** | | 291,212,949 | | 265,460,001 | |
| | | | 1,093,526,948 | | 1,063,967,707 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| දීර්ඝ කාලීන ණය මත පොලී | 14 | 1,738,894,590 | | 1,005,039,806 | |
| පොලී රහිත ණය | 15 | 50,000,000 | | 50,000,000 | |
| විශ්‍රාමික පාරිතෝෂික | 16 | 154,251,001 | | 134,361,674 | |
| කල් බදු මත විලම්භිත ආදායම් | 17 | 42,015,493 | 1,985,161,083 | 43,015,998 | 1,232,417,477 |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 18 | 343,080,216 | | 314,665,876 | |
| කෙටි කාලීන ණය | 19 | 10,408,552 | | 77,128,115 | |
| මාස 12 තුළ ගෙවිය යුතු ණය මත ගෙවිය යුතු | 20 | 8,350,838 | 361,839,606 | 10,055,276 | 401,849,267 |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | | | **3,440,527,638** | | **2,698,234,452** |

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශණ 1971 අංක 38 දරණ මුදල් පනතේ අවශ්‍යතා අනුව අනුව පිළියෙළ කර ඇති බව මම මෙගින් සහතික කරමි.

**සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)**

මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කොට ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂවරුන් සතුවේ. මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

**සභාපති**

**නියෝජ්‍ය සභාපති**

# ස්කන්ධයෙහි වෙනස් වීම් සම්බන්ධ ප්‍රකාශණය

*2013 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා*

| | ප්‍රාග්ධනය<br>රු. | ප්‍රාග්ධන සංචිත<br>රු. | අයහාර සංචිත<br>රු. | චක්‍රීය අරමුදල<br>රු. | රඳවාගත් ඉපයීම්<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 576,587,649 | 145,364,174 | 21,973,129 | 37,500,000 | 241,637,883 | 1,023,062,835 |
| ලැබුණු ප්‍රදානයන් | - | - | 25,000,000 | - | - | 25,000,000 |
| ප්‍රදානයන් ක්‍රමක්ෂය | - | (1,667,246) | (6,250,000) | - | - | (7,917,246) |
| විස්තීර්ණ ආදායම | - | - | - | - | 26,294,245 | 26,294,245 |
| ආයුගණක ලාභය/ (අලාභය) | - | - | 3,126,841 | - | (2,472,127) | 654,714 |
| 2012 දෙසැම්බර් මස 31 දිනට ශේෂය | 576,587,649 | 143,696,928 | 43,849,970 | 37,500,000 | 265,460,001 | 1,067,094,548 |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 576,587,649 | 143,696,928 | 43,849,970 | 37,500,000 | 265,460,001 | 1,067,094,548 |
| ලැබුණු ප්‍රදානයන් | - | - | - | - | 6,250,000 | 6,250,000 |
| වැඩිපුර දක්වා ඇති සජීර තැන්පත් පොලිය | - | - | - | - | (231,641) | (231,641) |
| ක්ෂය කිරීම් සඳහා ගැලපුම් | - | - | - | - | 16,481,659 | 16,481,659 |
| ප්‍රත්‍යාගණන සංචිතය | - | - | 679,452 | - | - | 679,452 |
| බදු ගැලපුම | | | 3,126,841 | | | 3,126,841 |
| විස්තීර්ණ ආදායම | - | - | - | - | 2,096,836 | 2,096,836 |
| **ආයුගණක ලාභය/ (අලාභය)** | **-** | **-** | **-** | **-** | **1,156,094** | **1,156,094** |
| **2013 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | **576,587,649** | **143,696,928** | **44,529,422** | **37,500,000** | **291,212,949** | **1,093,526,948** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශණය

*2013 දෙසැම්බර් 31 දායින් අවසන් වන වසර සඳහා*

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| වසර සඳහා වූ ශුද්ධ ලාභය/(අලාභය) | 2,096,836 | 29,421,086 |
| | **2,096,836** | **29,421,086** |
| **ගැලපීම්** | | |
| දේපළ, යන්ත්‍ර හා උපකරණ විකිණීම මත ලාභය/(අලාභ ය) | - | (890,783) |
| ක්ෂය ගැලපුම | (3,650) | |
| ක්ෂය කිරීම් | 57,660,198 | 54,138,603 |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වූ ප්‍රතිපාදන | 9,469,596 | 8,275,601 |
| බොල් ණය සඳහා වූ ප්‍රතිපාදන | 21,154,245 | 20,704,043 |
| විලම්භිත බදු ආදායම් | (1,000,504) | (1,000,504) |
| පොළී | 37,909,314 | 29,478,232 |
| ප්‍රසාද දීමනා සඳහා වූ ප්‍රතිපාදන | 8,000,000 | 8,000,000 |
| **කාරක ප්‍රාග්ධන වෙනස් කිරීම් වලට පෙර ක්‍රියාකාරකම් මගින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රමාණය** | **135,286,035** | **148,126,279** |
| ණය වල වැඩිවීම්/අඩුවීම් | 733,854,784 | 876,865,439 |
| ජංගම වගකීම් වල වැඩිවීම්/අඩුවීම් | (40,009,661) | 78,775,767 |
| වෙළඳ හා අනෙක් තොග වල වැඩිවීම්/අඩුවීම් | (1,755,252) | 58,141,289 |
| පශු සම්පත් ප්‍රාග්ධන වල වැඩිවීම්/අඩුවීම් | (464,814,006) | (202,903,456) |
| තොග වල වැඩිවීම්/අඩුවීම් | (87,828,920) | (87,682,429) |
| වෙළඳ හා අනෙක් ලැබිය යුතු දෑ වැඩිවීම්/අඩුවීම් | (16,465,759) | (171,163,251) |
| ගෙවන ලද පොළී | (22,457,722) | (15,375,643) |
| ගෙවන ලද පාරිතෝෂික | (15,923,414) | (13,119,857) |
| ගෙවන ලද බදු | - | (5,760,186) |
| **ක්‍රියාකාරකම් මගින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රමාණය** | **219,886,085** | **665,903,952** |
| **ආයෝජන ක්‍රියාකාරකම් මගින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රමාණය** | | |
| ජංගම නොවන වත්කම් මිළදී ගැනීම් | (259,906,378) | (691,868,654) |
| අනෙකුත් වත්කම් වල වැඩිවීම් | | |
| දේපළ, යන්ත්‍ර හා උපකරණ විකිණීම මත ලත් මුදල | - | 890,783 |
| | (259,906,378) | **(690,977,872)** |
| **මූල්‍ය කරණ ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය** | | |
| රජයේ ප්‍රදාන ලැබීම් | 28,293,165 | 17,082,754 |
| ගත් හෝ පියවන ලද ණය/කල් බදු | - | - |
| | **28,293,165** | **17,082,754** |
| **ශුද්ධ මුදල් වලවල  වැඩිවීම්/ (අඩුවීම්)** | **(11,727,127)** | **(7,991,166)** |
| **වසර මුලදී තිබූ  මුදල් හා මුදල් වලට සමාන දේ** | **12,463,087** | **20,454,253** |
| **වසර අවසානයේ දී තිබූ  මුදල් හා මුදල් වලට සමාන දේ** | **735,960** | **12,463,087** |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සඳහා වන උප ලේඛණ

| | 31.12.2013 අවසන් වර්ෂය රු. | 31.12.2012 අවසන් වර්ෂය රු. |
|---|---|---|
| ඇමුණුම - 1 | | |
| **අයභාර** | | |
| විකුණුම් | 1,421,888,338.09 | 1,464,230,609 |
| අඩු කළා: අන්තර් ගොවිපොල විකුණුම් | (137,092,653.78) | (208,257,162) |
| අයභාර | **1,284,795,684.31** | **1,255,973,446** |
| ඇමුණුම - 2 | | |
| **වෙනත් ආදායම්** | | |
| බදු කුලී ආදායම | - | 675,500 |
| සේවක ණය පොලී ආදායම | 2,343,421.92 | 2,503,617 |
| බැංකු තැන්පත් පොලී ආදායම | 3,070,280.63 | 2,474,867 |
| සුළු ව්‍යාපෘති ආදායම/පාඩුව | 1,340,844 | |
| නැවුම් කිරි බෙදාහැරීමේ ව්‍යාපෘතිය | 9,349,242.82 | (2,078,514) |
| ඩිලයිට් ව්‍යාපෘතිය | 1,977,475.35 | 608,423 |
| වෙනත් ආදායම් | 64,129,972.95 | 17,238,200 |
| විකුණුම්හල ප්‍රධාන කාර්යාලය | 2,862,999.27 | 960,188 |
| ඉඩම් වන්දි මුදල් - කන්දකඩුව | 1,300,000.00 | |
| ජංගම නොවන වත්කම් විකුණුම් | - | 890,783 |
| | **85,033,392.94** | **24,613,907** |
| ඇමුණුම - 3 | | |
| **රජයේ ප්‍රදානයන්** | | |
| දැයට කිරුළ | - | 11,356,407 |
| තෘණ සංවර්ධනය | 28,293,165.34 | 6,250,000 |
| | **28,293,165.34** | **17,606,407** |
| ඇමුණුම - 4 | | |
| **බෙදාහැරීමේ පිරිවැය** | | |
| තැරැව් ගාස්තු | 2,720,532.57 | 3,838,749 |
| බොල් ණය කපා හැරීම් | 1,070,434.84 | - |
| | **3,790,967.41** | **3,838,749** |
| ඇමුණුම - 5 | | |
| **පරිපාලන වියදම්** | | |
| පරිපාලන වියදම් සහ ගොවිපාළ පරිපාලන | 46,183,997.76 | 37,642,059 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 8,000,000.00 | 8,000,000 |
| ප්‍රධාන කාර්යාලය | 141,026,506.91 | 107,115,966 |
| | **195,210,504.67** | **152,758,024** |

| | 31.12.2013 අවසන් වර්ෂය රු. | 31.12.2012 අවසන් වර්ෂය රු. |
|---|---|---|
| ඇමුණුම - 6 | | |
| **අනෙකුත් වියදම්** | | |
| ගව ආරක්ෂණය | 5,820,864.00 | - |
| දැයට කිරුල - 2013 | 3,055,658.29 | 7,015,061 |
| | **8,876,522.29** | **7,015,061** |

| | 31.12.2013 අවසන් වර්ෂය රු. | 31.12.2012 අවසන් වර්ෂය රු. |
|---|---|---|
| ඇමුණුම - 7 | | |
| **මූල්‍යමය පිරිවැය** | | |
| බැංකු අයිරා පොලි | 6,366,261.60 | 2,753,475 |
| කල්බදු පොලි | 3,898,684.40 | 1,659,220 |
| වෙනත් බැංකු ණය මත පොලි | 2,181,506.84 | 951,677 |
| විශ්‍රාමික පාරිතෝෂික ශේෂය මත පොලී | 15,451,592.40 | 14,102,589 |
| ගොවීන්ගේ භාරකාර අරමුදල සඳහා පොලි | 10,011,269.00 | 10,011,270 |
| | **37,909,314.24** | **29,478,232** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශණ සඳහා වන උප ලේඛණ

| | පොල් යටි වගාව නව වගාව රු. | තෘණ ස්ථාපන වියදම් රු. | කජු වගා වියදම් රු. | රබර් වගා වියදම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| සටහන - 04 | | | | | |
| **වැවිලි** | | | | | |
| 01.01.2013 දිනට ඉ/ගෙනා ශේෂය | 417,312,659 | 26,995,392 | 1,335,382 | 7,374,158 | 453,017,591 |
| 2013 වර්ෂය තුළ දැරූ වියදම් | 58,243,400 | 577,203 | - | 3,518,184 | 62,338,787 |
| | **475,556,059** | **27,572,596** | **1,335,382** | **10,892,342** | **515,356,378** |
| අඩු කළා ලාභාලාභ ගිණුමට හර කළ ප්‍රමාණය | (4,250,324) | (6,491,684) | - | - | (10,742,007) |
| 31.12.2013 දිනට ශේෂය | 471,305,735 | 21,080,912 | 1,335,382 | 10,892,342 | 504,614,371 |
| | **471,305,735** | **21,080,912** | **1,335,382** | **10,892,342** | **504,614,371** |

| | 2013 ප්‍රාග්ධන | 2013 වෙළඳ | 2013 එකතුව | 2012 රු. |
|---|---|---|---|---|
| සටහන - 05 | | | | |
| **පශු සම්පත් අගය - 31.12.2013** | | | | |
| එළගව/මී ගව | 529,967,843 | 2,449,780 | 532,417,623 | 254,619,209 |
| එළුවන් | 5,099,855 | - | 5,099,855 | 3,809,313 |
| ඌරන් | 5,732,840 | 1,278,648 | 7,011,488 | 7,270,682 |
| බැටළුවන් | 27,062,845 | - | 27,062,845 | 16,177,120 |
| හාවුන් | - | - | - | - |
| කුකුළන් | 33,180,295 | 619,160 | 33,799,455 | 32,679,112 |
| මත්ස්‍යයන් | - | - | | |
| වටුවන් | - | 10,540 | | |
| තාරාවුන් | 1,125 | 825 | 1,950 | 17,065 |
| කළුකුන් | 65,617 | 976 | 66,593 | 53,317 |
| වෙනත් | 235,750 | 58,775 | 294,525 | 241,070 |
| ආනයනය කරන ලද එළගව | 460,250,932 | 460,250,932 | 207,898,980 | |
| | **1,061,597,102** | **4,408,164** | **1,066,005,266** | **522,776,407** |
| 25% අඩු කිරීම් | (71,369,646) | (932,107) | (72,301,753) | (70,469,081) |
| | | | | |
| **ශුද්ධ අගය** | **990,227,456** | **3,476,057** | **993,703,513** | **452,307,326** |

| | 2013 ජනවාරි 01 දිනට රු. | එකතු කිරීම් 2013 රු. | විකුණුම් රු. | ගැලපුම් රු. | නොනිමි වැඩ මාරු කිරීම් රු. | 2013 දෙසැම්බර් 31 දිනට රු. |
|---|---|---|---|---|---|---|
| සටහන - 06 | | | | | | |
| **දේපළ, පිරියත හා උපකරණ** | | | | | | |
| **පිරිවැය** | | | | | | |
| ඉඩම් | 337,803,776 | - | - | 679,452 | - | 338,483,228 |
| ගොඩනැගිලි | 178,817,075 | 4,327,220 | - | - | 13,889,844 | 197,034,138 |
| යන්ත්‍ර හා උපකරණ | 93,362,766 | 27,621,172 | - | (11,305,278) | - | 109,678,659 |
| වතු උපකරණ | 90,367,326 | 37,821,247 | (1,381) | - | - | 128,187,192 |
| කාර්යාල උපකරණ | 24,003,732 | 2,143,788 | (2,850) | - | - | 26,144,670 |
| ලී බඩු හා සවිකිරීම් | 14,128,255 | 1,079,858 | (1,610) | - | - | 15,206,502 |
| ඉදිකිරීම් | 718,277,814 | 140,488,160 | - | 11,305,278 | 11,208,890 | 881,280,142 |
| මෝටර් රථ | 106,533,728 | 37,209,572 | - | (1,245,263) | - | 142,498,037 |
| නොනිමි වැඩ | 14,638,108 | - | - | - | (14,638,108) | - |
| **බදු මත ගත් වත්කම්** | | | | | | |
| මෝටර් රථ | 42,335,714 | - | - | - | - | 42,335,714 |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,620,268,294** | **250,691,016** | **(5,842)** | **(565,811)** | **10,460,625** | **1,880,848,282** |
| | | | | | | |
| **ක්ෂය කිරීම්** | | | | | | |
| ඉඩම් | - | - | - | - | - | - |
| ගොඩනැගිලි | 51,242,846 | 9,157,215 | - | 3,611,092 | - | 64,011,153 |
| යන්ත්‍ර හා උපකරණ | 28,856,777 | 10,064,622 | - | 477,694 | - | 39,399,094 |
| වතු උපකරණ | 39,606,811 | 11,093,087 | (1,381) | (3,824,384) | - | 46,874,133 |
| කාර්යාල උපකරණ | 11,849,443 | 5,229,504 | (2,850) | 2,369,792 | - | 19,445,890 |
| ලී බඩු හා සවිකිරීම් | 3,788,001 | 1,520,811 | (1,505) | 340,757 | - | 5,648,064 |
| ඉදිකිරීම් | 162,618,354 | 12,616,021 | - | (14,799,981) | - | 160,434,394 |
| මෝටර් රථ | 56,374,136 | 7,978,937 | - | (4,652,980) | - | 59,700,094 |
| නොනිමි වැඩ | - | - | - | - | - | - |
| **බදු මත ගත් වත්කම්** | | | | | | |
| මෝටර් රථ | 8,803,988 | - | - | - | - | 8,803,988 |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **363,140,357** | **57,660,198** | **(5,737)** | **(16,478,009)** | **-** | **404,316,810** |
| | | | | | | |
| **2013 දෙසැම්බර් 31 දිනට පොත් ශුද්ධ වටිනාකම** | **1,257,127,937** | **193,030,817** | **(105)** | **15,912,198** | **10,460,625** | **1,476,531,472** |

# මූල්‍ය ප්‍රකාශණ සඳහා වන උප ලේඛණ

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන - 07 | | |
| උප සමාගම්වල ආයෝජනය | 15,995,171 | 15,995,171 |

1995 දී ශ්‍රී ලංකා ලිබියානු කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධන සමාගමෙහි, ඉල්ලුම් නොකරන ලද ආයෝජන වල රු.15,995,170.61 ක් මණ්ඩලය විසින් ආයෝජනය කර ඇත. උප සමාගමෙන් 51% ක් මණ්ඩලය හිමි කර ගෙන ඇත. පිරිවැය ගිණුම්කරණ ක්‍රමය යටතේ මෙම ආයෝජනය ගිණුම් කොට ඇත. පහත සඳහන් හේතුන් නිසා ඒකාබද්ධ ගිණුම් පිළියෙල කළ නොහැක.

1. උප සමාගමෙහි ක්‍රියාකාරකම් මව් සමාගමෙහි කි5යාකාරිත්වයන්ට වෙනස්ය
2. උප සමාගමෙහි ගිණුම් වර්ෂය මව් සමාගමෙහි ගිණුම් වර්ෂයට වෙනස්ය

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන - 08 | | |
| **වෙළඳ සහ අනෙකුත් තොග - 31.12.2013** | | |
| පොල් කොප්පරා | 61,738,970 | 49,092,223 |
| විවිෂ නිෂ්පාදන තොග | 2,267,268 | 8,236,160 |
| ගොවි පොළෙහි සහ ප්‍රධාන කාර්යාලයේ පොදු තොග | 73,479,158 | 74,379,687 |
| | **137,485,396** | **131,708,071** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන - 09 | | |
| **වෙළඳ අනෙකුත් ලැබිය යුතු දෑ සහ අත්තිකාරම්** | | |
| සේවක ණය ගැතියෝ | 34,787,594 | 33,757,499 |
| වෙළඳ අනෙකුත් ණය ගැතියෝ | 202,818,207 | 188,694,620 |
| | 237,605,801 | 222,452,118 |
| අඩු කළා - බොල් සහ අනුමාන ණය සඳහා වෙන් කිරිම | (21,154,245) | (20,704,043) |
| | 216,451,556 | 201,748,075 |
| ආර්ථික සේවා ගාස්තු | 17,494,747 | 17,494,747 |
| දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව | 2,079,371 | (595,833) |
| නැවත ඉල්ලුම් කලහැකි අගය එකතු කරන ලද බදු | 3,027,164 | 3940090 |
| | **239,052,837** | **222,587,078** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන - 10 | | |
| **තැන්පත් සහ කලින් ගෙවීම්** | | |
| තැන්පත් | 1,170,423 | 1,338,207 |
| කලින් ගෙවීම් | 8,046,204 | 13,252,010 |
| | **9,216,627** | **14,590,217** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන - 11 | | |
| **අනෙකුත් ජංගම වත්කම්** | | |
| අනෙකුත් ජංගම වත්කම් | 34,299,700 | 30,668,674 |

ගොවි පොළ වල තවාන් සහ වී වගාව වැනි සම්පූර්ණ නොවූ ක්‍රියාකාරකම් වල දරණ ලද වියදම්.

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන - 12 | | |
| **නියමිත කාලයක් සඳහා වන හා ඉල්ලුම් තැන්පත්** | | |
| ඉල්ලුම් තැන්පත් -මහජන බැංකු නාරාහේන්පිට | 28,568,780 | 23,802,778 |
| ස්ථිර තැන්පත් - ලංකා බැංකුව | 323,809 | 3,362,267 |
| | **28,892,589** | **27,165,045** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන - 13 | | |
| **මුදල් සහ මුදල් වලට සමාන දෑ** | | |
| බංකු ශේෂයන් | 9,454,773 | 7,160,131 |
| ඉතිරි කිරීමේ ගිණුම් | 6,397 | 6,397 |
| ඉතිරි කිරීමේ ගිණුම් | 3,732,196 | 4,004,593 |
| අත ඉතිරි මුද්දර | 117,775 | 62,061 |
| මාර්ගස්ථ මුදල් | (12,575,181) | 1,229,906 |
| | **735,960** | **12,463,087** |

# මුල්‍ය ප්‍රකාශණ සඳහා වන උප ලේඛණ

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන - 14 | | |
| **කාලීන ණය මත පොලී** | | |
| ගොවීන්ගේ භාරකාර අරමුදල | 98,412,700 | 100,112,700 |
| මහජන බැංකුවේ ණය | 45,833,333 | - |
| අධි ශීත කරණ ට්‍රක් රථය | - | - |
| කිරි හරක් ණය | 1,577,844,216 | 881,785,607 |
| **කල් බදු පහසුකම්** | | |
| කැබ් රථ 05 | 12,595,448 | 19,024,511 |
| ට්‍රැක්ටර්ස් රථ 05 | 10,492,546 | 13,141,040 |
| මෝටර් කාර් 02 | 6,960,837 | 9,823,560 |
| **අවිනිශචිත පොලී** | | |
| කැබ් රථ 05 | (1,389,501) | (3,055,381) |
| ට්‍රැක්ටර්ස් රථ 05 | (2,805,200) | (4,203,540) |
| මෝටර් කාර් 02 | (698,951) | (1,533,415) |
| මාස 12 ක් තුළ ගෙවිය යුතු ගිණුමට මාරු කළා | (8,350,838) | (10,055,276) |
| | **1,738,894,590** | **1,005,039,806** |
| **වසර අවසානයේ ශේෂය** | **1,738,894,590** | **1,005,039,806** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන - 15 | | |
| **පොලී රහිත ණය** | | |
| භාණ්ඩාගාර ණය | 50,000,000 | 50,000,000 |
| | **50,000,000** | **50,000,000** |

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන - 16 | | |
| **විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම්** | | |
| වර්ෂය ආරම්භයේ දී ඇති ශේෂය | 134,361,674 | 122,631,214 |
| එකතු කළා - වර්ෂය තුළ වෙන් කිරීම් | 9,049,958 | 8,275,601 |
| - ආරම්භක ශේෂය මත පොලී | 15,451,592 | 14,102,589 |
| - ආයුගණක ලාභය/අලාභය | 11,311,190 | 2,472,127 |
| | **170,174,415** | **147,481,531** |
| අඩු කළා වර්ෂය තුළ ගෙවූ මුදල | (15,923,414) | (13,119,857) |
| **වර්ෂය අවසානයේ දී ඇති ශේෂය** | **154,251,001** | **134,361,674** |

| | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| සටහන - 17 | | |
| **කල් බදු වත්කම් මත විලම්බිත අයභාර ආදායම්** | | |
| ඉදිරියට ගෙනා ශේෂය | 43,015,998 | 44,016,502 |
| අයභාර ගිණුමට මාරුකිරීම - ලැන්-ලිබ් සමාගමෙන් කල් බදු | (88,384) | (88,384) |
| අයභාර ගිණුමට මාරුකිරීම - ග්‍රෑන්ඩික්ස් සමාගමෙන් කල් බදු | (666,666) | (666,666) |
| අයභාර ගිණුමට මාරුකිරීම - රජවැල්ල සමාගමෙන් කල් බදු | (245,455) | (245,455) |
| | **42,015,493** | **43,015,998** |

| | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| සටහන - 18 | | |
| **ගෙවිය යුතු ද සහ වෙන් කිරීම්** | | |
| සේවක ණය හිමියෝ | 20,459,493 | 18,209,903 |
| වෙළඳ සහ අනෙකුත් ණය හිමියෝ | 259,014,062 | 233,936,896 |
| උපචිත වියදම් | 19,086,485 | 21,647,816 |
| වෙන්කිරීම් | 16,511,489 | 12,930,614 |
| තැන්පත් | 14,901,653 | 15,151,707 |
| ගෙවිය යුතු සේ අ අරමුදල් | 4,928,375 | 4,828,971 |
| ගෙවිය යුතු සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් | 993,556 | 719,523 |
| | **335,895,113** | **307,425,431** |
| ගෙවිය යුතු අගය එකතු කරන ලද බදු | 7,185,103 | 7,240,445 |
| | **343,080,216** | **314,665,876** |

| | 2013 රු. | 2012 රු. |
|---|---|---|
| සටහන - 19 | | |
| **කෙටි කාලීන ණය** | | |
| මහජන බැංකුව - 100153693183 | 37,744,755 | 73,000,137 |
| මහජන බැංකුව - 100153694880 | 799,276 | - |
| මහජන බැංකුව - 873 | 2,905,419 | 2,284,368 |
| මහජන බැංකුව - 228 | - | - |
| ගොවි පොළ අලෙවි සැල - 1001 6369 4865 | 34,288 | 361,505 |
| බඩ ඉරිඟු ව්‍යාපාතිය | - | - |
| ගොවි පොළ ජංගම ගිණුම් | (31,075,186) | 1482103 |
| | **10,408,552** | **77,128,114** |

# මූල්‍ය ප්‍රකාශණ සඳහා වන උප ලේඛණ

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| සටහන - 20 | | |
| **මාස 12 ක් තුළ ගෙවිය යුතු ණය මත ගෙවිය යුතු මුදල්** | | |
| ගෙවිය යුතු ණය - 2013 | - | - |
| මෝටර් රථ මත ගෙවිය යුතු බදු මුදල් | 2,907,216 | 2,907,216 |
| කැබ් රථ මත ගෙවිය යුතු බදු මුදල් | 6,475,140 | 6,475,140 |
| ට්‍රැක්ටර් රථ මත ගෙවිය යුතු බදු මුදල් | 2,867,136 | 2,867,136 |
| අධි ශීත කරණ ට්‍රක් රථ මත ගෙවිය යුතු බැංකු ණය මුදල් | - | - |
| පොලී - අවිනිශ්චිත ගිණුම - මෝටර් රථ | (834,464) | (395,720) |
| පොලී - අවිනිශ්චිත ගිණුම - ට්‍රැක්ටර් රථ | (1,398,340) | (917,136) |
| පොලී - අවිනිශ්චිත ගිණුම - කැබ් රථ | (1,665,850) | (881,360) |
| | **8,350,838** | **10,055,276** |

# SLFRS/LKAS වල අදාලත්වය

*වර්තමානයේ බලාත්මක SLFRS/LKAS ප්‍රමිතීන් (2012 සිට ක්‍රියාත්මක)*

| SLFRS/ LKAS No | විස්තරය | |
|---|---|---|
| SLFRS 1 | ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත SLFRS/LKAS මුල්වරට සම්මත කර ගැනීම | |
| SLFRS 2 | කොටස් පදනම් වූ ගෙවීම් | අ/නොවේ |
| SLFRS 3 | ව්‍යාපාර සංයෝජන | |
| SLFRS 4 | රක්ෂණ ගිවිසුම් | අ/නොවේ |
| SLFRS 5 | විකිණීම සඳහා තබා ගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම් | අ/නොවේ |
| SLFRS 6 | ඛණිජ සම්පත් සඳහා ගවේෂණය සහ ඇගයීම | අ/නොවේ |
| SLFRS 7 | මූල්‍ය සාධන පත්‍ර හෙළිදරව් කිරීම | |
| SLFRS 8 | මෙහෙයුම් ඛණ්ඩ | අ/නොවේ |
| LKAS 1 | මූලය ප්‍රකාශ ඉදිරිපත් කිරීම | |
| LKAS 2 | තොග | |
| LKAS 7 | මුදල් ප්‍රවාහ ප්‍රකාශ | |
| LKAS 8 | ගිණුම් කරණ ප්‍රතිපත්ති ගිණුම් කරණ ඇස්ත-මේන්තුවල වෙනස්වීම් හා වැරදි | |
| LKAS 10 | වාර්තා කරණ කාල පරිච්ඡේදයට පසු සිදුවීම් | |
| LKAS 11 | ඉදිකිරීම් කොන්ත්‍රාත් | අ/නොවේ |
| LKAS 12 | ආදායම් බදු | |
| LKAS 16 | දේපළ පිරියත සහ උපකරණ | |
| LKAS 17 | කල් බදු | |
| LKAS 18 | අයභාර | |
| LKAS 19 | සේවක ප්‍රතිලාභ | |
| LKAS 20 | රාජ්‍ය ප්‍රදාන සඳහා ගිණුම් කරණ සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම | |
| LKAS 21 | විදේශ විනිමයන්හි වෙනස්කම්වල බලපෑම් | අ/නොවේ |
| LKAS 23 | ණය ගැණුම් පිරිවැය | අ/නොවේ |
| LKAS 24 | සම්බන්ධිත පාර්ශවයන් හෙළි කිරීම් | අ/නොවේ |
| LKAS 26 | විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණය සහ වාර්තාකරණය | අ/නොවේ |
| LKAS 27 | ඒකාබද්ධ සහ වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශණ | |
| LKAS 28 | ආශ්‍රීතයන්හි ආයෝජන | අ/නොවේ |
| LKAS 29 | අති උද්ධමනකාරි ආර්ථිකයන්හි මූල්‍ය වාර්තාකරණය | අ/නොවේ |
| LKAS 31 | බද්ධ ව්‍යාපාරයන්හි හිමිකම් | |
| LKAS 32 | මූල්‍ය සාධන පත්‍ර ඉදිරිපත් කිරීම | |
| LKAS 33 | කොටසක ඉපැයුම් | අ/නොවේ |
| LKAS 34 | අතුරු මූල්‍ය වාර්තාකරණය | අ/නොවේ |
| LKAS 36 | වත්කම් හානිකරනය | |
| LKAS 37 | ප්‍රතිපාදන අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් | |
| LKAS 38 | අස්පෘශ්‍ය වත්කම් | අ/නොවේ |
| LKAS 39 | මූල්‍ය සාධන පත්‍රහඳුනා ගැනීම සහ මැණීම | |
| LKAS 40 | ආයෝජන දේපළ | අ/නොවේ |
| LKAS 41 | කෘෂිකර්මය | |

# ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත SLFRS/LKAS

## SLFRS 2 - කොටස් පදනම් ගෙවීම

මෙම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිතයෙහි අරමුණ වනුයේ අස්තිත්වයක් විසින් කොටස් පදනම් ගනුදෙනුවකට එළඹීමේ දී ඒ පිලිබඳව මූල්‍ය වාර්තාකරණය විය යුතු ආකාරය නියම කිරීමයි විශේෂයෙන් සේවකයින්ට කොටස් විකල්පයන් ප්‍රදානය කරන ගණුදෙණු ඒ හා සම්බන්ධ වියදම් ද ඇතුලව කොටස් පදනම් ගෙවීම් ගණුදෙනුවල බලපෑම අස්තිත්වයක් එහි ලාභයේ හෝ අලාභයේ සහ මූල්‍ය තත්ත්වයේ පිලිබිඹු වියයුතු බවට මෙයින් අවශ්‍ය කෙරේ.

යම් කාලයක් තුළ ලැබුණා වූ භාණ්ඩ සහ සේවා වල සාධාරන අගය හෝ දෙන ලද ස්කන්ධ සාධන පත්‍ර වල සාධාරණ අගය කෙසේ තීරණය කරන ලද්දේ ද යන්න මූල්‍ය ප්‍රකාශ පරිශිලනය කරන්නන් හට තේරුම් ගත හැකි පරිදි අස්තිත්තවයක් විසින් තොරතුරු අණාවරණය කළ යුතුයි.

**ප්‍රධාන නිර්වචනය: කොටස් පදනම් ගෙවීම:** කොටස් පදනම් ගෙවීමක් යනු අස්තිත්තවයක් විසින් එම අස්තිත්වයේ ස්කන්ධ සාධන පත්‍ර වල ප්‍රතිශ්‍රාව ලෙස භාණ්ඩ හෝ සේවා ලබා ගැනීමක් හෝ අසතිත්තවයේ කොටස් වල මිල අනුව දරණ ලද වියදමක් හෝ අසතිත්වයේ අනෙකුත් ස්කන්ධ සාධන පත්‍ර මිල අනුව දරණ ලද වියදමක් වේ කොටස් පදනම් ගෙවීමක් සිදු කරනු ලබන්නේ (අ) ස්කන්ධ වලන් ද (ආ) මුදලින් ද නැතහොත් (ඇ) ස්කන්ධයෙන් හෝ මුදලින් ද යන්න මත කොටස් පදනම් ගෙවීමක් සම්බන්ධ ගිණුම් කරණ අවශ්‍යතා තීරණය කෙරේ

## SLFRS 4 - රක්ෂණ ගිවිසුම්

මෙම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිතයෙහි අරමුණ වනුයේ මෙම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිතයෙහි රක්ෂණකරු යයි විස්තර කර ඇති අස්තිත්තවයක් විසින් රක්ෂණ ගිවිසුම් සම්බන්ධ වයාපෘතියේ දෙවැනි අදියර සම්පූර්න කරන තෙක් නිකුත් කරනු ලබන එවැනි ගිවිසුම් සම්බන්ධ මූල්‍ය වාර්තාකරණය කෙසේ සිදු විය යුතු දැයි නියම කිරීමයි.

විශේෂයෙන් මෙම ප්‍රමිතයෙන් අපේක්ෂා කරනුයේ රක්ෂණ ගිවිසුම් සඳහා රක්ෂණකරු විසින් ගිනුම්කරණයට සීමා කරන ලද වර්ධනයන් ඇති කිරීමයි තවද රක්ෂණ ගිවිසුම් මගින් පැන නගින රක්ෂණකරු ගේ මූල්‍ය ප්‍රකාශ තුල ඇති වටිනාකම් හඳුනාගනු ලබන බව සහ පැහැදිලි වන බව හෙළිදරව් කිරීම සහ එම මූල්‍ය ප්‍රකාශණ භාවිතා කරන්නන් හට වටිනාකම කාලය සහ රක්ෂණ ගිවිසුම් තුලින් අනාගත මුදල් ප්‍රවාහ පිළිබඳ ඇති අවිනිශචිත භාවය තේරුම් ගැනීමට උපකාරී වීම ද මෙම ප්‍රමිතයෙන් අවශ්‍ය කෙරේ

**ප්‍රධාන නිර්වචනය:** රක්ෂණ ගිවිසුම්:රක්ෂණ ගිවිසුමක් යනු එක් පාර්ශවයක් (රක්ෂණකරු) විසින් අනෙක් පාර්ශවකරු (රක්ෂණ ඔප්පු හිමියා) ගේ සැලකි යුතු රක්ෂන අවදානම් රක්ෂණ ගිවිසුමක් මගින් භාර ගන්නා අතර රක්ෂන ඔප්පු හිමියාට නිශ්චිත වූ අවිනිශ්චිත අනාගත සිද්ධියකින් (රක්ෂිත සිද්ධිය) අහිතකර ලෙස බලපෑමක් එල්ල වූ කළ ඒ සඳහා වන්දියක් ගෙවීමට රක්ෂණකරු එකඟ විමයි.

## SLFRS 5 - විකිණීම සඳහා තබා ගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත අංක 5 හි අරමුණ වනුයේ විකිණීම සඳහා තබා ගෙන ඇති ජංගම නොවන වත්කම් හා අසන්තතික මෙහෙයුම් ඉදිරිපත් කිරීම හා හෙළිදරව් කිරීම පිලිබඳව විශේෂිත නියමයන් දැක්වීමයි විශේෂයෙන් මෙම ප්‍රමිතය මගින්:

(අ) නියමිත නිර්නායකයන් සපුරාලන වත්කම් විකිණීම සඳහා තබා ලෙන ඇති ඒවා ගෙස වර්ග කල යුතු අතර ඒවා ධාරණ අගය සහ සාධාරණ වටිනාකමෙන් විකිණීම සඳහා වූ පිරිවැය අඩු කළ පසු වටිනාකම යන දෙකින් අඩුඅගය මත මිණුම් කිරීමටත් එවැනි වත්නම් ත ක්සය කිරීම් අතහිටුවීමට සහ

(ආ) නියමිත නිර්නායකයන් සපුරාලන වත්කම් විකිණීම සඳහා තබා ගෙන ඇති ඒවා ලෙස වර්ග කළ යුතු අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වෙන්ව ඉදිරිපත් කිරීමටත් අසන්තතික මෙහෙයුම් වල ප්‍රතිඵල විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙන්ව දැක්වීමටත් නියම කරයි විකිණීම සඳහා තබා ගෙන ඇති ලෙස වර්ග කරන ලද අස්තිත්වයේ සංරචකයක් වන මෙය

  (අ) ප්‍රධාන විසංයුක්ත ව්‍යාපාර අංශයක් හෝ භූගෝලීය මෙහෙයුම් ප්‍රදේශයක් නියෝජනය කරයි.

  (ආ) වෙන් වශයෙන් වූ ප්‍රධාන ව්‍යාපාරික අංශයක් හෝ භූගෝලීය මෙහෙයුම් ප්‍රදේශයක් අපහරණය සඳහා වූ තනි සමායෝජිත සැලැස්මක කොටසක් වේ. නැතහොත්

  (ඇ) නැවත විකිණීමේ පරම අදහසින් අත්පත් කර ගන්නා ලද පරිපාලිතයක් වේ.

**අපහරණ කාණ්ඩය:** විකිණීම මගින් හෝ වෙනත් ආකාරයකින් තනි ගණුදෙනු වක දී, කාණ්ඩයක් ලෙස එම වත්කම් වලට සෘජුව සම්බන්ධ වගකීම් ද පැවරීමක් ගණුදෙනුවේ දී සිදුවන අපහරණය කිරීමට ඇති වත්කම් කාණ්ඩයක්. කීර්ති නාමය වෙන් කරනු ලැබ ඇති කාණ්ඩය මුදල් ජනන ඒකකයක් වන්නේ නම්, ව්‍යාපාර සංයෝජනයක දී අත් පත් කරනු ලැබූ කීර්ති නාමය අපහරන කාණ්ඩයට ඇතුලත් වේ.

## SLFRS 6 - ඛණිජ සම්පත් සඳහා ගවේෂණය සහ ඇගයීම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත අංක 6 යෙන් අස්තිත්වයක් විසින් සිය වත්කම් ගවේෂණය සහ ඇගයීම සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිතීන් භාවිතයට උපයෝගි කර ගැනීමට පෙර භාවිතා කළ ගිණුම් කරණ ප්‍රතිපත්තින් තවදුරටත් උපයෝගි කර ගැනීමට අවසර දෙයි. හඳුණා ගැනීම සහ මැනීම සඳහා භාවිතා කළ ගිණුම් කරණ ප්‍රතිපත්තීන් වල ක්‍රියා මාර්ග දිගටම පවත්වා ගෙන යාම ද මෙහි ඇතුලත්ය.

## SLFRS 8 - මෙහෙයුම් ඛණ්ඩ

ලැයිස්තු ගත සමාගම් සිය අස්තිත්වයේ මෙහෙයුම් ඛණ්ඩ පිළිබඳව තොරතුරු හෙළිදරව් කල යුතුය. තව ද සිය අස්තිත්වයේ නිෂ්පාදන භාණ්ඩ සහ සේවාවන් එය ක්‍රියාත්මක වන භූගොලීය පරිසරය සහ සිය ප්‍රධාන ගණුදෙනු කරුවන් පිළිබඳවත් තොරතුරු හෙළිදරව් කල යුතුය.

## LKAS 11 - ඉදිකිරීම් කොන්ත්‍රාත්- ඉදිකිරීම් කොන්ත්‍රාත්

ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 11 න් නියම කෙරෙනුයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් වන අයභාර සහ පිරිවැය ගැන කටයුතු කරන ආකාරයයි.

- මුළු අයභාරය, අතීත සහ අනාගත පිරිවැය සහ කොන්ත්‍රාත්තුවක ක්‍රියාකාරකම් සම්පූර්ණ වන අදියර විශ්වාසනීය ලෙස මැණීමට හෝ තකසේරු කිරිමට හැකි නම්, අයභාරය සහ පිරිවැය සම්පූර්ණ වන අදියර අනුව හඳුනා ගත යුතුය. (ප්‍රතිශත සමාප්ති ක්‍රමයයි)
- අපේක්ෂිත අලාභයන් වහාම හඳුණා ගත යුතුය
- ප්‍රතිඵල විශ්වාසනීය ලෙෂ මැණිය නොහැකි අවස්ථාවක දී පිරිවැය වියදමක් වශයෙන් සැලකිය යුතු අතර අයභාරය හඳුනා ගත යුත්තේ පිරිවැය අය කර ගත හැකි මට්ටමකටය. (පිරිවැය අයකිරීමේ ක්‍රමය)
- හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් පහත සඳහන් අයිතම ඇතුලත්ය (එක් එක් ප්‍රධාන කොන්ත්‍රාත් සඳහා හා කොන්ත්‍රාත් වර්ග සඳහාය)
  - කොන්ත්‍රාත් අයභාර මුදල හඳුණා ගත යුතුය
  - එම අයභාර මුදල තීරණය කිරීමේ ක්‍රමය
  - සමාප්ති අදියර තීරණය කිරීමේ ක්‍රමය
  - නොනිමි කොන්ත්‍රාත් ී- දරන ලද සම්මුචිත පිරිවැය හෙළිදරව් කිරිම, හඳුණාගත් ලාභ සහ පාඩු, ලබාගත් අත්තිකාරම්, ගිවිසුම් යටතේ ගණුදෙනු කරුවන්ගෙන් අය විය යුතු සම්පූර්ණ මුදලෙන් රඳවා ගැනීම්
  - ගණුදෙනු කරුවන් හට ගෙවිය යුතු දළ මුදල

## LKAS 21 - විදේශ විනිමයන්හි වෙනස්කම්වල බලපෑම්

ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 11 න් නියම කෙරෙනුයේ අස්තිත්වයක් විසින් සිය විදේශ විනිමය ගනුදෙනු සහ විදේශ ක්‍රියාකාරකම් පිළිබඳව කටයුතු කල ආකාරයයි. ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 39 න් විදේශ ව්‍යවහාර මුදල් (මෙම ලේඛණයේ විස්තර කර නැත) තෝරා ගැනීමේ නිර්නායකයන් නිර්දේශ කරයි. එක් එක් අස්ථිත්වයක් සඳහා ව්‍යවහාර මුදල් කාණ්ඩයකින් තෝරා ගත යුතුය.

### විදේශ විනිමය ගනුදෙනු

ව්‍යවහාර මුදලින් හැර සෙසු මුදල් වලින් කරනු ලබන ගනුදෙනු එම ගනුදෙනුව සිදුවන දිනයේ දී පරිවර්තනය කල යුතුයි. ප්‍රායෝගිකව සිදු වනුයේ භාවිතා කරන විනිමය අනුපාතයන් කාලයෙන් කාලයට උදාහරණයක් වශයෙන් සතිපතා හෝ මාස් පතා ගැලපීම් සිදු කිරිමයි. ශේෂ පත්‍ර දිනය වන විට පවතින මූල්‍ය වත්කම් සහ වගකීම් එදිනට බල පවත්වන අනුපාතයන් අනුව පරිවර්තනය කරනු ලැබේ. ස්ථිර වත්කම් බහුවිධ මුදල් තොරතුරු පෙන්නුම් කරනුයේ වත්කම පිහිටු වූ කළ සහ විශ්‍රාම ගැන් වූ කල්හි ය.

### විදේශීය අස්තිත්වයන් හි ආයෝජන

ව්‍යවහාර මුදලින් හැර සෙසු මුදල් වලින් කරනු ලබන ගනුදෙනු එම ගනුදෙනුව සිදුවන දිනයේ දී පරිවර්තනය කල යුතුයි. මූල්‍ය වත්කම් සහ වගකීම් පරිවර්තනය කළ යුත්තේ අවසාන අනුපාතයන් අනුවයි. විස්තීර්ණ ආදායම් ගිණුමේ අයිතමයන් පරිවර්තනය කළ යුත්තේ ගනුදෙනු අනුපාතයන් අනුවයි (නැතහොත් ප්‍රායෝගිකව සාමාන්‍ය අනුපාතයන් අනුවය). වෙනස්කම් සෘජුවම සකන්ධ ගිණුමට ඇතුලත් කළ යුතු ය.

### හෙළිදරව් කිරීම්

- පරිවර්තන වෙනස්කම් ශුද්ධ ආදායමේ ඇතුලත් කිරීම
- පරිවර්තන වෙනස්කම් වල විග්‍රයන් ස්කන්ධයෙ හි ඇතුලත් කිරීම
- ශේෂ පත්‍ර දිනට පසු අනුපාතයන් ගේ වෙනස්කම්
- විදේශ විනිමය අවදානම් පිලිබඳ කලමනාකරණ ප්‍රතිපත්තිය

## LKAS 23 - ණය ගැණුම් පිරිවැය

සුදුසු කම් ලබන වත්කම් අත්පත් කර ගැනීමට ඉදිකිරීමට හෝ නිෂ්පාදනයට සෘජුවම අදාළ කර ගත හැකි ණය ගැණුම් පිරිවැය එම වත්කමේ පිරිවැයෙහි කොටසක් වේ එබැවින් එය ප්‍රාග්ධන වියදමක් සේ හඳනා ගත යුතුය.

## LKAS 24 - සම්බන්ධිත පාර්ශවයන් හෙළ දරව් කිරිම්

ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 24 න් විස්තර කෙරෙනුයේ සම්බන්ධිත පාර්ශවයන් සමග කරනු ලබන්නා වු ගනුදෙනු හෙළි කිරිම් පිළිබුදවයි. සම්බන්ධිත පාර්ශවයන් යනු සැලකිය යුතු බලපෑමක් හෝ පාලනයක් කළ හැකි අයයි එවැනි සම්බන්ධකම් වලට පහත සඳහන් දේ ඇතුලත් වේ.

- මව් සමාගම් හා උප සමාගම් සම්බන්ධතාවය (ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 27 බලන්න ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණ)
- සාමාන්‍ය පොදු පාලනයක් යටතේ තිබෙන අස්ථිත්තවයන්
- ආශ්‍රිතයන් (LKAS 28) බලන්න ආශ්‍රිතයන් හි ආයොජන
- අයිතිය තුලින් ව්‍යාපාරය කෙරෙහි සහ එහි පවුලේ කිට්ටුම ඥාතීන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කළ හැකි පුද්ගලයින්
- ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්
- හෙළදරව් කිරිම් පහත සඳහන් දෑ ඇතුලත්ය.
- සම්බන්ධිත පාර්ශවයන් අතර ගණුදෙනු නැති වුනත් පාලනයක් ඇති විටක සම්බන්ධතාවයේ ස්වභාවය
- අදාල වන පරිදි සම්බන්ධිත පාර්ශවයන් කණ්ඩායම් සමග ඇති ගණුදෙනු වල ප්‍රමාණය හා ස්වභාවය

# ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත SLFRS/LKAS

## LKAS 26 - විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණය සහ වාර්තාකරණය

විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මිණුම්කරණය සහ හෙළිදරව් කිරීම් පිළිබඳව නිර්නායකයන් බණී 26 මගින් විස්තර කෙරේ.

## LKAS 28 - ආශ්‍රීතයන්හි ආයෝජන

ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 28 න් විස්තර කෙරෙනුයේ ආශ්‍රීතයන්හි හෝ බද්ධ ව්‍යාපාරයන් හි ආයෝජන සම්බන්ධයෙන් ආයෝජකයෙකු විසින් අනුගමනය කළ යුතු ගිණුම් කරණ ක්‍රම වේදයයි. ආශ්‍රිතයක් හෝ බද්ධ ව්‍යාපාරයක් යනු ආයෝජකයෙකු එම ව්‍යාපාරය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු කල හැකි අස්ථිත්ත්වයකි. එය උප සමාගමක් හෝ බද්ධ ව්‍යාපාරයක හිමිකමක් නොවනු ඇත. ආයෝජකයෙකු සෘජු ලෙස හෝ වක්‍ර ලෙස (උදා පරිපාලිතයන් හරහා) ආයෝජිතයා ගේ ඡන්ද බලයෙන් 20% ක හෝ වැඩි ප්‍රමාණයක් එහෙත් 50% කට අඩුව දරා සිටින විටෙක එය එසේ නොවන්නේ යැයි පැහැදිලිව පෙන්වා දිය හැකි නම් හැර ආයෝජකයාට සැලකිය යුතු බලපෑමක් ඇතැයි නිගමනය කෙරේ.

ශේෂ පත්‍රයේ දිනට නැවත ප්‍රකාශණ වල සඳහන් කිරීම තුලින් ශුද්ධ මුල්‍ය තත්ත්වයේ ඇති වූ ලාභ හෝ අලාභ ශුද්ධ ආදායමෙහි අතුලත් කළ යුතු අතර එය වෙනම හෙළිදරව් කළ යුතුය.

## LKAS 29 - අති උද්ධමනකාරි ආර්ථිකයන්හි මූල්‍ය වාර්තාකරණය

අති උද්ධමනකාරි ආර්ථිකයන්හි ව්‍යවහාරික මුදලෙන් වාර්තාකරණ විට LKAS 29 න් ව්‍යාපාර සඳහා ප්‍රමිතීන් නියම කෙරෙනුයේ ඉදිරිපත් කෙරෙන මූල්‍ය ප්‍රකාශණ අර්ථවත්කර ගැනීම සඳහාය. අති උද්ධමනකාරි ආර්ථිකයන් පෙන්නුම් කරනු ලබන්නේ පසු ගිය අවුරුදු 03 තුළ සම්මුචිත උද්ධමනය 100% න් හෝ වැඩි නම්ය (අනෙකුත් සාධක අතර) එවැනි අවස්ථාවල ශේෂ පත්‍ර දිනට වර්තමාන මිණුම් ඒකකයකින් මූල්‍ය ප්‍රකාශන ඉදිරි පත් කළ යුතු ය පසු ගිය වර්ෂ වලට අදාල සංස්දනාත්මක සංඛ්‍යාවන වත්මන් මිණුම් ඒකකයකින් ශේෂ පත්‍ර දිනට නැවත ප්‍රකාශ කළ යුතුය.

## LKAS 31 - බද්ධ ව්‍යාපාරයන්හි හිමිකම්

ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 31 හි අරමුණ වනුයේ බද්ධ ව්‍යාපාරයන්හි ක්‍රියාකාරකම් වල ව්‍යුවහය හෝ ආකෘතිය සිදුවන ආකාරය කෙසේ වුවද බද්ධ ව්‍යාපාරයන්හි හිමිකම් පිළිබඳව ගිණුම්කරණ ක්‍රමවේදය සහ ඒ පිළිබඳව කටයුතු කරන ආකාරය නිර්දේශ කිරීමයි. ප්‍රමිත කටයුතු සඳහා බද්ධව පාලනය කරනු ලබන මෙහෙයුම් බද්ධව පාලනය කරනු ලබන වත්කම් සහ බද්ධව පාලනය කරනු ලබන අස්ථිත්වයන් වශයෙන් බද්ධ ව්‍යාපාරයන් වර්ගීකරනය කරනු ලැබේ.

**ප්‍රධාන නිර්වචනය** - බද්ධ ව්‍යාපාරයක් යනු පාර්ශව දෙකක් හෝ ඊට වැඩි ගණනක් ආර්ථික ක්‍රියාකාරකමක් (බද්ධ ව්‍යාපාරයක්) බද්ධ පාලනයට යටත්ව භාර ගැනිම වේ.

## LKAS 34 - අතුරු මූල්‍ය වාර්තාකරණය

ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 34 න් නියම කෙරෙනුයේ අතුරු මූල්‍ය වාර්තාකරණය සඳහා අවශ්‍යතා පිළිබඳවයි. මෙම මූල්‍ය වාර්තා මත උපයෝගී කරනු ලබන ගිණුම් කරණ ප්‍රතිපත්තීන් වාර්ෂික මූල්‍ය වාර්තා සමබන්ධයෙන් භාවිතා කරනු ලබන ප්‍රතිපත්තීන් ව ප්‍රතිපත්තීන් ම විය යුතුය. කෙසේ වෙතත් සාරාංශ ගත හෙළිදරව් කිරීම් අවශ්‍ය කෙරේ ඒ අනුව අතුරු මූල්‍ය වාර්තාකරණය සියළුම ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිතීන්ට අන්කූල විය යුතුය.

## LKAS 38 - අස්පෘශ්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 38 අනෙක් ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිතීන් වලින් නිශ්චිතව සඳහන් නොකෙරුණු සියළු අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් යොදා ගැණේ. අනෙක් දෑ අතරින් පහත සඳහන් වියදම් සම්බන්ධයෙන් යෙදේ.

ප්‍රචාරක කටයුතු, පුහුණු කටයුතු, ආරම්භක වියදම්, පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් මූල්‍ය වතකම්, රක්ෂන ගිවිසුම්, ඛණිජ සම්පත් හිමිකම්, ඛණිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණ සහ ඛණිජ ද්‍රව්‍ය සහ ප්‍රතිඋත්පාදන රහිත සම්පත් කැණිම් සංවර්ධනය හා උකහාගැනීම් වැනි කටයුතු සඳහා මෙම ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 38 අදාල නොවේ. LKAS 38 අනුව අස්ථිත්වයක් විසින් අස්පාශ්‍ය වත්කම් හඳුණා ගත යුත්තේ සමහර නිර්නායකයන් සම්පූර්ණ කලහොත් පමණි. මෙම ප්‍රමිතිය තවදුරටත් නියම කරනුයේ ඉදිරියට ලෙන යනු ලබන අස්පෘශ්‍ය වත්කම් වල අගය මිණුම් කරනු ලබන ආකාරය සහ අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් හෙළි කළ යුතු සමහර හෙළිදරව් කිරීම් පිළිබඳවයි. අස්පෘශ්‍ය වත්කමක් මුලින් ම එහි පිරිවැයෙහි අගයෙන් මූල්‍ය ප්‍රකාශණ වල හඳුනා ගත යුතු අතර පහත සඳහන් නිර්නායකයන් සම්පූර්න විය හොත් පමණි.

- අස්පෘශ්‍ය වත්කමෙහි නිර්වචනයට වත්කම සුදුසුකම් සපිරිය යුතුයි. විශේෂයෙන් ව්‍යාපාරයේ කීර්තිනාමයෙන් පැහැදිලිව වෙනස කැපී පෙනෙන මෙන්ම පාලනයට යටත් වන හඳුනා ගත හැකි වත්කමක් තිබිය යුතුය.
- වත්කමට අදාල යයි සැලකෙන අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒම
- වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැණිය හැක. LKAS 38 වල අභ්‍යයන්තරව උත්පාදනය කළ අස්පෘශ්‍ය වත්කම් හඳුනා ගැනීම සඳහා අතිරේක නිර්නායකයන් ඇතුලත් කර ඇත. හඳුනා ගැනීම සඳහා අතිරේක නිර්නායකයන් අනුව සියළු පර්යේෂණවලට අදාල වියදම් වියදම් වශයෙන් හඳුණාගත යුතුය. ඒ හා සමානව ආරම්භක වියදම් පුහුණු වියදම් සහ ප්‍රචාරක වියදම් සම්බන්ධයෙන් ද කටයුතු කෙරේ. LKAS 38 මගින් අභ්‍යයන්තරව උත්පාදනය කළ වෙළඳ නාම ප්‍රකාශන හිමිකම් ගනුදෙනුකරුවන් ගේ නාම ලේඛණ වැනි කීර්ති නාම හඳුණා ගැනීම විශේෂයෙන් තහනම් කරනු ලැබ ඇත කෙසේ වෙතත් සමහර සංවර්ධන වියදම් තුලින් නිර්වචිත නිර්නායකයන් සැපුරු කල (උදාහරණ - අභ්‍යයන්තරව

උත්පාදනය කළ පරිගණක මෘදුකාංග) අස්පෘශ්‍ය වත්කමක් හඳුණා ගැණීම සිදුවේ. මුල්‍ය ප්‍රකාශණ වල මූලික හඳුණා ගැනීම තුලින් අස්පෘශ්‍ය වත්කමක් පහත සඳහන් ක්‍රම දෙකින් එකකින් මැනිය යුතුය.

- මිනුම් ලකුණු ක්‍රමය - ඓතිහාසික පිරිවැයෙන් ක්‍රමක්ෂය සහ හානිකරණ අලාභ අඩුකිරීම
- අවසරලත් විකල්ප ක්‍රමය - ප්‍රත්‍යාගණන අගයෙන් (සාධාරණ අගය පදනම් කර ගෙන) ක්‍රමක්ෂය සහ හානිකරණ අලාභ අඩුකිරීම.

අස්ථිත්තවයක අස්පෘශ්‍ය වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය සීමිත එකක් ද නැතහොත් අසීමත එකක් ද යන්න තක්සේරු කල යුතුය. අස්පෘශ්‍ය වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය සීමිත එකක් නම් කාල පරිච්ඡේදය නැතහොත් නිෂ්පාදන සංඛ්‍යාව හෝ එවැනි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා පිහිටන සමාන සමන්විත ඒකක සංඛ්‍යාව දැක්විය විය යුතුය.

අස්ථිත්තවයක් විසින් අස්පෘශ්‍ය වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය අසීමිත එකක් යයි සැලකිය යුතු වන්නේ සියළුම අදාළ සාධක වල විග්‍රයක් පදනම් කර ගැනීමෙන් පසු එම වත්කමෙන් අස්ථිත්තවයට අපේක්ෂිත ශුද්ධ මුදල් උත්පාදන ප්‍රවාහ කාල පරිච්ජ්ඡේදයේ ජේන තෙක් මානයක සීමාවක් පෙනෙන්නට නැති කල් හිය. සීමිත ප්‍රයෝජනවත් ජීවිත කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් නිර්වචිත කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ. අසීමිත ප්‍රයෝජනවත් ජීවිත කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වාර්ෂික පදනමක් මත හාණිකරණය සඳහා LKAS 36 අනුව පිරික්සනු ලැබේ.

## LKAS 40 - ආයෝජන දේපළ

- ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 40 මගින් සියළුම ව්‍යවසායන් ට අයත් ආයෝජන දේපළ ආවරණය කරන අතර ආයෝජන දේපළ සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් කටයුතු කරන ව්‍යවසායන් ට පමණක් සීමා නොවේ. ආයෝජන දේපළ යනු බදු කුලී ඉපයිම හෝ ප්‍රාග්ධන වටිනාකම වැඩිවීම හෝ ඒ දෙකම සඳහා (අයිතිකරුවන් විසින් හෝ මුල්‍ය කල් බදු යටතේ බදු ගැණුම් කරු විසින්) තබා ගෙන ඇති පහත සඳහන් දෑ සඳහා හැර දේපළ (ඉඩම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ල්ක කොටසක් හෝ දෙකම) වේ. අස්ථිත්වයක් විසින් සියළුම ආයෝජන දේපළ සඳහා සාධාරණ වටිනාකම් ආකෘතිය හෝ පිරිවැය ආකෘතිය තෝරාගත යුතුය.
- සාධාරණ වටිනාකම් ආකෘතිය :ආයෝජන දේපළ සාධාරණ වටිනාකම මත මැණිය යුතු වන අතර සාධාරණ වටිනාකමේ ඇතිවන වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශණයේ හඳුණා ගෙන ප්‍රකාශ කළ යුතුය.
- පිරිවැය ආකෘතියඃ (ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 16 හි මිණුම් ලකුණු ප්‍රතිකර්මය හා සමානයඃ දේපල පිරියත හා උපකරණ)ඃ ආයෝජන දේපළ ක්ෂය කොට ලියා හරින ලද පිරිවැයෙන් මිණුම් කරණය කළ යුතු වන අතර සම්මුචිත හාණිකරණ අලාභ වල අගය අඩු කිරිමෙන් පසු එසේ කළ යුතුය. පිරිවැය ආකෘතිය තෝරා ගන්නා අස්ථිත්වයක් සිය ආයෝජන දේපළෙහි සාධාරණ වටිනාකමේ අගය හෙලි දරව් කල යුතුය. අස්ථිත්වයක් විසින් තෝරා ගන්නා ආකෘතිය සිය සියළු ආයෝජන දේපළ සඳහා යොදා ගත යුතුය.

## SLFRS 1: ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත SLFRS මුල්වරට සම්මත කර ගැනීම

මෙම SLFRS 1 හි අරමුණ අස්ථිත්වයක විසින් ශ්‍රී ලංකා මුල්‍ය වාර්තා කරණ ප්‍රමිතීන් මුල් වරට උපයෝගි කර ගනිමින් මුල්‍ය ප්‍රකාශන පිලියෙළ කොට ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටිය නියම කිරීමයි. මෙම SLFRS හි අරමුණ අස්ථිත්වයක පලමු මුල්‍ය ප්‍රකාශණ සහ එම මුල්‍ය ප්‍රකාශණ ආවරණ කරන කාල පරිච්ඡේදයේ කොටස් සඳහා වූ එහි අතුරු මුල්‍ය වාර්තා ඉහළ ගුණාත්මක භාවයකින් යුක්ත තොරතුරු ඇතුලත් ව පරිශීලකයන්ට විනිවිද භාවයකින් යුක්ත සහ ඉදිරි පත් කරන සියළුම කාල පරිච්ඡේදයන් පුරා සංසන්දනය කිරීමේ හැකියාව සහ ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත ප්‍රකාර ගිණුම් කරණය සඳහා යෝග්‍ය ආරම්භක ලක්ෂයක් සලසා දිම සහ ප්‍රතිලාභ ඉක්මවා නොයන පිරිවැයකට ජනනය කිරීමට හැකියාව තහවුරු කිරීමයි.

## SLFRS 3: ව්‍යාපාර සංයෝජන

මෙම් ඛත්‍ඝී 3 හි අරමුණ වන්නේ ව්‍යාපාර සංයෝජන සහ එහි බලපෑම පිලිබඳව වාර්තා කරණය කරනු ලබන අස්ථිත්වයක් විසින් එහි මුල්‍ය ප්‍රනාශණයන් හි සපයනු ලබන තොරතුරු වල අදාලවත්ය විශ්වාසදායකවත්ය සහ සංසන්දනාත්මක බව වඩා යහපත් ත්ත්වයකට පත් කිරීමයි. මෙය සම්පූර්ණ කර ගැනීමට මෙම ශ්‍රී ලංකා මුල්‍ය වාර්තා ප්‍රමිතය අත්පත් කරණු ලබන්නා ගේ කටයුතු කල යුතු ආකාරය සඳහා මූල ධර්ම හා අවශ්‍යතාවයන් ප්‍රතිශඨානය කරයි .

එහි මුල්‍ය ප්‍රකාශණයන් අත්පත්කර ගත් හඳුණා ගන්නා ගේ වත්කම් පවරා ගන්නා ගේ වගකිම් සහ අත්පත් කර ගැනීමට භාජනය වන්නාගේ පාලනයට යටත් නොවන හිමිකම් හඳුණා ගැනිම සහ මිණුම් කිරිම සහ ව්‍යාපාර සංයෝජනයක දී අත්පත්කර ගන්නා කීර්ති නාමය හෝ කේවල් කර මිල දී ගැනිමක් මගින් වන ප්‍රතිලාභ හඳුණා ගැනිම සහ මිණුම් කිරිම සහ ව්‍යාපාර සංයෝජනයක දී ස්වාභය සහ මුල්‍ය බලපෑම් අගැයීමට, මුල්‍ය ප්‍රකාශණ පරිශිලනය කරන්නන්ට හෙළි කළ යුතු තොරතුරු මොනවා දැයි නිශ්චය කිරීම ප්‍රතිශඨානය කරනු ලබන මූල ධර්ම හා අවශ්‍යතාවයන් වේ.

### ප්‍රධාන නිර්වචනය - ව්‍යාපාර සංයෝජනය

ව්‍යාපාර සංයෝජනය යනු පවරා ගන්නෙකු විසින් ව්‍යාපාර එකක හෝ ඊට වැඩි ගනනක පාලනය ලබා ගැණීමේ අදහසින් කරනු ලබන ගනුදෙණුවක් හෝ සිදුවීමකි. ව්‍යාපාරයක් යනු ආයෝජිකයින්ට හෝ අනිකුත් අයිතිකරුවන් ට හෝ සමාජිකයින්ට හෝ සහභාගිවන්නන්හට සෘජුවම ලාභාංශ,පිරිවැය

# ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත SLFRS/LKAS

අවම කිරිම හෝ වෙනත් ආර්ථික ප්‍රතිලාභ ස්වරූපයෙන් ප්‍රතිලාභයක් ලබාදීමේ අරමුණින් මෙහෙය වීමේ සහ පාලනය කිරීමේ හැකියාව ඇති ඒකිනෙකට සම්බන්ධ වූ ක්‍රියාකාරකම් සහ වත්කම් සමූහයකි.

### SLFRS 7: මූල්‍ය සාධන පත්‍ර හෙළිදරව් කිරීම

මෙම SLFRS 7 අනුව පහත සඳහන් හෙළිදරව් කිරීම් අවශ්‍ය කෙරේ.

අ) අස්ථිත්වයේ මූල්‍ය තත්තවය සහ කාර්යය සාධනය සඳහා මූල්‍ය සාධන පත්‍රවල වැදගත්කම

ආ) මූල්‍ය සාධන පත්‍ර අවදානමට නිරාවරණය වීම පිළිබඳව ණය අවදානම, ද්‍රව ශීලතා අවදානම සහ වෙළඳපොළ අවදානම යන නියමිත අවම හෙළිදරව් කිරීම් ඇතුලත්ව ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු හෙළිදරව් කිරීම්

ඇ) අස්ථිත්වයක් විසින් සිය මූල්‍ය සාධන පත්‍ර සමාන පන්ති වලට කාණ්ඩ කල යුතු වන අතර හෙළිදරව් කිරීම් අවශ්‍ය වන විට පන්තින් අනුසාරයෙන් හෙළිදරව් කිරීම් කළ යුතුය.

එම වර්ග පහත සඳහන් ය.

අ) ලාභාලාභ ගිණුම හරහා සාධාරන වටිනාකම් අගය මත තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් වෙන් වෙන් ව දක්වමින්
   (i) මුලින් ම හඳුණා ගත් වශයෙන් නම් කරන ලද සහ
   (ii) LKAS 39 අනුව වෙළඳ කටයුතු සඳහා රඳවා ගෙන ඇති වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම්

ආ) කල් පිරීම සඳහා ඇති ආයොජන

ඇ) ණය සහ ලැබිය යුතු දෑ

ඈ) විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්

ඉ) ලාභාලාභ ගිණුම හරහා සාධාරන වටිනාකම් අගය මත තක්සේරු කරන ලද මූල්‍ය වගකීම් වෙන් වෙන් ව දක්වමින්

(i) මුලින් ම හඳුණා ගත් වශයෙන් නම් කරන ලද සහ
(ii) LKAS 39 අනුව වෙළඳ කටයුතු සඳහා රඳවා ගෙන ඇති වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති මූල්‍ය වගකීම්

ඊ) ක්‍රමක්ෂය කරන ලද පිරිවැය මත මිණුම් කරණ ලද මූල්‍ය වගකීම්

### LKAS 1 - මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත බණ්ඩ 1 මගින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ පදනම විස්තර කිරිම කෙරේ.මෙම ප්‍රමිතය මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ සමස්ථ අවශ්‍යතාවයන් මූල්‍ය ප්‍රකාශ වල ව්‍යුවහය සඳහා මඟ පෙන්වීම සහ මූල්‍ය ප්‍රකාශ වල අන්තර්ගතයෙහි අඩංගු අවම අවශ්‍යතාවයන් විස්තර කරයි.

LKAS 1 මගින් ශේෂ පත්‍ර සහ විස්තීර්ණ අදායම් ගිණුම් වල මුහුණත මත දක්විය යුතු අවම විස්තර මට්ටම නියම කෙරේ. තව ද, සාධාරණ ඉදිරිපත් කිරීම, උපචිත පදනමින් ගිණුම්කරණය, ඉදිරිපත් කිරීමේ සංගත භාවය, සැලකිය යුතු භාවය, සම්මුචිත භාවය හා සංසන්දනාත්මක භාවයෙන් තොරතුරු සැපයීම වැනි සමස්ථ අවශ්‍යතාවයන් නිර්වචනය කෙරේ.

මූලික මූල්‍ය ප්‍රකාශ වල අඩංගු විය යුතු මූලිකාංග හතරක් බණ්ඩ 1 මගින් නිර්වචනය කෙරෙන අතර ඒවායේ අවම ව්‍යුවහය හා එක් එක් අංගයන්හි අන්තර්ගතය ද නියම කෙරේ:

- කාල පරිච්ඡේදය සඳහා වන මූල්‍ය තත්ත්වය දක්වන ප්‍රකාශය (ජංගම සහ ජංගම නොවන වශයෙන් වෙන් කරන ලද)
- කාල පරිච්ඡේදය සඳහා වන විස්තීර්ණ අදායම් ප්‍රකාශය
- කාල පරිච්ඡේදය සඳහා වන ස්කන්ධයෙහි වෙනස්වීම් දක්වන ප්‍රකාශය
- කාල පරිච්ඡේදය සඳහා වන මුදල් ප්‍රවාහය දක්වන ප්‍රකාශය (LKAS 7)

විස්තීර්ණ අදායම් ප්‍රකාශය සඳහා අස්ථිත්වයක් විසින් හඳුණාගත් සියළු ආදායම් හා වියදම් අයිතමයන් පහත සඳහන් පරිදි ඉදිරිපත් කල යුතුය.

අ) විස්තීර්ණ අදායම් ප්‍රකාශය වශයෙන් තනි ප්‍රකාශයකින් හෝ

ආ) ප්‍රකාශන දෙකකින් :ලාභාලාභ සංරචක දක්වෙන ප්‍රකාශයකින් (වෙනම ආදායම් ප්‍රකාශයක්) සහ අනෙක් විස්තීර්ණ අදායම් වල සංරචක දක්වමින් ලාභය හෝ අලාභ ශේෂයන්ගෙන් ආරම්භ වන දෙවන ප්‍රකාශයකින් (විස්තීර්ණ අදායම් ප්‍රකාශය)

කාල පරිච්ඡෙදයක් සඳහා වන ලාභය හෝ අලාභ ශේෂයන් සමග එම කාලය සඳහා වන අනෙකුත් හඳුණාගත් ආදායම් අයිතමයන් විස්තීර්ණ අදායම් ප්‍රකාශයක් තුල අඩංගු විය යුතුය. අනෙකුත් විස්තීර්න ආදායම් වල සංරචක අතර පහත සඳහන් දේ ද අඩංගු වේ.

- ප්‍රත්‍යාගණන අතිරික්ත වල වෙනස්කම් (LKAS 16 හා LKAS 38)
- LKAS 19 හි 93 A ඡේදය අනුව හඳුණාගත් නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ සහ අලාභ
- විදේශීය මෙහෙයුමක මූල්‍ය ප්‍රකාශන පරිවර්තනය කිරීම තුළින් පැන නගින ලාභ සහ පාඩු
- විකිණීම සඳහා තබා ගෙන ඇති මූල්‍ය වත්කම් නැවත මිණුම්කරණයේ දී ඇති වන ලාභ සහ පාඩු (LKAS 39)
- ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහයෙහි ඉදිරි රැකුම් සාධන පත්‍ර මත ඇති වන ලාභ සහ පාඩු වල ඵලදායි කොටස

## LKAS 2 – තොග

ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත LKAS 2 මගින් ඓතිහාසික පිරිවැය ක්‍රමය යටතේ තොග සඳහා ගිණුම් කරණ ක්‍රම නියම කරනු ලැබේ. තොග වල පිරිවැය තීරණය කිරීම සඳහා හා ශුද්ධ උප ලබ්ධි වටිනාකමට ලියා හරින ලද වටිනාකම ඇතුළුව පසුව වියදමක් වශයෙන් හඳුණා ගැනීම සඳහා මග පෙන්වීමක් සැපයීම මෙම ප්‍රමිතයෙන් සිදු කෙරේ. තොග සඳහා පිරිවැය තීරණය කරන පිරිවැය සූත්‍ර පිළිබඳව මග පෙන්වීමක් ද මෙමගින් සැපයෙයි.

සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කිරීමේ දී විකිණීම සඳහා තබා ඇති වත්කම් (නිම වූ භාණ්ඩ), සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කිරීමේ දී විකිණීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලියේ ඇති වතකම් (නොනිමි භාණ්ඩ), සහ නිෂපාදන ක්‍රියාවලියේ දී උපයෝගී කර ගනු ලබන ද්‍රව්‍ය සහ සැපයුම් (අමු ද්‍රව්‍ය) තොග ගණයට ඇතුලත් වේ. කෙසේ වෙතත්, සමහර තොග වර්ග මෙම ප්‍රමිතය මගින් සිය විෂය පථයෙන් නිදහස් කර ඇත.

- ඉදිකිරීම් කොන්ත්‍රාත් තුළින් පැන නගින නොනිමි වැඩ (ඉදිකිරීම් කොන්ත්‍රාත් - (LKAS 11 බලන්න)
- මූල්‍ය සාධන පත්‍ර (LKAS 39 බලන්න- මූල්‍ය සාධන පත්‍ර)
- පශු සම්පත්, වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන, ඛණිජ සහ ඛණිජ ආශ්‍රිත නිෂපාදන ඒවා ශුද්ධ උප ලබ්ධි අගයට මැණීම කළ තොග වැනි නිෂ්පාදකයින් ගේ තොග (පිරිවැයට ඉහල හෝ පහළ) ස්ථාපිත කර්මාන්ත පිළිවෙත අනුව මැණීම් කළ තොග.

LKAS 2 හි මූලික මූලධර්මය අනුව, පිරිවැයෙන් අඩු අගයෙන් සහ ශුද්ධ උප ලබ්ධි අගයට මිණුම් කරනු ලැබේ. ශුද්ධ උප ලබ්ධි අගය යනු විකුණුම් අගයෙන් තොගය වර්තමාන තත්ත්වයට ගෙන ඒමට සහ විකිණීමට දරූ වියදම අඩු කළ පසු ලැබෙන අගයයි.පිරිවැය යනු තොගය වත්මන් තත්ත්වයට සහ වත්මන් පිහිටි ස්ථානයට ගෙන ඒම සඳහා දරණ ලද සියළු වියදම් ඇතුලත් වියදමකි.යම් නිශ්චිත පිරිවැයක් තීරණය කල නොහැකි නම් මිණුම් ලකුණ ප්‍රතිකර්මය වනුයේ පළමු ගැනීමයි.

තොගයේ පිරිවැය වියදමක් වශයෙන් හඳුණාගනු ලබන්නේ සම්බන්ධිත ආදායම හඳුණාගනු ලබන කාල පරිච්ඡේදයේ දී ය. තොගයේ අගය ශුද්ධ උප ලබ්ධි අගයට ලියා හරිනු ලැබ ඇත් නම්, ලියා හරින ලද අගය වියදමක් වශයෙන් හර කරනු ලැබේ. පසු කාල පරිච්ඡේදයක දී එලෙස ලියා හරින ලද අගය ආපස්සට හැරෙව්වොත්, එම අගය විකුණූ භාණ්ඩ වල පිරිවැය අඩු කරමින් ආදායමට බැර කරනු ලැබේ. පහත සඳහන් විෂයන් අවශ්‍ය කරන හෙළිදරව් කිරීම් වලට ඇතුලත්ය.

- ගිණුම් කරණ ප්‍රතිපත්ති
- කාණ්ඩ අනුව තොග වල ධාරණ අගය
- ආපස්සට හරවන ලද ලියා හරින ලද අගයක්
- වගකීම් සඳහා ඇපයක් වශයෙන් තබන ලද තොග වල ධාරණ අගය
- කාල පරිච්ඡේදය සඳහා වියදමක් වශයෙන් හර කරන ලද තොගයේ පිරිවැය

## LKAS 7 – මුදල් ප්‍රවාහ ප්‍රකාශන

ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත LKAS 7 මගින් අස්ථිත්වයක් විසින් අස්ථිත්වයේ මුදල් සහ මුදල් වලට සමාන දෑ වල ඓතිහාසික වෙනස් වීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශන මාර්ගයෙන් කෙසේ තොරතුරු ඉදිරිපත් කළ යුතු ද යන්න නියම කරයි. කාල පරිච්ඡේදයක් තුළ මුදල් ප්‍රවාහයන් වල ගලා යෑම මෙහෙයුම් ආයෝජන සහ මූල්‍ය වශයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් වර්ගීකරණය කරයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් මුදල් සහ මුදල් වලට සමාන දෑ වල කාල පරිච්ඡේදයක් තුළ සිදු වන්නා වූ වෙනස් වීම් විස්තර කරයි. කාල පරිච්ඡේදයක් තුළ මුදල් ප්‍රවාහයන් වල ගලා යෑම මෙහෙයුම් ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් වශයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් වර්ගීකරණය කළ යුතුයි.

- මුදල් වලට සමාන දෑ කෙටි කාලීන වන අතර සැලකිය යුතු නොවන වටිනාකමෙහි අගය වෙනස් වීමේ අවදානම් වලට භාජනය වන ඉහල ද්‍රව ශීල ආයෝජනයකි.
  **මෙහෙයුම් ක්‍රියාකාරකම්** : සෘජු හා සෘජු නොවන ක්‍රම යොදා ගෙන ඉදිරිපත් කළ හැක. සෘජු ක්‍රමය තුළින් ගණුදෙණු කරුවන්ගෙන් ලැබෙන ලැබීම් පෙන්නුම් කරන අතර සැපයුම් කරුවන් සේවකයින් රජයේ බදු ගෙවීම් යනාදිය පෙන්නුම් කෙරේ.වක්‍ර හෙවත් සෘජු නොවන ක්‍රමය තුළින් උපචිත පදනම අනුව ශුද්ධ ලාභාලාභයෙන් ආරම්භ වන අතර මුදල් නොවන අයතමයන් සඳහා ගැලපීම් සිදු කරනු ලබයි.
- **ආයෝජන ක්‍රියාකාරකම්**: අත්පත් කර ගැනීමෙන් හෝ දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් ඇති වන මුදල් ලැබීම් සහ ගෙවීම් වෙන් වෙන් වශයෙන් හෙළිදරව් කිරීම්; ස්කන්ධය හෝ අනෙක් ආයතන වල ණය සාධන පත්‍ර අත්පත් කර ගැනීමෙන් හෝ විකිණීමෙන් (පරිපාලිතයන් අත්පත් කර ගැනීම හෝ විකිණීම ඇතුලත්ව); තුන් වන පාර්ශවයන්ට දුන් අත්තිකාරම් සහ ණය හෝ තුන් වන පාර්ශවයන් ගෙන් ආපසු ලැබුණ අත්තිකාරම් සහ ණය
- මූල්‍ය ක්‍රියාකාරකම්: කොටස් හෝ අනෙක් ස්කන්ධ ආරක්ෂණ නිකුත් කිරිමෙන් ඇති වන මුදල් ලැබීම් සහ ගෙවීම් වෙන් වෙන් වශයෙන් හෙළිදරව් කිරීම් ; එකී ඇප යනාදිය බේරා ගැනීම සඳහා කරන ලද ගෙවීම්; ණය ඔප්පු පත්‍ර , ණය, ප්‍රෙමිසරි පත්‍ර යනාදිය නිකුත් කිරීමෙන් ලැබුනා වූ මුදල්; සහ අනෙක් ශීර්ෂ දෙකින් එකක් යටතේ නිශ්චිතව හඳුනා ගත නොහැකි නැවත ගෙවීම් ක්‍රියාකාරකම්; මුදල් ප්‍රවාහයන් ට හේතු නොවන ආයෝජන ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහ ප්‍රකාශන (ණය නිකුත් කිරිම් වලින් දේපළ අත්පත් කර ගැණීම් වැනි මූල්‍ය නොවන ගණුදෙනු) වලින් ඉවත් කළ යුතු අතර ඒවා වෙනම පෙන්විය යුතුය.

# ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත SLFRS/LKAS

## LKAS 8 – ගිණුම් කරණ ප්‍රතිපත්ති ගිණුම් කරණ ඇස්ත-මේන්තුවල වෙනස්වීම් හා වැරදි

සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබෙන ලාභ හෝ අලාභ හෝ විශේෂ අයිතමයන් අදායම් ප්‍රකාශයෙහි කෙලෙස ඉදිරිපත් කළ යුතු දැයි මෙම ප්‍රමිතය නියම කරයි.ගිණුම් කරණ ප්‍රතිපත්ති ගිණුම් කරණ ඇස්ත-මේන්තුවල වෙනස්වීම් හා වැරදි සම්බන්ධයෙන් ගිණුම් ගත කළ යුතු ආකාරය ද බණී 8 මගින් නියම කෙරේ. පෙර මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී තිබෙන තොරතුරු පදනම් කර ගනිමින් , වැරදි අළුතින් සොයා ගන්නා ලද වැරදි වශයෙන් හෝ පෙර මූල්‍ය ප්‍රකාශ වල සාවද්‍ය ප්‍රකාශ ලෙෂ නිර්වචනය කරනු ලැබේ.

මුල්ම කාල පරිච්ඡෙද වලට අදාල රඳවා ගන්නා ලද ඉපයීම් වල ආරම්භක ශේෂයන් ගැලපීමෙන් සහ ඉදිරිපත් කරන ලද සියළු පෙර කාල පරිච්ඡෙද සඳහන් කිරීමෙන් සියළු වැදගත් වැරදි පසු කාලයන්ට ද අදාල වන පරිදි ගිණුම් ගත කරනු ලැබේ. ආදායම් වල සම්මුචිත ප්‍රතිපල හඳුණා ගැනීම තහනම් වනු ඇත.

## LKAS 10 – ඉදිකිරිම් කොන්ත්‍රාත්

මෙය මූලික වශයෙන් ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් වල ආර්ථික ප්‍රතිඵල හෙළිදරව් කරන කරුණ කි.

## LKAS 12 - ආදායම් බදු

මෙම ප්‍රමිතයේ අරමුණ වනුයේ ආදායම් බදු සඳහා ගිණුම් කරණ ක්‍රියාවලිය නියම කිරීමයි. පහත සඳහන් අවස්ථා වල දී වර්තමාන සහ ඉදිරි බදු වලින් පැන නගින ප්‍රතිඵල සම්බන්ධයෙන් ගිණුම් කළ යුත්තේ කෙසේ ද යන්න ගිණුම් කරණයේ දී ඇති වන ප්‍රධාන ගැටළුවක් වන්නේය.

- අස්ථිත්ත්වයක ශේෂ පත්‍ර දිනට හඳුණාගත් වත්කම් (වගකීම්) වල ධාරණ අගයෙහි ඉදිරි අයකර ගැනීම් (ගෙවා නිම කිරීම) සහ
- අස්ථිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ වල වත්මන් කාල පරිච්ඡේදයේ හඳුණාගත් ගණුදෙණු සහ අනෙකුත් සිද්ධීන්

ප්‍රධාන නිර්වචනයඃ ප්‍රවර්තන බදුඃකාල පරිච්ඡේදයක් සඳහා බදු අය කළ හැකි ලාභ (බදු පාඩු) සම්බන්ධයෙන් වන ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණය (අය කර ගත හැකි)

විලම්භිත බදු වගකීම්ඃ බද්දට යටත් වන තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් ඉදිරි කාල පරිච්ඡේදයන් තුළ ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණය විලම්භිත බදු වත්කම්ඃපහත සඳහන් අවස්ථා වල දී ඉදිරි කාල පරිච්ඡේදයන් තුළ අය කළ හැකි ආදායම් බදු ප්‍රමාණය

අ) අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්ඃ

ආ) භාවිතා නොකරන ලද බදු බැරකම් වල ධාරණ අගය

## LKAS 16 - දේපල පිරියත හා උපකරණ

මුලින්ම හඳුනා ගැනීම සහ පසුව කරනු ලබන දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ගිනුම් කරණය විය යුතු ආකාරය මෙම බණී 16 ප්‍රමිතය මගින් නියම කෙරේ. දේපල පිරියත හා උපකරණ හඳුණා ගත යුත්තේ පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙනය.

අ) එම වත්කම් තුළන් ඉදිරි ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ප්‍රස්ථාව ඇති විටෙක සහ

ආ) එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැණිය හැකි විට

මුලින්ම කරනු ලබන මිණුම් කරණය කල යුත්තේ පිරිවැය මතය. දෙවනුව මිණුම් ලකුණු ප්‍රතිකර්මය යොදා ගත යුත්තේ ක්ෂය කරන ලද පිරිවැය මතය. එයෙන් අවසරලත් විකල්පය වනුයේ ප්‍රත්‍යාගණන මාදිලිය උපයෝගී කර ගැනීමය (සාධාරණ වෙළඳ අගයට සමාන).

ප්‍රධාන මූල ධර්ම

**ක්ෂය කිරීම්ඃ**

- ඉඩම් නොවන දීර්ග ජීවිත කාලයක් ඇති වත්කම් එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ ක්‍රමානුකූල පදනමක් මත ක්ෂය කළ යුතුය.
- ක්ෂය කිරීම් වල පාදකය වනුයේ වත්කමක ඇස්තුමෙන්තු කරන ලද අවශේෂ අගය පිරිවැයෙන් අඩු කල පසු ලැබෙන අගයයි. වත්කමක ආර්ථික ප්‍රතිලාභ අස්ථිත්වයක් විසින් පරිභෝජනය කරන ආකාරය යොදා ගනු ලබන ක්ෂය ක්‍රමයෙන් පිළඹිබු විය යුතුය.
- වත්කම් ප්‍රත්‍යාගණනයට භාජනය වී ඇත් නම් ක්ෂය කිරීම් පාදක විය යුතතේ ප්‍රත්‍යාගණිත අගයෙනි.
- වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය අවශේෂ අගය සහ ක්ෂය කිරීම් ක්‍රමය වාර්ෂික පදනමක් මත සමාලෝචනය කළයුතු අතර එහි කරනු ලබන්නා වූ වෙනස්කම් පෙර දක්නා ලෙස පෙන්නුම් කළ යුතුය.
- වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය අවසානයේ දී දැරීමට සිදුවන සැලකිය යුතු වියදම් වත්කමෙහි අවශේෂ අගය අඩු කොට පෙන්වීමෙන් හෝ එම පිරිවැය වත්කමෙහි ජීවිත කාලය ඇතුලත වියදමක් වශයෙන් සැලකිය යුතුය.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් අනුව, දනට සම්පූර්ණයෙන් ම ක්ෂය කිරීම් වලට භාජනය කර ඇති මණ්ඩලයට අයත් ඉතා පැරණි වාහන දන් රජයේ තක්සේරු කරු විසින් වටිනාකම තක්සේරු කර ගෙන යන අතර වටිනාකම සම්බන්ධ තක්සේරු වාර්තා ලැබුණ විගස, එයට අදාළ සටහන් ගිණුම් පොත්පත් වල තබනු ඇත .
- පිරිවැය අකෘතිය භාවිතා කරන්නේ නම් , දේපල පිරියත හා උපකරණ අයිතමන් හි මුළු පිරිවැයට සාපේක්ෂව දේපල පිරියත හා උපකරණ වත්කම් වල එක් එක් අයිතමයන් හි කොටස් වල පිරිවැය සැලකිය යුතු ප්‍රමාණයක් නම්, අයිතමයේ පිරිවැය වෙනමම ක්ෂය කළ යුතුය.( සංරචක ප්‍රවේශය 11)

* පහත සඳහන් ක්ෂය කිරීම් අනුපාතයන් ස්ථිර වත්කම් සම්බන්ධයෙන් පසු ගිය වසරේ දී අනුගමනය කොට ඇත .

| වත්කම් වර්ගය | ක්ෂය කිරීම් අනුපාතයන් |
|---|---|
| ගොඩනැගිලි | 05% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 10% |
| වතු උපකරණ | 05% |
| කාර්යාල උපකරණ | 20% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |
| ව්‍යුවහයන | 05% |
| වාහන | 10% |

* කිරි හරක් ආනයනය කිරීමේ ව්‍යාපෘතියට අදාල වැඩ කටයුතු 2012 වසරේ දී ආරම්භ වූ බැවින් , එම කිරි හරක් සහ එයට අදාල සමහර උපකරණ එම ස්ථානවලට ගෙනෙන ලද්දේ විවිධ අවස්ථාවන් වලදීය. ඒ අනුව මණ්ඩලීය ප්‍රතිපත්තිමය තීරණයක් මත, එම වත්කම් භාවිතා කිරීමේ කාල පරිච්ඡේදය අනුව ක්ෂය කිරීම් කටයුතු කිරීමට ජාතික පශු සම්පත් මණ්ඩලය තීරණය කර ඇත .

**ප්‍රත්‍යාගණනය කිරීම් (අවසර ලත් විකල්ප)**

* ශේෂ පත්‍ර දිනයට සාධාරණ වටිනාකම උපයෝගී කර ගනිමින් අගයන් තීරණය කරනු ලබන වත්කම් වල අගයෙන් ධාරණ අගයන් සැලකිය යුතු ආකාරයෙන් වෙනස් නොවන සේ ප්‍රත්‍යාගණනයන් ප්‍රමාණවත් නිත්‍යතාවයකින් සිදු කල යුතුය.
* දේපල පිරියත හා උපකරණ වත්කම්වල එක් අයිතමයක් ප්‍රත්‍යාගණනය කරනු ලැබ ඇත්තේ නම්, එම වත්කම අයත් සම්පූර්ණ පංතියම ප්‍රත්‍යාගණනය කළ යුතුය. (තෝරා ගත් අයිතමයන් සඳහා ප්‍රත්‍යාගණනයන් වලට ඉඩ දෙනු නොලැබේ.
* ආදායමට පෙර කරන ලද හර අයිතමයක් ආපස්සට හැරවීමක් වන්නේ නම් මිස අනෙක් අවස්ථාවන් වල දී ධනාත්මක ප්‍රත්‍යාගණනයන් ස්කන්ධ ගිණුමට බැර කළ යුතුය.
* ස්කන්ධයට පෙර කරන ලද බැර අයිතමයක් ආපස්සට හැරවීමක් වන්නේ නම් මිස වටිනාකම තක්සෙරු කිරීම් වල අගය අඩු වීම් වල දී එය ආදායමට අය කළ යුතුය. (ප්‍රත්‍යාග ණන අතිරික්ත)
* ප්‍රත්‍යාගණිත වත්කමක් විකුණූ කල හෝ වෙනත් ආකාරයෙකින් බැහැර කළ හොත් ඉතිරි වන්නා වූ ප්‍රත්‍යාග ණන අතිරික්ත රඳවා ගන්නා ඉපයීම් වලට සෘජුවම මාරු කරනු ලැබේ ( ආදායම් ප්‍රකාශ හරහා නොවේ).
* ප්‍රත්‍යාගණන අතිරික්ත අකෘතිය භාවිතා කරන්නේ නම්, ස්කන්ධයෙහි අඩංගු ප්‍රත්‍යාගණන අතිරික්ත අයිතම යෙන් අයිතම පදනම මත පාලනය කළ යුතුය.
* වත්කමක අයකර ගත හැකි අගය එහි ධාරණ අගයට වඩා අඩු වේ නම් එම අඩු වීම හඳුණාගෙන ආදායම් ගිණුමට අය කල යුතුය ( ස්කන්ධයට පෙර කරන ලද බැර අයිතමයක් ආපස්සට හැරවීමක් වන්නේ නම් මිස). වත්කමක් බැහැර කිරීමක දී හෝ විශ්‍රාම ගැන් වීමක දී ඇති වන ලාභය හෝ අලාභය ගණනය කල යුත්තේ ධාරණ අගය හා සැසඳීමකිනි.අවශ්‍ය කරන හෙළිදරව් කිරීම් වල චලනයන් ගේ සැසඳීම් ඇතුලත්ය.
* ප්‍රාග්ධන වගකීම්
* ඇප වහයෙන් තබා ඇති අයිතමයන්
* වත්කම් ප්‍රත්‍යාගණනය කර ඇත් නම් ඓතිහාසික පිරිවැය හෙළිදරව් කිරීම
* ප්‍රත්‍යාගණන අතිරික්තයන් හි වෙනස්කම්

## LKAS 17 - කල් බදු

කල් බදු දෙවර්ගයක් සැලකිල්ලට ගැනේ.

* කල් බද්දක අයිතියට අදාළ සියළුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරම් පවරයි නම් එය මූල්‍ය කල් බද්දක් ලෙස වර්ග කෙරේ.
* අන් සියළු කල් බදු මෙහෙයුම් කල් බදු ලෙස වර්ග කෙරේ.

භාවිතා රන්නා ගේ ප්‍රතිලාභ කාල රටාව, වඩාත් හොඳින් නියෝජනය කරන වෙනත් ක්‍රමවත් පදනමක් ඇත්නම් හැර, මෙහෙයුම් කල් බද්දක් යටතේ කල් බදු ගෙවීම්, කල් බදු වාරය තුල , සරල මාර්ග පදනම මත වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගත යුතුය.

### මූල්‍ය කල් බදු

**මූල්‍ය කල් බදු ගැණුම් කරු සඳහා ගිණුම් කරණය**

* කල් බදු ගැණුම්කරුවෙකු විසින් අවම කල් බදු ගෙවීම වල වර්තමාන වටිනාකම සහ සාධාරණ වටිනාකමෙහි පහල කෙලවර අගයකින් මූල්‍ය කල් බද්දක් ප්‍රාග්ධනනය කළ යුතුය.
* කල් බදු ගෙවීම් පහත සඳහන් ආකාරයට වර්ග කල යුතුය. 1) වගකීම්වල අඩු වීම සහ 2) වගකීම අඩු වන ආකාරයට සැලසුම් කල අඩුවන මූල්‍ය ගාස්තු
* අවසානයේ දී අයිතිය පිලබඳ සාධාරණ සහතිකයක් නැතිනම් මිස කල් බදු ගැණුම් කරුවෙකු විසින් කල් බදු වත්කම් මත ක්ෂය කිරීම් කළ යුත්තේ වත්කමෙහි ප්‍රයෝජනවත් කාලය භාවිතා කරමින්ය. දෙවැනි අවස්ථාවේ දී වත්කමෙහි ප්‍රයෝජනවත් කාලය සහ කල් බදු කාලය යන දෙකින් කෙටි කාලය භාවිතා කල යුතුය.
* කල් බදු ගැණුම් කරුවෙකු විසින් කල බදු වියදම් උප කල් බදු සහ කල් බදු සම්බන්ධ එකගතා විස්තර ද හෙළිදරව් කල යුතුය.
* කල් බදු ගැණුම් කරුවෙකු විසින් මෙහෙයුම් කල් බදු ගෙවීම් දැරිය යුතුය.

# ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත SLFRS/LKAS

**කල් බදු දීමනා කරුවෙකු සඳහා වන ගිණුම් කරණය**

- කල් බදු දීමනා කරුවන් සඳහා මුල්‍ය කල් බදු ලැබිය යුතු දෑ වශයෙන් ගිණුම් තැබිය යුතු අතර කල් බදු ආදායම් හඳුණා ගත යුත්තේ කාලයෙන් කාලයට ලැබෙන නියත ප්‍රතිලාභ අනුපාතිකය අනුවය.
- ඉදිරි අවම බදු කුලී සහ ශුද්ධ ලාභාලාභ ගිණුම් වල ඇතුලත් අසම්භාව්‍ය කුලී බදු පිළිබඳව තොරතුරු කල් බදු දීමනා කරුවන් විසින් හෙළිදරව් කල යුතුය.
- කල් බදු දීමනා කරුවන් විසින් මුල්‍ය ආදායම් වෙන් කිරීම සඳහා ශුද්ධ ආයෝජන ක්‍රමය භාවිතා කල යුතුය. ශුද්ධ මුදල් ආයෝජන ක්‍රමය සඳහා දැන් අවසර දෙනු නොලැබේ

## LKAS 18 - අයභාර

මෙම බණී 18 ප්‍රමිතයේ අරමුණ වනුයේ භාණ්ඩ විකුණුම් සේවාවන් සැලසීම පොලී හිමිකම් සහ ලාභාංශ වැනි ගනුදෙනු සහ සිද්ධීවලින් ඇති වන අයභාර පිළිබඳව අනුගමනය කල යුතු ගිණුම් කරණ ක්‍රම වේදය නියම කිරීමයි.

ප්‍රධාන නිර්වචනයඃඅයභාරයඃ අසතිත්වයක් තුළ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ( භාණ්ඩ විකුණුම් සේවාවන් සැලසීම පොලී හිමිකම් සහ ලාභාංශ වැනි) දළ ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම් ( මුදල් ලැබිය යුතු දෑ සහ අනෙකුත් වත්කම් )

### අයභාර මැණිම

ලැබුණු ප්‍රතිශ්ඨාවේ සාධාරණ අගය මත අයභාර මැණිය යුතුය අය භාර ජනිත කරන එක සමාන වටිනාකමෙන් සහ ස්වාභාවයෙන් යුක්ත භාණ්ඩ සහ සේවා හුවමාරු කර ගැණීම් ගණුදෙනු වශයෙන් සලකනු නොලැබේ. කෙසේ වෙතත් අසමාන අයිතමයන් හුවමාරු කර ගැණීම් අය භාර ජනිත කරන ගණුදෙනු වශයෙන් සලකනු ලැබේ.

මුදල් හෝ මුදල් වලට සමාන දෑ වල ගලා ඒම විම්භනය කල හොත් ලැබිය යුතු ප්‍රතිශ්ඨාව ලැබීමට නියමිත මුදල් හෝ මුදල් වලට සමාන දෑ වල නාමික ප්‍රමාණයට වඩා අඩුවන අතර වට්ටම් දීම සුදුසු වනු ඇත උදාහරණයක් වශයෙන් මෙය සිදු විය හැක්කේ විකුණුම්කරු විසින් පොලී රහිත ණය පහසුකම් ගැණුම්කරුට විටක දී හෝ වෙළඳ පොලට අඩු පොලී අනුපාතිකයක් අය කරන විටක දීය. වෙළඳ පොල අනුපාතිකයන් අනුව පොලිය සැලකිල්ලට ගත යුතුය.

## LKAS 18 - අයභාර ප්‍රමිතය අනුව පහත සඳහන් හෙළිදරව් කිරීම් අවශ්‍ය කෙරේ.

- අයභාර හඳුණා ගැනීම සඳහා ගිණුම් කරණ ප්‍රතිපත්ති
- පහත සඳහන් එක් එක් අයභාර වර්ග වල ප්‍රමාණය
- භාණ්ඩ විකුණුම්
- සේවාවන් සැපයීම
- පොලිය
- හිමිකම්
- ලාභාංශ
- එම එක් එක් වර්ග තුළ භාණ්ඩ හෝ සේවා හුවමාරු කිරීම් වලින් ලැබුන අයභාර ප්‍රමානය එක් එක් වර්ග වල අයභාර හඳුණා ගැණිමේ නිර්නායකයන් සපුරාලීම සඳහා LKAS 18 - අයභාර ප්‍රමිතය අනුව කටයුතු කිරීම වැදගත් වේ.

## LKAS 19 - සේවක ප්‍රතිලාභ

මෙම LKAS 18 ප්‍රමිතයේ අරමුණ වනුයේ සේවක ප්‍රතිලාභ හෙළිදරව් කිරීම සඳහා ගිණුම් කරණ ක්‍රම වේද නියම කිරීමයි (සේවකයින් විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ව්‍යාපාරයක් විසින් දෙනු ලබන සියළුම ආකාරයේ වන්දි මුදල්). මෙම ප්‍රමිතයේ සමස්ථ අවශ්‍ය විස්තර වල අවධාරණය කරනු ලබන මූල ධර්මය වනුයේ සේවකයින්ට දෙනු ලබන ප්‍රතිලාභ වල පිරිවැය සේවකයා විසින් එම ප්‍රතිලාභ උපයන කාල පරිච්ඡෙදයේම හඳුණා ගත යුතු වන අතර එය ගෙවිය යුතු හෝ ගෙවූ කාල පරිච්ඡෙදයේ නොවිය යුතු ය.

## LKAS 20 - රාජ්‍ය ප්‍රදාන සඳහා ගිණුම් කරණ සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම

මෙම LKAS 20 ප්‍රමිතයේ අරමුණ වනුයේ රාජ්‍ය ප්‍රදාන සහ අනෙකුත් ආකාරයේ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම සඳහා ගිණුම් කරණ නියම කිරීමයි.

ජාතික පශු සම්පත් මණ්ඩලයේ රජයේ ප්‍රදානයන් LKAS 41 – කෘෂිකර්මය යටතේ ගිණුම් කොට ඇත.

## LKAS 27 - ඒකාබද්ධ සහ වෙන් වශයෙන් වූ මුල්‍ය ප්‍රකාශණ

බණී 27 ප්‍රමිතය පරිපාලිතයක සංකල්පය නිර්වචනය කරනු ලබන්නේ තවත් මව් ව්‍යාපාරයක් විසින් පාලනය කරනු ලබන සමාගමක් වශයෙනි. මව් ව්‍යාපාරයකට එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක පරිපාලිතයන් තිබෙන විට ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම අවශ්‍ය වේ. බණී 27 ප්‍රමිතයෙන් ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම පහත සඳහන් නිර්නායකයන් ඉදිරිපත් කෙරේ.

- සියළු පරිපාලිතයන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වල ඇතුලත් කල යුතු වේ. පොදු නොවන සමහර අස්තිත්වයන් හට සීමා සහිත වූ ව්‍යතිරේකයක් ඇත .
- ඒකාබද්ධ පරිපාලිතයන් ගේ වාර්තාකරන දිනය හා මව් සමාගමෙහි වාර්තාකරන දිනය අතර වෙනස මාස තුනකට වඩා නොවැඩිය යුතු අතර මෙම කාල පරිච්ඡේදය තුල සිදු වූ වැදගත් හා සැලකිය යුතු ගණුදෙනු හෝ ගැලපීම් වාර්තාකොට තැබිය යුතුය.
- මව් සමාගමෙහි සහ පරිපාලිතයන් හි ඒකකාර ගිණුම් කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කළ යුතුය.
- මව් සමාගමේ වෙන් වශයෙන් සකසන ලද මූල්‍ය ප්‍රකාශ වල බණී 39 අනුව පරිපාලිතයන් පිරිවැය අගයෙන් හෝ සාධාරණ වටිනාකමේ අගයෙන් පෙන්විය හැක.
- පහත සඳහන් අයිතම අවශ්‍ය කරන හෙළිදරව් නිරීම් වලට ඇතුලත් වේ.
- එක් එක් සැලකිය යුතු පරිපාලිතයන් වල නම රට අයිතිය සහ ඡන්ද බල ප්‍රතිහතය
- පරිපාලිතයක් ඒකාබද්ධ නොකිරීමට හේතු
- ඒකාබද්ධ පරිපාලිතයක මව් සමාගමට සියයට පනහකට වඩා ඡන්ද බලයක් නැත් නම් සම්බන්ධතාවයේ ස්වාභාවය
- ඒකාබද්ධ කිරීමෙන් බැහැර කල පරිපාලිතයක මව් සමාග මට සියයට පනහකට වඩා ඡන්ද බලයක් නැත් නම් සම්බන්ධතාවයේ ස්වාභාවය
- මෙම කාලය තුළ පරිපාලිතයන් අත්පත් කිරීම් වල සහ විකිණීම් වල ප්‍රතිඵල

මව් සමාගමේ වෙන් වශයෙන් සකසන ලද මූල්‍ය ප්‍රකාශ වල පරිපාලිතයන් සඳහා ගිණුම් තැබීම් ක්‍රමය විස්තර කල යුතුය.

## LKAS 32 - මූල්‍ය සාධන පත්‍ර ඉදිරිපත් කිරීම

මෙම LKAS 32 ප්‍රමිතයේ අරමුණ වනුයේ ව්‍යවසායකයේ මූල්‍ය තත්ත්වය, කාර්යය සාධනය සහ මූල්‍ය ප්‍රවාහයට ශේෂ පත්‍රය මත සහ ශේෂ පත්‍රයෙන් බැහැර මූල්‍ය පත්‍ර වල වැදගත්කම පිළිබඳව පරිශිලනය කරන්නන් ගේ අවබෝධය තවදුරටත් වැඩි දියුණු කිරීමයි.

## LKAS 33 - කොටසක ඉපැයුම්

කොටසක ඉපැයුම් වල මිණුම්කරණය හා හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් මෙම LKAS 32 ප්‍රමිතය විස්තර කරනු අතර කිසිම නිශ්චිත ව්‍යවසාය සම්පත් සැලසුම් විසඳුම් ක්‍රමයකින් මෙයට සහයක් නොලැබේ.

## LKAS 36 - වත්කම් හානිකරනය

මෙම LKAS 36 ප්‍රමිතය මගින් ප්‍රධාන වශයෙන් අවධානය කෙරෙන්නේ කීර්ති නාමය, අස්පෘශ්‍ය වත්කම් සහ දේපළ පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් වන ගිණුම් කරණය පිලිබඳවයි. හානිකරනයට පත් වත්කම් හඳුණා ගැනීම්, එහි අය කර ගත හැකි ප්‍රමාණය මැණීම, ඇති වන හානිකරණ අලාභයක් හඳුණා ගැනීම් හෝ ආපස්සට හැරවීම සහ හානිකරණ අලාභයන් සමුබන්ධ තොරතුරු හෙළිදරව් කිරීම හෝ හානිකරණ අලාභයන් ආපස්සට හැරවීම පිළිබඳව ඇතුලත් කළ යුතු අවශ්‍යතා මෙම ප්‍රමිතය මගින් නියම කෙරේ.

මෙම LKAS 36 ප්‍රමිතය ව්‍යවසායක් විසින් සිය වත්කම් අධි වටිනාකමකින් සටහන් වී නැති බව තහවුරු කර ගන්නේ කෙසේ ද, ව්‍යවසායක් විසින් වත්කමක අයකර ගත හැකි මුදල තක්සේරු කර ගන්නේ කෙසේ ද (අයකර හැකි මුදල) සහ මෙම තක්සේරු කිරීම තුලින් හඳුණාගත් හානිකරණ අලාභයන් පිළිබඳව ව්‍යවසායක් විසින් ගිණුම් කරණය කරන්නේ කෙසේ ද යන්න විස්තර කරයි.

LKAS 36 ප්‍රමිතයෙහි අනෙකුත් ප්‍රධාන අවශ්‍යතා පහත සඳහන් පරිදිය.

- වත්කමක අයකර ගත හැකි මුදල වනුයේ එහි සාධාරණ වටිනාකමෙන් ඉහල අගයෙන් විකිණීම වෙනුවෙන් දරන ලද වියදම් සහ භාවිතයේ ඇති වටිනාකම (වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහයන් පදනම් කර ගෙන) අඩු කිරීමෙන් පසුය.
- සාධාරණ වටිනාකම යනු කමැත්ත ප්‍රකාශිත දැනුමැති පාර්ශයන් අතර අතේ දුරින් වූ ගණුදෙනුවක දී වත්කමක් විකිණිමෙන් ලද හැකි මුදල
- භාවිතයේ ඇති වටිනාකම යනු වත්කමක් එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ භාවිතයෙන් හා ඉන්පසු විකිණීමෙන් ලැබිය හැකි මුදල . භාවිතයේ ඇති වටිනාකම ගණනය කරනු ලබන්නේ තක්සේරු ඉදිරිඉ මුදල් ප්‍රවාහයන් වල වර්තනා වටිනාකමෙනි. වට්ටම් අනුපාතිකය විය යුත්තේ වත්කමට නිශ්චිත වන අවදානම සහ කාලය සහ මුදලේ වටිනාකම සම්බන්ධයෙන් වෙළඳ පොළහි වර්තමාන තක්සෙරු පිළිඹිබු වන ආකාරයේ පෙර බදු අනුපාතිකයෙකිනි.

**හානිකරණය පිළිබඳව සටහන් තැබීම :**

- පිරිවැය අගය මත දක්වන වත්කම් අදායම් ප්‍රකාශයේ වියදමක් වශයෙන් හඳුණාගත යුතු අතර ප්‍රත්‍යාගණිත අගය මත දක්වන වත්කම් ප්‍රත්‍යාගණන අඩුවීමක් වශයෙන් සැලකිය යුතුය.
- අවසන් වරට හානිකරණ අලාභයන් හඳුණා ගැණීමේ සිට වත්කමක අය කළ හැකි මුදල තීරණය කිරීමට භාවිතා කරනු ලබන තක්සේරුවල වෙනසක් වූ විට හානිකරණ අලාභයක් ආපස්සට හැරවිය යුතුය. ( සහ හඳුණා ගත් ආදායම්) කීර්ති නාමය මෙහි දී ව්‍යතිරේකයක් වන අතර කීර්ති නාම වල හානිකරණ අලාභයන් ආපස්සට හැරවීමට ඉඩ දෙනු නොලැබේ.

# ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත SLFRS/LKAS

- ආපසස්සට හරවන හානිකරණ අලාභයන් ආදායම් ප්‍රකාශයේ අදායමක් වශයෙන් හඳුණාගත යුතු අතර ප්‍රත්‍යාගණිත අගය මත දක්වන වත්කම් ආදායම් ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන වැඩිවීමක් වශයෙන් සැලකිය යුතුය. හානිකරණ අලාභයන් හඳුණාගන්නා විට දී හෝ ආපසස්සට හරවන විට දී ව්‍යවසායක් විසින් තොරතුරු සමහරක් වත්කම් වර්ග අනුවත් වාර්තා කල හැකි බාණ්ඩ අනුවත් හෙළදරව් කළ යුතුය. සමස්ථයක් වශයෙන් හඳුණාගත් හෝ ආපසස්සට හරවන ලද හානිකරණ අලාභයන් වාර්තා කරණ අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශ වලට සැලකිය යුතු සේ බලපායි නම් අතිරේක හෙළි දරව් කිරීම් කල යුතුය. යම් කිසි අවස්ථාවක වත්කමක් හානිකරණයට ගත් වීමට ඉඩ ඇති බවට ඉඟියක් හෝ ඇති විටක වත්කමක අයකර ගත හැකි මුදල තක්සේරු කල යුතුය. ශේෂ පත්‍ර දිනට හානිකරණ අලාභයන් ගැන සැලකිලිමත් විම සඳහා දර්ශක ලැයිස්තුවක් LKAS 36 ප්‍රමිතයෙහි ඇතුලත් ය.

### තනි වත්කම හෝ මුදල් ජනිත කරන ඒකක

අනෙක් වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ වලින් බොහෝ සෙයින් ස්වාධීනව වත්කමක් මුදල් ජනිත නොකරන විටක දී ව්‍යවසායක් විසින් වත අයත් මුදල් ජනිත කරන ඒකකයේ අයකර ගත හැකි මුදල තීරණය කල යුතුය.අනෙක් වත්කම් වලින් හෝ වත්කම් කාණ්ඩයකින් ලැබෙන මුදල් ප්‍රවාහ වලින් බොහෝ සෙයින් ස්වාධින ලෙස මුදල් ප්‍රවාහ ජනිත කරන කුඩාම හඳුණා ගත හැකි වත්කම් කාණ 'ඩයක් මුදල් ජනිත කරන ඒකකයක් වේ. මුදල් ප්‍රවාහ ජනිත කරන ඒකකයක හානිකරණ අලාභයන් හඳුණා ගැනිමට සහ ආපස්සට හැරවීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන මූලධර්ම තනි වත්කමක් සම්බන්ධයෙන් වන මූලධර්මයන් මූලධර්මට සමාන වේ. මුදල් ජනිත කරන ඒකක සංකල්පය බොහෝ විට භාවිතා කරනු ලබන්නේ හානිකරණය පිළිබඳව පරීක්ෂා කිරීමට වන අතර මෙයට හේතුව බොහෝ අවස්ථාවල වත්කම් ක්‍රියා කරනුයේ තනි පදනමට වඩා සාමුහික වීමය.

## LKAS 37 - ප්‍රතිපාදන අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්

LKAS 37 ප්‍රමිතය මූලික වශයෙන් ප්‍රතිපාදන සම්බන්ධයෙන් ක්‍රියා කරන අතර විශේෂ අවධානය යොමු කෙරෙනුයේ පසු ගිය සිද්ධීන්වල ප්‍රතිඵල නිසා වගකීම් වශයෙන් නිර්වචිත යුතුකම් හඳුනා ගැනීම්ය. මෙම ප්‍රතිපාදන, උදාහරණ වශයෙන්, ආපසු ගෙවීමේ ප්‍රතිපාදන, වත්කම් විශ්‍රාම ගැන්වීමේ යුතුකම්, අසම්භාව්‍ය වගකීම් වැනි දේ ස්වයං ක්‍රීයව කළ නොහැක. එබැවින්, ගිනුම් කරණ පද්ධතියකට හැකි වනුයේ බණී 37 සඳහා වක්‍ර ආකාරයේ සහයක් ලබා දීමයි.

මණ්ඩලයට විරුද්ධව ගොනු කොට ඇති නඩු ගිණුම්කරණ දිනය වන විට ආරම්භක අවධියේ පසු වන බැවින්, ගිණුම් පොත් පත් වල වෙන් කිරීම් පමණක් සිදු කර ඇත.

වසර තුළ අධ්‍යක්ෂ මන්ඩලයේ අනුමැතියට යටත්ව රුපියල් මිලියන 26.7 ක් සඳහා වන වසර 12 කට වැඩි පිට හිටි ණය හිමියන් නැවත ලියා එකතු කර ඇත.

## LKAS 39 - මූල්‍ය සාධන පත්‍රහඳුනා ගැනීම සහ මැණීම

බණී 39 ප්‍රමිතය ලියාපදිංචි ලැයිස්තුගත සමාගම් සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති කරන අතර මෙම ප්‍රමිතය අනුව මෙකී සමාගම් විසින් සියළු මූල්‍ය සාධන පත්‍ර සාධාරණ වටිනාකමෙන් (වෙළඳ පොළ මිලෙන්) හඳුණා ගැණිම සහ මැණීම කළ යුතු බවට නියම කෙරේ. බොහෝ අවස්ථාවල විධිමත් භාණ්ඩාගාර කළණාකරණ ක්‍රමයක් අවශ්‍ය කෙරේ. තවද මෙම ප්‍රමිතය අනුව සියළු ඉදිරි රැකුම් ලේඛණ ගත කොට තැබිය යුතු අතර එහි ඵලදායිතාවය තක්සේරු කිරීම සඳහා නිතරම ඇගැයීමට ලක් කල යුතුය. බණී 39 ප්‍රමිතය යටතේ සියළුම ව්‍යුත්පන්න සාධන පත්‍ර ඇතුළුව සියළු මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් ශේෂ පත්‍ර දිනට හඳුණා ගත යුතුය. ගෙවන ලද ප්‍රතිශ්ඨාවේ හෝ මූල්‍ය වත්කම හෝ මූල්‍ය වගකීම අත්පත් කර ගැනීමට ලැබුණ ප්‍රතිශ්ඨාවේ සාධාරණ වටිනාකම වන පිරිවැයෙන් ඒවා මුලින් මැණීම් කරනු ලැබේ. ව්‍යවසායක් විසින් වෙළඳ පොළෙන් මිල දී ගනු ලබන ගැණුම් සහ මූල්‍ය වත්කම් විකුණුම් වෙළඳ දිනයේ දී හෝ පියවන ලද දිනයේ දී හඳුණා ගත යුතුය. පියවන ලද දින හෝ සමථයකට පත් කළ දින ගිණුම් කරණ ක්‍රම භාවිතා කල හොත් වෙළඳ දින සහ පියවන දින අතර සමහර වටිනාකම් වල වෙනස්වීම් මිල දී ගැණුම් සඳහා හඳුණා ගනු ලැබේ. මූල්‍ය වත්කම් පහත සඳහන් පරිදි පන්ති ගත කරනු ලැබේ.

- **ණය සහ ලැබිය යුතු දෑ**

මෙම ණය සහ ලැබිය යුතු දෑ ව්‍යවසායක් විසින් අරඹන ලද දෑ වන අතර මේවා වෙළඳ කටයුතු සඳහා තබා ගනු ලබන වත්කම් නොවේ. මෙසේ ව්‍යවසායක් විසින් අරඹන ලද ණය සහ ලැබිය යුතු දෑ ණය සහ ලැබිය යුතු දෑ පරිණත වන තෙක් රඳවා ගත් බවට ව්‍යවසායක් විසින් විදහා දක්වීමට අවශ්‍යතාවයක් නැත. මෙම වත්කම් ධාරණය කරනු ලබන්නේ ක්‍රමක්ෂය කළ අගය මත හෙවත් මුල් මුදල හා සඵල උපචිත පොලි අනුපාතිකයක් සමගය.

- **පරිණත වන තෙක් රඳවා තබා ගන්නා ආයෝජන**

ස්ථිර පරිණත ආයොජන, උදාහරණයක් වශයෙන් ණය සුරැකුම් සහ ව්‍යවසායක් විසින් අදහස් කරන සහ පරිණත වන තෙක් රඳවා ගත හැකි අවශ්‍යයෙන්ම බේරා ගත යුතු වරණීය කොටස්.වර්ගීකරණය රඳා පවතින්නේ කළමණාකාරිතවයේ අදහස මත සහ හැකියාව මතය. මෙම මූල්‍ය වත්කම් ධාරනය කරනු ලබන්නේ ක්‍රමක්ෂය කළ අගය මතය.

- ලාභාලාභ ගිණුම තුළින් සාධාරණ වටිනාකමඃ කෙටි කාලීන මිල උච්චාවචනය වලින් ලාභ ජනිත කිරීම සඳහා අත්පත් කරනු ලබන මූල්‍ය වත්කම් (වෙළඳ කටයුතු සඳහා). ඉදිරි රැකුම් සාධන පත්‍ර වශයෙන් භාවිතා කරන්නේ නම් මිස ව්‍යුත්පන්න වත්කම් නිතරම වෙළඳ කටයුතු සඳහා රඳවා ගන්න බව සැලකේ. මෙය තුළ උප වර්ගයක් ඇති අතර මෙම ශිල්ප ක්‍රමය ගිණුම් කරණ නොගැලපීමක් නිවැරදි කරන්නේ නම් හෝ ඓතිහාසක පිරිවැය වෙනුවට සමාගමක් විසින්

සිය මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම පදනම් කර ගෙන කළමණා කරන්නේ නම් එමගින් සමාගම් වලට එහි මූල්‍ය සාධන පත්‍ර සාධාරණ වටිනාකමට සලකුණු කරන්නට මූලික වශයෙන් අවසර ලැබේ.මෙම සියළු මූල්‍ය වත්කම් ගිනුම් ගත කරනුයේ සාධරණ අගය මත වන අතර වෙනස්කම් ආදයම් වල හඳුණා ගැණේ.

විකුණුම සඳහා ඇති මූල්‍ය වත්කම්ඃඉහත දක්වෙන ලැයිස්තු වල නැති සියළු මූල්‍ය වත්කම් මෙම ගණයට ඇතුලත්ය.ඇති වන වෙනස් කම් වෙනම ස්කන්ධ සංරචකයක සටහන් කරමින් මෙම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමෙහි අගයෙන් වාර්තා තබනු ලැබේ. බණී 39 ප්‍රමිතය යටතේ යම් ව්‍යවසායක් අපේක්ෂා කළ නොහැකි තත්ත්වයක් තුළ පරිනත වෙන තෙක් රඳවා ගෙන ඇති ආයෝජන සුළු ප්‍රමානයකින් හෝ විකුණයි නම් එහි අනෙක් සියළු පරිනත වෙන තෙක් රඳවා ගෙන ඇති ආයෝජන ඊ ලඟ සහ අනුගාමී වාර්තාකරණ වසර දෙක තුළ විකිණීම සඳහා ඇති වත්කම් වශයෙන් නැවත වර්ගීකරණය කළ යුතුයි. මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය සමහර අවස්ථා හැරෙන්ට ඉඩ දෙනු නොලැබේ. ප්‍රධාන නිර්වචනයඃ ඉදිරි රැකුමඃ ව්‍යුත්පන්නයක් හෝ ව්‍යුත්පන්නයක් හෝ ව්‍යුත්පන්නයක් නොවන මූල්‍ය සාධන පත්‍රයක් ශුද්ධ ලාභ හෝ අලාභයෙහි සම්පූර්ණයෙන් හෝ කොටස් වලින් හිලව් කිරීමක් වශයෙන් නම් කිරීමට ( ශුද්ධ ආයෝජන ඉදිරි රැකුම් සඳහා පමණක් ) ඉදිරි රැකුම් අයිතමයක සාධාරන වටිනාකම හෝ මුදල් ප්‍රවාහ වටිනාකමෙහි වෙනස්වීම. බණී 39 ප්‍රමිතය යටතේ ඉදිරි රැකුම් ගිණුම් කරණයට අවසර ලැබෙනුයේ යම් යම් අවස්ථාවල දී පමණක් වන අතර ඒ සඳහා ඉදිරි රැකුම් සම්බන්ධතාවය පැහැදිලිව නිර්වචනය කර තිබීම, මැණිය හැකි බව, ආරම්භයේ දි ඇති සඵලදායික්වත්වය සහ අඛණ්ඩතාවය යන තත්ත්වයන් පිහිටා තිබිය යුතුය. සමස්ථ ශුද්ධ ශේෂ පත්‍ර තත්ත්වයක ඉදිරි රැකුමක් හෝ විශාල පරිමානයේ ඉදිරි රැකුමක් වශයෙන් නොව සාධාරණ වටිනාකමකින් යුක්ත ඉදිරි රැකුමක් හෝ නිශ්චිත ඉදිරි රැකුම් අයිතමයක මුදල් ප්‍රවාහයක් නිශ්චිත ඉදිරි රැකුම් සාධන පත්‍රයක් වශයෙන් ව්‍යවසායක් නම් කරන විට දී පමණක් ඉදිරි රැකුම් ගිණුම් කරණ ක්‍රමය භාවිතා කිරීමට අවසර ලැබේ. කෙසේ වෙතත්, සමස්ථ ශුද්ධ තත්ත්වයක ඉදිරි රැකුම් ගිනුම් කරණයේ ආසන්නතම ආදායම් ප්‍රකාශයේ ප්‍රතිඵල සමහර අවස්ථාවල දී ළඟාවිය හැක්කේ පාදක වන අයිතමයක කොටසක් ඉදිරි රැකුම් තත්ත්වයක් වශයෙන් නම් කිරීමෙනි. පුරෝකථනය කරන ලද ගනුදෙනු වල ඉදිරි රැකුම් සඳහා ඉදිරි රැකුම් සාදන පත්‍ර වල ලාභය හෝ අලාභය විසින් අත්පත් කර ගත් වත්කම් හෝ වගකීම් වල පදනම ( ධාරන අගය) ගැලපේ.

## LKAS 41 – කෘෂිකර්මය

LKAS 41 ප්‍රමිතය ජීව විද්‍යාත්මක වත්කම් සඳහා කෙසේ ගිණුම් කරණය විය යුතු ද යන්න විස්තර කරයි. ජීව විද්‍යාත්මක වත්කම් යනු පශු සම්පත්,වගාවන් යනාදිය වන අතර මෙම වත්කම් කෘෂිකර්ම නිෂ්පාදන බවට පරිවර්තනය කෙරේ.

# ආයතනික තොරතුරු

## නම/ තත්ත්වය
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
- පශු සම්පත් හා ග්‍රාමීය සංවර්ධන
අමාත්‍යංශය යටතේ නීතිගත සංස්ථාවකි.

## ආරම්භය
1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂි සංස්ථා පනත යටතේ 1973 දී පිහිටු වනු ලැබීය 1974 පටන් ක්ෂේත්‍ර කාර්යයන් ඇරඹිණ.

## අධ්‍යක්ෂ මණ්ඩලය
ආර්.එම්. ඇල්ලේගල (සභාපති)
ඒ.ආර්. අනුර ජයසිරි (නියෝජ්‍ය සභාපති)
වෛද්‍ය සැම්සන් එල්.ඒ. ඩැනියල්
එස්. බාලචන්ද්‍රන්
රවින්ද්‍ර මනෝජ් ගමගේ
ආර්. අශෝක් කුමාර්
ආචාර්ය ප්‍රේම කුමාර ද සිල්වා
කේ.එම්.කේ. සිරිවර්ධන

## ප්‍රධාන විධායක නිලධාරී
ඒ.සී.එච්. මුණවීර (සාමාන්‍යාධිකාරි)

## ප්‍රධාන කාර්යාලය
අංක 40,
නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05

## දුර කථනය
94 11 2501701/2

## ෆැක්ස්
94 11 2502695

## ඊ මේල්
info@nldb.gov.lk

## වෙබ් අඩවිය
http://www.nldb.lk

## බැංකු
මහජන බැංකුව

# கூட்டுத்தகவல்கள்

## பெயர்/அந்தஸ்து
தேசீய கால்நடை வள அபிவிருத்தி சபையானது ஒரு அரச கூட்டத்தாபனம் ஆகும். இது கால்நடை மற்றும் கிராமீய சமூக அபிவிருத்தி அமைச்சின் கீழ் இயங்குகின்றது.

## உருவாக்கம்
தேசீய கால்நடை வள அபிவிருத்தி சபை 1973 ஆம் ஆண்டு விவசாய கூட்டுத்தாபனங்கள் சட்டத்தின் கீழ் உருவாக்கப் பட்டது. ஆதன் வெளிக்கள நடவடிக்கைகள் 1974 ஆம் ஆண்டு அரம்பிக்கப் பட்டது.

## பணிப்பாளர் சபை
திரு ஆர். எம். பி. எல்லேகல (தலைவர்)
திரு. ஏ.ஆர். அனுர ஜயசிரி (பிரதி தலைவர்)
மருத்துவர் சம்சன் எல். ஏ. டானியல்
திரு. எஸ். பாலசந்திரன்
திரு. ரவீன்திர மனோஜ் கமகே
திரு. ஆர். அசோக் குமார்
கலாநிதி பிறேம குமார த சில்வா
கே. எம். கே. சிரிவர்தன

## பிரதம நிறைவேற்று உத்தியோகத்தர்
ஏ.வி.எச். முனவீர
பொது முகாமையாளர்

## தலைமை அலுவலகம்
இல. 40 நாவல வீதி,
நாறாஹேன்பிட்டி,
கொழும்பு 05.

## தோலை பேசி
94 11 2501701/2

## பக்ஸ்
94 11 2502695

## மின்னஞ்சல்
info@nldb.gov.lk

## வங்பியாளர்
மக்கள் வங்கி

# Coporate Information

## Name/Status
The national Livestock Development Board - a state Corporation under the Ministry of Livestock and Rural Community Development.

## Formation
Established in 1973 under the state Agricultural Corporation Act No; 11 of 1972. Commenced field operations in 1974.

## Board of Directors
R.M.B. Ellegala (Chairman )
A.R. Anura Jayasiri (Deputy chairman )
Dr. Samson L.A. Daniel
S. Balachandiran
Ravindra Manoj Gamage
R. Ashok Kumar
Dr. Prema kumara de Silva
K.M.K. Siriwardana

## Chief Executive Officer
A.C.H, Munaweera (General Manager)

## Head Office
No. 40, Nawala Road,
Narahenpita,
Colombo 5.

## Telephone
+ 94 11 2501701/2

## Fax
+ 94 11 2502695

## E- mail
infor@nldb.gov.lk

## Web
http//www.nldb.gov

## Bankers
Peoples Bank








ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

தேசிய கால்நடை வன அபிவிருத்தி சபை

National Livestock Development Board

No. 40, Nawala Road, Narahenpita, Colombo 5.